# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report

# 2019

**කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය**

தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சு

Ministry of Labour and Trade Union Relations

(අමාත්‍ය මණ්ඩල සාමාජික නොවන/அமைச்சரவை அந்தஸ்தற்றது / Non Cabinet)

# වැය ශීර්ෂ අංක 54

සම්පාදනය

සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

ප්‍රකාශනය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය

(නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය)

1 - CM 032281 - 150 (2020/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

# පෙළගැස්ම


පිටුව

**පළමු පරිච්ඡේදය : ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය**

1.1 හැඳින්වීම 3

1.2 දැක්ම, මෙහෙවර, අරමුණු 3

1.3 ප්‍රධාන කාර්යයන් 4

1.4 සංවිධාන සටහන 6

1.5 අමාත්‍යාංශයේ අංශ 8

1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 8

**දෙවන පරිච්ඡේදය : ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

2.1 අමාත්‍යාංශයේ ප්‍රගතිය 11

2.2 අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්හි ප්‍රගතිය

2.2.1 කම්කරු දෙපාර්තමේන්තුව 18

2.2.2 මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව 37

2.2.3 ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය 45

2.2.4 කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය 49

2.2.5 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය 51

2.2.6 සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 53

2.2.7 ශ්‍රම වාසනා අරමුදල 59

2.3 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක 61

**තුන්වන පරිච්ඡේදය : 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය**

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 67

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 68

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 69

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 71

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 71

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 71

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 72

3.8 මුදල් නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 72

පිටුව

**හතරවන පරිච්ඡේදය : කාර්යසාධන දර්ශක**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 75

**පස්වන පරිච්ඡේදය : තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය**

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 79

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 81

**හයවන පරිච්ඡේදය : මානව සම්පත් පැතිකඩ**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 85

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇති ආකාරය 85

6.3 මානව සම්පත් සංවර්ධනය 85

**හත්වන පරිච්ඡේදය : අනුකූලතා වාර්තාව**

අනුකූලතා වාර්තාව 91

# වගු නාමාවලිය


| | | පිටුව |
|---|---|---|
| 1.4.1. | සේවක සංඛ්‍යා කළමනාකරණ පැතිකඩ | 7 |
| 2.1.1. | 2019.12.31 දිනට සුනිසි මෙහෙවර වැඩසටහනෙහි ප්‍රගතිය | 13 |
| 2.1.2. | 2019 වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය | 16 |
| 2.2.1.1. | ආයතන මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් - 2019 | 20 |
| 2.2.1.2. | වැඩ වර්ජන පිළිබඳ වාර්තා වූ දත්ත - 2019 | 22 |
| 2.2.1.3. | ශ්‍රමික අයිතීන් ප්‍රමිතිගත කිරීමේ ක්‍රියාකාරකම් - 2019 | 23 |
| 2.2.1.4. | සේවා ස්ථානවල සෞඛ්‍යාරක්ෂිතව පරීක්ෂාවට ලක්කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාකාරකම් - 2019 | 24 |
| 2.2.1.5. | වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ඉහළ නැංවීම සඳහා සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩමුළු - 2019 | 25 |
| 2.2.1.6. | රැකියාවක නියුතු කාන්තාවන්, තරුණ අය හා ළමුන් පිළිබඳ පවතින නීති ක්‍රියාත්මක කිරීම - 2019 | 26 |
| 2.2.1.7. | කාන්තා හා ළමා කටයුතු සම්බන්ධ විශේෂ වැඩසටහන් - 2019 | 27 |
| 2.2.1.8. | ප්‍රතිලාභ අයදුම්පත් ලැබීම් හා තීරණ ලිපි ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යැවීම | 29 |
| 2.2.1.9. | අනුමත අර්ථ සාධක අරමුදල් අධීක්ෂණ ප්‍රගතිය - 2019 | 29 |
| 2.2.1.10. | සියලුම දිස්ත්‍රික් කාර්යාල මඟින් කරන ලද නඩු සහ විසඳී ඇති නඩු - 2019 | 30 |
| 2.2.1.11. | අධිකරණ අනුව නඩුවල කාර්යසාධනය - 2019 | 30 |
| 2.2.1.12. | 2019 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ සමස්ත මුල්‍ය ප්‍රගතිය | 32 |
| 2.2.1.13. | 2019 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් වර්ගීකරණය | 32 |
| 2.2.1.14. | ඉටුකරනු ලැබූ කාර්යයන් - 2019 | 33 |
| 2.2.1.15. | දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් සඳහා සංවිධානය කර පවත්වන ලද පුහුණු වැඩසටහන් - 2019 | 34 |
| 2.2.1.16. | බාහිර පුහුණු ආයතනයන්හි පුහුණුව සඳහා දෙපාර්තමේන්තු නිලධරයන් වෙත ප්‍රතිපාදන ලබාදීම - 2019 | 34 |
| 2.2.1.17. | ධාරිතා වර්ධන ක්‍රියාකාරකම් සඳහා 2019.12.31 දිනට සමස්ත වියදම - 2019 | 35 |
| 2.2.1.18. | වෙබ් අඩවිය හරහා දෙපාර්තමේන්තුව විසින් සපයන ලද සේවා - 2019 | 35 |
| 2.2.2.1. | 2019 දෙසැම්බර් 31 දක්වා මූල්‍ය ප්‍රගතිය | 38 |
| 2.2.2.2. | එක් එක් අංශවල ප්‍රගතිය - 2019 | 41 |
| 2.2.2.3. | රැකියාගත කිරීමේ ප්‍රගතිය - 2019 | 43 |
| 2.2.2.4. | සේවා යෝජකයන් සමඟ පවත්වන ලද විශේෂ වැඩසටහන් | 43 |
| 2.2.3.1 | පවත්වන ලද වැඩසටහන්වල ප්‍රගතිය - 2019 | 46 |

පිටුව

| | | |
|---|---|---|
| 2.2.4.1. | උසාවි කටයුතුවල ප්‍රගතිය - 2019 | 50 |
| 2.2.4.2. | මූල්‍ය ප්‍රගතිය - 2019 | 50 |
| 2.2.5.1 | වැඩසටහන්වල ප්‍රගතිය - 2019 | 52 |
| 2.2.6.1. | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රගතිය | 54 |
| 2.2.6.2. | දායක මුදල් රැස්කිරීමේ ප්‍රගතිය - 2019 | 54 |
| 2.2.6.3. | දායක මුදල් ආපසු ගෙවීම් | 55 |
| 2.2.6.4. | ප්‍රතිලාභ ගෙවීම් | 55 |
| 2.2.6.5. | 2019 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළඹ | 56 |
| 2.2.6.6. | මූල්‍ය තොරතුරු - 2019 | 57 |
| 2.2.6.7. | ප්‍රධාන කාර්යසාධක දර්ශක - 2019 | 57 |
| 2.2.7.1. | වැඩසටහන්වල ප්‍රගතිය | 60 |
| 3.6.1. | වෙන් කළ ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය | 71 |
| 3.7.1. | වෙනත් අමාත්‍යාංශවලින් ලැබුණු ප්‍රතිපාදන - 2019 | 72 |
| 3.8.1. | මූල්‍ය නොවන වත්කම් | 72 |
| 4.1.1. | අමාත්‍යාංශයේ කාර්යසාධන දර්ශක | 75 |
| 5.1.1. | අමාත්‍යාංශයට අදාළ තිරසාර සංවර්ධන අරමුණු | 79 |
| 6.1.1. | සමස්ත කාර්ය මණ්ඩලය | 85 |
| 6.3.1. | දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගිත්වය - 2019 | 87 |
| 6.3.2. | විදේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගිත්වය - 2019 | 88 |
| 6.3.3. | විදේශීය පුහුණු පාඨමාලා සඳහා අනුබද්ධිත ආයතනවල සහභාගිත්වය - 2019 | 88 |
| 7.1. | අනුකූලතා වාර්තාව | 91 |


## ප්‍රස්තාර හා රූපසටහන්

ප්‍රස්තාර


| | | |
|---|---|---|
| 2.2.1.1. | සේවා ස්ථාන (ශ්‍රමික) පරීක්ෂණ -2019 | 21 |
| 2.2.1.2. | ව්‍යවස්ථාපිත නීති උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් - 2019 | 21 |
| 2.2.1.3. | කාර්මික ආරවුල් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් - 2019 | 22 |
| 2.2.1.4. | සාමූහික ගිවිසුම් ලියාපදිංචි කිරීම -2019 | 23 |


රූපසටහන්


| | | |
|---|---|---|
| 1.4.1. | අමාත්‍යාංශයේ සංවිධාන සටහන | 6 |
| 2.2.2.1. | රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු | 38 |
| 2.2.2.2. | රැකියා කේන්ද්‍ර ක්‍රියාවලිය | 39 |

## ඡායාරූප

පිටුව


2.1.1. විද්වත් කතිකාවත සඳහා පර්යේෂණ වාර්තා ඉදිරිපත් කළ කණ්ඩායම ආරාධිත අමුත්තන් සමඟ 12

2.1.2. ජංගම සේවා වැඩසටහන්වල දී කම්කරු ජනතාවට සේවා සැපයීම 12

2.1.3. ජාත්‍යන්තර කම්කරු සංවිධානයට වසර 100 සපිරීම නිමිත්තෙන් මුල් දින කවරයක් සහ සමරු මුද්දරයක් නිකුත් කිරීම 16

2.2.1.1. සමාජ කතිකා අංශයෙන් සිදුකළ සේව්‍ය සේවක දෙපාර්ශවය දැනුවත් කිරීමේ ආයතන මට්ටමේ වැඩසටහනක් 19

2.2.1.2. 2019 වර්ෂයේ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ සම්මන්ත්‍රණයේ අවස්ථාවක් 26

2.2.1.3. 'මෙහෙවර පියස' ගොඩනැගිල්ල අතිගරු ජනාධිපතිතුමන්ගේ සුරතින් 2019 අගෝස්තු 20 වන දින විවෘත කිරීම 32

2.2.1.4. සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය විසින් සංවිධානය කර පවත්වන ලද පුහුණු වැඩසටහනක් 35

2.2.2.1. කෑගල්ල දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහනෙහි අවස්ථාවක් 40

2.2.2.2. ලක් රැකියා හරසර සම්මාන ප්‍රධානෝත්සවයේ අවස්ථාවක් 43

2.2.3.1. ජාතික වෘත්තීය සුරක්ෂිතතා සම්මාන ප්‍රධානෝත්සවයේ අවස්ථාවක් 48

2.2.4.1. වෘත්තීය අනතුරු වෙනුවෙන් වන්දි ලබා දීමේ අවස්ථාවක් 50

2.2.5.1. සහතික පත්‍ර ප්‍රධානෝත්සවයේ අවස්ථාවක් 52

2.2.6.1. ජාතික ඵලදායිතා සම්මාන උළලේදී සේවා අංශය යටතේ තුන්වන ස්ථානය, වවුනියාව ප්‍රාදේශීය කාර්යාලය විසින් ලබා ගැනීම 56

2.2.6.2. රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය මගින් සංවිධානය කරන වාර්ෂික වාර්තා තරගයේ දී රන් සම්මාන දෙකක් ලබා ගැනීමේ අවස්ථාව 58

2.2.7.1. මීගහකිවුල ප්‍රදේශයේ පැවති අක්ෂි සායනය 59

# පළමු පරිච්ඡේදය

# ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

# කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුක්තවූවන්ගේ ජීවන හා සේවා තත්වයන් වර්ධනය කිරීම මෙන්ම රටේ නිෂ්පාදනය හා ශ්‍රම ඵලදායිතාව ඉහළ නැංවීමට අවශ්‍ය වන කාර්මික සාමය සහ සේව්‍ය - සේවක සබඳතාව ස්ථාපනය කරමින් අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ ඒවා ක්‍රියාවට නැංවීම, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ මූලික පරමාර්ථ වේ. සේවක ජනතාවගේ සුබසාධනය උදෙසා වරින්වර ඇති කරන ලද කම්කරු නීති හා අණ පනත් අනුව මෙම අමාත්‍යාංශයට පැවරෙන කාර්යභාරය ද පුළුල්ය. ඒ අනුව අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර හා අරමුණු පහත පරිදි වේ.

## 1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු

**දැක්ම**

තෘප්තිමත් ඵලදායි ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්

**මෙහෙවර**

කාර්මික සාමය හා සහයෝගීතාව, සමාජ සුරක්ෂිතතාවය, කම්කරු අයිතිවාසිකම් හා ඵලදායිතාව තුළින් සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

**අමාත්‍යාංශයේ අරමුණු**

- ත්‍රෛපාර්ශවීය සවිබල ගැන්වීම තුළින් සේව්‍ය-සේවක සබඳතා ශක්තිමත් කිරීම
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සේවා තත්ත්වයන් හා සේවක අයිතීන් තහවුරු කිරීම
- ළමා ශ්‍රම යෙදවුම් තුරන් කිරීම
- රැකියාවල නියුතු කාන්තාවන් සවිබල ගැන්වීම, ආරක්ෂා කිරීම හා ස්ත්‍රී පුරුෂ සමානතාව දිරි ගැන්වීම
- කම්කරු නීති රීති හා පරිපාටිවල නම්‍යශීලීත්වය ඉහළ නැංවීම
- සමාජ සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා සුදුසු ක්‍රමෝපායන් සකස් කිරීම

යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතන විසින් පහත දැක්වෙන විෂය ක්ෂේත්‍රයන් ඔස්සේ කටයුතු කරනු ලැබේ.

1. කාර්මික සාමය හා සංහිඳියාව
2. කම්කරු ප්‍රමිතීන් සහ නීති රීති ක්‍රියාත්මක කිරීම
3. කාන්තා ශ්‍රමිකයින් සුරැකීම හා ළමා ශ්‍රමය පිටු දැකීම
4. වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍යය
5. සමාජ ආරක්ෂණය
6. කම්කරු ක්ෂේත්‍රයට අදාළ අධ්‍යාපන, පුහුණු, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු

## 1.3 ප්‍රධාන කාර්යයන්

2019.01.16 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 2106/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව කම්කරු හා වෘත්තීය සමිති සබඳතා (අමාත්‍ය මණ්ඩල සාමාජික නොවන) අමාත්‍යාංශයට පවරන ලද බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් පහත පරිදි වේ.


1. කම්කරු හා වෘත්තීය සමිති සබඳතා විෂයන්ට සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්, සේවක පරිපාලනය සහ සුභසාධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
3. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංවිධානය සමඟ අන්තර් සහයෝගීතාව පවත්වා ගැනීම.
4. සේවක අර්ථසාධක අරමුදල, පෞද්ගලික අර්ථසාධක අරමුදල සහ පෞද්ගලික විශ්‍රාම ගැන්වීමේ ක්‍රම පරිපාලනය කිරීම.
5. කාර්මික සබඳතා සහ කාර්මික ආරවුල් නිරාකරණය කිරීම.
6. කම්කරු සබඳතාවලට අදාළ නීතිරීති සම්පාදනය සහ නියාමනයට අදාළ කටයුතු.
7. වෘත්තීය සහ රැකියා මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
8. වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සියලුම වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීම සඳහා අවශ්‍ය සාධනීය පියවරයන් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම.
9. ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
10. රැකියා නියුක්ති ආයතන විසින් ගාස්තු අය කිරීම නියාමනය කිරීම.
11. විරැකියා ප්‍රතිලාභ රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළ කටයුතු.
12. වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
13. කම්කරු දෙපාර්තමේන්තුව, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, ශ්‍රම වාසනා අරමුදල යන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු හා ආයතනයන් අධීක්ෂණය.

### 1.3.1 ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන අණපනත්

1. 1934 අංක 19 දරන කම්කරු වන්දි ආඥා පනත
2. 1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥා පනත
3. 1939 අංක 32 දරන ප්‍රසූතිකාධාර ආඥා පනත
4. 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත
5. 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනත
6. 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත
7. 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ පනත)
8. 1956 අංක 47 දරන ස්ත්‍රීන් තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත
9. 1956 අංක 37 දරන ගාස්තු අයකිරීමේ රැකියා නියුක්ති නියෝජිතායතන පනත

10. 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත
11. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ සේවා නියුක්තිය අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත
12. 1979 අංක 32 දරන සේවක මණ්ඩල පනත.
13. 1980 අංක 46 දරන සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් පනත
14. 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනත
15. 1993 අංක 19 දරන සේවා නියුක්තයින්ගේ භාර අරමුදල (විශේෂ විධිවිධාන) පනත
16. 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනත
17. 2009 අංක 38 දරන වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත
18. 2010 අංක 12 දරන ජාතික ශ්‍රද අධ්‍යයන ආයතන පනත
19. 2016 අංක 03 දරන සේවකයින්ගේ ජාතික අවම වේතන පනත
20. 2016 අංක 04 දරන අයවැය සහන දීමනා පනත

## ආයතනික සටහන
## කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය




සැ.පර්.හා සං. - සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන

රූපසටහන 1.4.1 : අමාත්‍යාංශයේ සංවිධාන සටහන

## 1.4.1. සේවක සංඛ්‍යා කළමනාකරණ පැතිකඩ

| අංකය | තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | වර්ෂය අවසානයේ තත්‍ය ප්‍රමාණය | වර්ෂය තුළ නව බඳවා ගැනීම් | ස්ථාන මාරු ලැබ පැමිණි ගණන | වෙනත් ස්ථානවලට මාරුවීම් ලැබ ගිය ගණන | වෙනත් | වර්ෂය අවසානයේ පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ලේකම් | 01 | 01 | - | 02 | 02 | - | - |
| 2 | අතිරේක ලේකම් | 02 | 02 | - | 02 | 02 | - | - |
| 3 | ප්‍රධාන මූල්‍ය නිලධාරි | 01 | 01 | - | - | - | - | - |
| 4 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 02 | 02 | - | - | - | - | - |
| 5 | ප්‍රධාන ගණකාධිකාරි | 01 | 01 | - | - | - | - | - |
| 6 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 01 | 01 | - | 01 | 01 | - | - |
| 7 | අධ්‍යක්ෂ (සැලසුම් පර්යේෂණ හා සංවර්ධන) | 01 | - | - | - | - | - | 01 |
| 8 | සහකාර ලේකම් | 03 | 01 | - | - | 01 | - | 02 |
| 9 | ගණකාධිකාරී | 01 | 01 | - | - | - | - | - |
| 10 | සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ප.සේ.) | 01 | - | - | - | 01 | - | 01 |
| 11 | සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ක්‍ර.සේ.) | 01 | 01 | - | - | - | - | - |
| 12 | නීති නිලධාරි | 01 | 01 | 01 | - | - | - | - |
| 13 | පරිපාලන නිලධාරි | 01 | 01 | - | - | - | - | - |
| 14 | ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් | 01 | 01 | - | - | - | - | - |
| 15 | භාෂා පරිවර්තක | 02 | 01 | - | - | - | - | 01 |
| 16 | තොරතුරු තාක්ෂණ නිලධාරි | 01 | - | - | 01 | - | 01 | 01 |
| 17 | කළමනාකරණ සේවා නිලධාරි | 29 | 22 | - | - | 01 | - | 07 |
| 18 | සංවර්ධන නිලධාරි | 37 | 17 | - | - | - | - | 20 |
| 19 | ප්‍රවෘත්ති නිලධාරි | 01 | 01 | - | - | - | - | - |
| 20 | ලඝු ලේඛක | 01 | 01 | - | - | - | - | - |
| 21 | තොරතුරු තාක්ෂණ සහකාර | 01 | 01 | - | - | - | - | - |
| 22 | වීඩියෝ කැමරා ක්‍රියාකරු | 01 | 01 | - | - | - | - | - |
| 23 | නිශ්චල ඡායාරූප ශිල්පී | 01 | - | - | - | - | - | 01 |
| 24 | කැමරා ක්‍රියාකරු සහයක | 01 | - | - | - | - | - | 01 |
| 25 | රියැදුරු | 19 | 14 | 6 | - | - | 01 | 05 |
| 26 | සංචාරක බංගලා භාරකරු | 01 | 01 | 01 | - | - | -- | - |
| 27 | කාර්යාල කාර්ය සහයක | 13 | 13 | - | 02 | 02 | - | - |
| 28 | බංගලා සහයක | 01 | - | - | - | - | - | 01 |
| | | 127 | 86 | 08 | 08 | 10 | 01 | 41 |

පුරප්පාඩු පිරවීම සඳහා අදාළ ආයතන දැනුවත් කර ඇත.

වගුව 1.4.1. සේවක සංඛ්‍යා කළමනාකරණ පැතිකඩ

## 1.5 අමාත්‍යාංශය යටතේ පවතින අංශ

i. පාලන හා ආයතන අංශය
ii. සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය
iii. කම්කරු හා විදේශ සබඳතා අංශය
iv. මුදල් අංශය

## 1.6 අමාත්‍යාංශය යටතේ ඇති ආයතන

i. කම්කරු දෙපාර්තමේන්තුව
ii. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
iii. ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය
iv. කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය
v. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය
vi. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
vii. ශ්‍රම වාසනා අරමුදල

## දෙවන පරිච්ඡේදය

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 අමාත්‍යාංශයේ ප්‍රගතිය

### 2.1.1. පාලන සහ ආයතන අංශය

පාලන සහ ආයතන අංශය පරිපාලන, ආයතන සහ මාධ්‍ය යන ඒකක තුනින් සමන්විත වේ.

පරිපාලන ඒකකයට පරිපාලනය, කළමනාකරණය, සාමාන්‍ය නඩත්තුව, පුහුණු කිරීම සහ අමාත්‍යාංශයත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනත් සම්බන්ධීකරණය කිරීම යනාදී භාරදූර වගකීම් සම්භාරය පැවරී ඇත. ආයතන ඒකකය අමාත්‍යාංශයේත් කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා පිළිබඳ ගරු අමාත්‍යවරයාගේ කාර්යාලයේත් අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලත් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ කටයුතු කරයි. එසේම පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්න, මහජන පෙත්සම් කාරක සභාව, උපදේශක කමිටු, මානව අයිතිවාසිකම් කොමිෂන් සභාව සහ විවිධාකාර ඉල්ලීම් පිළිබඳ මහජනතාව විසින් එවනු ලබන විවිධාකාර ලිපි යන මේවාට අදාළ කටයුතු භාරව ක්‍රියා කරන්නේ ද මේ ඒකකයයි.

අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකය අමාත්‍යාංශයත් අමාත්‍යාංශය යටතේ පවතින ආයතනත් විවිධ අවස්ථාවන්හි දී ඉටු කරනු ලබන කාර්ය මහජනයාටත් මාධ්‍ය සංවිධානවලටත් දැනුම් දීමේ වගකීම භාරව සිටී.

### 2.1.2 සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ වන සියලුම ආයතනවල සංවර්ධන වැඩසටහන් නිවැරදි ඉලක්ක ඔස්සේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම, ඒවා ක්‍රියාත්මක කරවීම, ප්‍රගති සමාලෝචනය හා පසු විපරම් කිරීම, මෙම අංශයෙන් සිදු කෙරෙන ප්‍රධාන කාර්යභාරය වේ. මෙයට අමතරව පහත සඳහන් කාර්යයන් ද මෙම කාල පරිච්ඡේදය තුළ අංශය විසින් ඉටුකර ඇත.

1. අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් සිදු කරනු ලබන සංවර්ධන ඉලක්කයන් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අදාළ පාර්ශව වෙත යොමු කිරීම.
    - ශුන්‍ය පාදක අයවැය සංවර්ධන වැඩසටහන යටතේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සෑම මසකම ප්‍රගතිය ඇගයීම.

2. 06/2015 (1) ජාතික අයවැය චක්‍රලේඛ අනුව ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, ව්‍යාපෘති කළමණාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය පැවැත්වීම හා ප්‍රගති වාර්තා මාසිකව හා ත්‍රෛයිමාසිකව ඉදිරිපත් කිරීම.

3. අමාත්‍යාංශය විසින් අත්කරගත් ප්‍රගතිය ඇතුළත් වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම.

4. ශ්‍රී ලංකා සේවක සඟරාව ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධ සියලු කටයුතු සිදු කිරීම.

    සමාලෝචිත කාලයට අදාළව ශ්‍රී ලංකා සේවක සඟරාවේ කාණ්ඩ අංක 70 කලාපයේ 1,11,111 කලාපයන් කාර්තුමය වශයෙන් නිකුත් කරන ලදී.

5. ජාත්‍යන්තර කම්කරු සංවිධානයට සියවසක් සැපිරීම නිමිත්තෙන් කම්කරු විෂය ක්ෂේත්‍රය පිළිබඳව විද්වත් කතිකාව; 2019 සැප්තැම්බර් 02 වැනි දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පවත්වන ලදී. එහි දී ඉදිරිපත් කරන ලද වාර්තා කැටිකර ශ්‍රී ලංකා සේවක සඟරාවේ විශේෂ කලාපයක් එළි දක්වන ලදී.



ඡායාරූපය 2.1.1.විද්වත් කතිකාවත සඳහා පර්යේෂණ වාර්තා ඉදිරිපත් කළ කණ්ඩායම ආරාධිත අමුත්තන් සමග

## 6. ජංගම සේවා වැඩසටහන්

- ✓ බදුල්ල දිස්ත්‍රික්කයේ කම්කරු ප්‍රජාවගේ ගැටලු විසඳීම සඳහා පස්සර හා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කරමින් 2019 ජූලි 27 වන දින පස්සර මධ්‍ය මහා විද්‍යාලයේ දී සහ වැලිමඩ හා ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කරමින් 2019 ජූලි 28 දින වැලිමඩ මධ්‍ය විද්‍යාලයේ දී ජංගම සේවා වැඩසටහන් දෙකක් පවත්වන ලදී.
- ✓ හපුතලේ හා හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කරමින් සැප්තැම්බර් 07 වන දින හපුතලේ දෙමළ මධ්‍ය මහා විද්‍යාලයේ දී හා කන්දෙකැටිය, සොරණාතොට හා මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කරමින් සැප්තැම්බර් 08 වන දින මීගහකිවුල ජාතික පාසලේ දී ද ජංගම සේවා වැඩසටහන් දෙකක් පවත්වන ලදී.
- ✓ මෙම සිව් දිනයන් තුළ 5000කට අධික සේවක ප්‍රජාවකගේ කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධ ගැටළුවලට විසඳුම් ලබා දීමට හැකි විය. එසේම සුභ සාධන වැඩසටහන් මාලාවක් ද පවත්වන ලදී.



ඡායාරූපය 2.1.2. ජංගම සේවා වැඩසටහන්වල දී කම්කරු ජනතාවට සේවා සැපයීම

## 7. සුනිසි මෙහෙවර වැඩසටහන

සංවර්ධනය කරා යන මාර්ගයට ශ්‍රී ලංකාව අවතීර්ණය වීමට නම් යහපත් රැකියා ප්‍රවර්ධනය කළ යුතු වේ. මෙමගින් නිදහස, සාධාරණත්වය, ආරක්ෂාව හා මානව ගරුත්වය යන තත්වයන් තුළ ඵලදායී වැඩ ලබා ගැනීමට කාන්තාවන්ට හා පිරිමින්ට සමාන අවස්ථා ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂිතය. එසේම රැකියා නිර්මාණය කිරීම පමණක් අපේක්ෂා නොකරන අතර එම නිර්මානය කෙරෙන රැකියා පිළිගත හැකි තත්වයේ ඒවා විය යුතු වීම විශේෂත්වයකි. සුනිසි මෙහෙවර වැඩසටහන ප්‍රධාන ස්ථම්භයන් 4ක් තුළ ක්‍රියාත්මක වේ.

- රැකියා උත්පාදනය, ප්‍රවර්ධනය හා ජාතික ඵලදායිතාව
- වැඩබිමෙහි හිමිකම
- සමාජ ආරක්ෂණය
- සමාජ කතිකාවත

මෙම ප්‍රධාන ස්ථම්භ 4ට අමතරව පහත දැක්වෙන විෂය ක්ෂේත්‍රයන් ආවරනය වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සෑම අංශයක්ම සම්බන්ධීකරණය නරනු ලැබේ.

1 ඵලදායිතා ප්‍රවර්ධනය
2 ස්ත්‍රී පුරුෂ සමාජභාවය තහවුරු කිරීම

සුනිසි මෙහෙවර වැඩසටහන යටතේ විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන 15ක් පහත සඳහන් ආයතනවලට වෙන් කර විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. එහි දී අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද ජංගම සේවා වැඩසටහන් සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මගින් රු. 100,000ක අමතර ප්‍රතිපාදනයක් ලබා දෙන ලදී. 2019.12.31 දිනට සුනිසි මෙහෙවර වැඩසටහනෙහි ප්‍රගතිය පහත පරිදි වේ.

| ව්‍යාපෘතියේ නම | ශුද්ධ ප්‍රතිපාදනය | වියදම | ඉතිරි ප්‍රතිපාදනය | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| කම්කරු දෙපාර්තමේන්තුව | 6,731,000 | 6,167,557 | 563,443 | 91.62% |
| මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 4,371,000 | 3,302,000 | 1,069,000 | 75.54% |
| ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | 1,000,000 | 1,000,000 | - | 100% |
| කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | 2,998,000 | 2,997,158 | 842 | 99.97% |
| මුළු එකතුව | 15,100,000 | 13,466,715 | 1,633,285 | 89.18% |

2.1.1. 2019.12.31 දිනට සුනිසි මෙහෙවර වැඩසටහනෙහි ප්‍රගතිය

## 2.1.3. කම්කරු හා විදේශ සබඳතා අංශය

ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ එම සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව විසින් ඇති කරගත් බැඳීම, අන්තර්ජාතික වශයෙන් පිළිගත් සම්මුතීන් හා නිර්දේශයන් යටතේ මෙරට කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම සහ කම්කරු ක්ෂේත්‍රයේ ගැටළු විසඳීම සඳහා උපයෝගී කර ගැනීමට අදාළව කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය වෙනුවෙන් කටයුතු කිරීම මෙම අමාත්‍යාංශයේ කම්කරු හා විදේශ සබඳතා අංශය මඟින් ඉටු කරනු ලබයි.

කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා අනෙකුත් බහුපාර්ශවීය නියෝජිත ආයතන උදෙසා සාමාජික රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ බැඳීම හා වගකීම් සපුරා ඇති බව සහතික කිරීම හා කම්කරු ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, ජාතික මට්ටමේ සමාජ සංවාද ඇති කිරීම සහ මානව සම්පත් සංවර්ධනය සඳහා ජාත්‍යන්තර සහාය ලබා ගැනීම සිදු කරනු ලබයි.

### 2019 ජනවාරි 01 සිට 2019 දෙසැම්බර් 31 දක්වා කාර්යසාධනය

- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ව්‍යවස්ථා අංක 22 යටතේ යැවිය යුතු වාර්තා සම්පාදනය කිරීම 2019 වර්ෂය සඳහා සම්මුතීන් 06ක් සඳහා වාර්තා සම්පාදනය කිරීම සහ ව්‍යවස්ථා අංක 19 යටතේ යැවිය යුතු වාර්තාව සම්පාදනය කිරීම.

- වාර්ෂිකව ජිනීවාහි පැවැත්වෙන ජාත්‍යන්තර කම්කරු සමුළුව සඳහා ත්‍රෛපාර්ශවීය නියෝජිතයන් සහභාගී කරවීමට අදාළ සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ පසුවිපරම් කටයුතු සිදු කිරීම.

- ත්‍රෛපාර්ශවීය නියෝජනයෙන් යුක්ත ජාතික කම්කරු උපදේශක සභා (NLAC) රැස්වීම් 04ක් පවත්වා ඇත.

- විදේශීය ශිෂ්‍යත්ව වැඩමුළු සහ පුහුණු වැඩසටහන් සඳහා මෙම අමාත්‍යාංශයට අදාළ අනෙකුත් ආයතන සහ කම්කරු දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් සහභාගී කිරීමට පියවර ගැනීම. 2019 ජනවාරි 01 සිට 2019 දෙසැම්බර් 31 දක්වා කාල සීමාව තුළ නිලධාරීන් 93ක් විදේශ පුහුණු පාඨමාලා සහ වැඩමුළු සඳහා සහභාගී වී ඇත.

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන කාලීන ආර්ථික සංවර්ධනයේ වැදගත් අංශ සහ ආර්ථික සංවර්ධනයේ ඉදිරි දැක්ම සම්බන්ධයෙන් වන වාර්තාවට අදාළ තොරතුරු සැපයීම සහ මහ බැංකු වාර්ෂික වාර්තාවට අදාළ තොරතුරු සම්පාදනය කිරීම.

- පෞද්ගලික අංශයේ සේවකයන්ගේ සේවා නියමයන් හා කොන්දේසිවලට අදාළව දැනට ක්‍රියාත්මක වන අණපනත්වල විෂමතාවයන් ඉවත් කර ගැනීම සඳහා මෙන්ම දැනට රටේ පවතින අවශ්‍යතාවනට අනුව නම්‍යශීලී සේවා කොන්දේසි හඳුන්වා දීම සඳහා නව සේවා කොන්දේසි ඇතුළත් කර පනතක් හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

- ශ්‍රී ලංකාව හා විදේශ රටවල් අතර කම්කරු ක්ෂේත්‍රයට අදාළව සමාජ ආරක්ෂණ, අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉදිරියේ දී ඇතිකර ගැනීමට නියමිත අවබෝධතා ගිවිසුම් හා ඒ සම්බන්ධ සියලු වැඩසටහන්වලට අදාළව කටයුතු කිරීම.

- විදේශ කටයුතු අමාත්‍යාංශය සහ අනෙකුත් රජයේ අමාත්‍යාංශ වෙත කම්කරු ක්ෂේත්‍රයට අදාළ වන නව ප්‍රවණතා පිළිබඳ වාර්තා සම්පාදනය කිරීම.

- කම්කරු ක්ෂේත්‍රයේ සහයෝගීතාව ගොඩනැංවීම උදෙසා සිදු කරන ලද ශ්‍රී ලංකාවේ සහ විදේශීය නිල දූත සංචාර සම්බන්ධව කටයුතු කිරීම.

- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහයෝගීතාවය ඇතිව ක්‍රියාත්මක කරන ව්‍යාපෘති හා වැඩමුළුවලට අදාළව සියලුම සම්බන්ධීකරණ කටයුතු කිරීම.

- බලහත්කාර ශ්‍රමය පිළිබඳ 29වන මූල ලේඛය අපරානුමත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

- නිව්යෝක් හා නේපාල් හි පැවැත්වූ ළමා ශ්‍රමය තුරන් කිරීමේ III, VI වන ගෝලීය සමුළුව සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීම වෙනුවෙන් අමාත්‍යාංශයේ නිලධාරීන් සහභාගි කරවීම හා එමගින් ලෝකයේ ළමා ශ්‍රමය තුරන් කළ රටවල් අතුරින් ශ්‍රී ලංකාව ආදර්ශ රටක් ලෙස (Pathfinder Country) නම් කරනු ලැබීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

- සේවා නියුක්ති පනත් කෙටුම්පත පිළිබඳ සාකච්ඡා කිරීමට පත් කරන ලද කම්කරු දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන්ගෙන් සමන්විත කමිටු සාමාජිකයන්ගේ රැස්වීම පැවැත්වීම. මෙහිදී පනත් කෙටුම්පත් කිරීම සඳහා සහභාගි වූ අදාළ උපදේශකවරුන් ද සම්බන්ධ කර ගනිමින් පනතේ සඳහන් එක් එක් ව්‍යාපෘති පිළිබඳ දීර්ඝ ලෙස සාකච්ඡාවට බඳුන් විය.

- අමාත්‍යාංශයට අදාළ ක්‍රියාත්මක වන සියලුම ආකාරයේ ප්‍රතිපත්ති සැකසීම සඳහා මූලිකත්වය දැරීම.

- ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NHRAP 2017-2021) ට අදාළ ප්‍රගතිය සම්බන්ධ වාර්තා සම්පාදනය කිරීම හා එහි අන්තර්ගත "කම්කරු අයිතිවාසිකම්" පරිච්ඡේදයට අදාළව සඳහන් කර ඇති අරමුණු හා ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම.

- "සුනිසි මෙහෙවර වැඩසටහන" (DWCP) යටතේ වන කාර්ය බලකා රැස්වීම් 03ක් පවත්වා ඇත.

- රජයට පවරාගත් වතු සමාගම්වල සේවකයන්ට අයවිය යුතු හිඟ සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් හා පාරිතෝෂික මුදල් ගෙවීම පිළිබඳ කම්කරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව හා වතු කම්කරුවන් නියෝජනය කරන වෘත්තීය සංගම් සාමාජිකයන් සමග කාර්තුමය සමාලෝචන රැස්වීම් සංවිධානය කිරීම.

- කම්කරු අමාත්‍යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව හා ජාත්‍යන්තර කම්කරු සංවිධානය එක්ව ජාත්‍යන්තර කම්කරු සංවිධානයට වසර 100 සපිරීමේ උත්සවය සැමරීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම.




ඡායාරූපය 2.1.3.ජාත්‍යන්තර කම්කරු සංවිධානයට
වසර 100 සපිරීම නිමිත්තෙන් මුල් දින කවරයක් සහ
සමරු මුද්දරයක් නිකුත් කිරීම

## 2.1.4. මුදල් අංශය

### 2019 වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය

| වර්ගය | ඇස්තමේන්තුව | තත්‍ය | හිඟය/ අතිරික්තය | විචල්‍යතාවයන් සඳහා ප්‍රධාන හේතු |
|---|---|---|---|---|
| පුනරාවර්තන | 242,000,000 | 207,949,838 | 34,050,162 | සැලකිය යුතු විචල්‍යතාවයක් නැත. |
| ප්‍රාග්ධන | 135,250,000 | 111,078,800 | 24,171,200 | සැලකිය යුතු විචල්‍යතාවයක් නැත. |

වගුව 2.1.2. 2019 වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය

| | ආයතනය | වැය ශීර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය (රු. 000') | වියදම (රු. 000') | ඉතිරි ප්‍රතිපාදනය (Rs. 000') | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|
| 1 | අමාත්‍යාංශ කාර්යාලය | 54 | පුනරාවර්තන | 184,820 | 158,038 | 26,782 | 85.5 |
| | | | මූලධන | 125,630 | 96,385 | 29,245 | 76.7 |
| 2 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | | පුනරාවර්තන | 12,000 | 10,769 | 1,231 | 89.7 |
| | | | මූලධන | 1,600 | 473 | 1,127 | 29.6 |
| 3 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය | | පුනරාවර්තන | 6,000 | 5,240 | 760 | 87.3 |
| | | | මූලධන | 7,500 | 4,185 | 3,315 | 55.8 |
| 4 | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | | පුනරාවර්තන | 39,180 | 32,929 | 6,251 | 84.0 |
| | | | මූලධන | 520 | 373 | 147 | 71.7 |
| | මුළු එකතුව | | පුනරාවර්තන | **242,000** | **206,976** | **35,024** | **85.5** |
| | | | මූලධන | **135,250** | **101,416** | **33,834** | **75.0** |
| 5 | කම්කරු දෙපාර්තමේන්තුව | 221 | පුනරාවර්තන | 2,203,010 | 1,801,245 | 401,765 | 81.7 |
| | | | මූලධන | 1,328,010 | 1,307,883 | 20,127 | 98.4 |
| 6 | මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව | 328 | පුනරාවර්තන | 387,000 | 370,488 | 16,512 | 95.73 |
| | | | මූලධන | 27,775 | 23,877 | 3,898 | 85.97 |
| | **එකතුව** | | පුනරාවර්තන | **3,231,930** | **2,749,828** | **482,102** | **85.08** |
| | | | මූලධන | **1,531,975** | **1,467,397** | **64,578** | **95.78** |
| | **මුළු එකතුව** | | පුනරාවර්තන | **3,473,930** | **2,956,804** | **517,126** | **85.11** |
| | | | මූලධන | **1,667,225** | **1,568,813** | **98,412** | **94.09** |

වගුව 2.1.3. 2019 වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය

### 2.1.5 අභ්‍යන්තර විගණන අංශය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය හා කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය යන ආයතන අරමුණු කරා ළඟා වීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර පාලනය නිවැරදිව පවත්වාගෙන යාම සඳහා මඟ පෙන්වීම, උපදෙස් ලබා දීම හා ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා රජය විසින් නිකුත් කරනු ලබන සියලුම චක්‍රලේඛයන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා යොමු කරවීම මෙම අංශයේ මූලික අරමුණ වේ.

**අංශයේ කාර්යයන්**

1. 2018 අංක 19 දරන ජාතික විගණන පනත අනුව සියලු කාර්යයන් ඉටුකිරීමට යොමු කරවීම.

2. කාර්තුවකට වරක් ආයතනයන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම හා ආයතනික වශයෙන් පවතින ගැටළු සාකච්ඡා කර නිරවුල් කරගැනීමට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම සඳහා වර්ෂයක් තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් පැවැත්වීම.

3. රාජ්‍ය ගිණුම් කාරක සභා නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම, පාර්ලිමේන්තු ඇගයීමට ලක් කෙරෙන අංශ කෙරෙහි කළමනාකරණ විගණන කමිටු රැස්වීමේ දී වැඩි අවධානය යොමු කිරීම .

4. වාර්ෂිකව සකස් කර ඉදිරිපත් කළ යුතු වාර්තා නිසි කාල රාමුව තුළ සකස් කර ඉදිරිපත් කිරීමට උපදෙස් ලබාදීම.

## 2.2 අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්හි ප්‍රගතිය

### 2.2.1

## කම්කරු දෙපාර්තමේන්තුව

කම්කරු දෙපාර්තමේන්තුව, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු ශ්‍රමිකයන්ගේ වෘත්තීය හිමිකම් තහවුරු කිරීම හා සමාජ ආරක්ෂණය ඇති කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනයයි. මෙම විෂය මධ්‍යම රජය යටතේ පාලනය වන්නක් හෙයින් දෙපාර්තමේන්තුව විසින් ඊට අදාළ අණ පනත් ක්‍රියාත්මක කිරීම හා අවශ්‍ය ප්‍රවර්ධනය කිරීම් සිදු කිරීම සඳහා, දීප ව්‍යාප්තව කම්කරු කාර්යාල පවත්වා ගනිමින් පැවරී ඇති වගකීම ඉටු කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ වතුවල සේවය කිරීම සඳහා බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් ඉන්දියාවේ සිට මෙරටට ගෙන්වන ලද කම්කරුවන්ට සුබසාධනය සැපයීමේ අරමුණින් 1923 අංක 01 දරන ඉන්දියානු ආගමික කම්කරු ආඥා පනතට අනුව මෙම දෙපාර්තමේන්තුව මුල් වරට පිහිටුවා ඇත.

**දැක්ම**

''අන්තර්ජාතිකව තරඟකාරී ආර්ථිකයක් සඳහා කල්පවත්නා කාර්මික සාමයක් සහිත රටක්''

**මෙහෙවර**

''කම්කරු අයිතීන් ආරක්ෂා කරමින්, තහවුරු කරන ලද කාර්මික සාමය සහිත සුනිසි වැඩ පරිසරයක් තුළින් සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම''

**අරමුණු**

- අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවා ආයතන තුළ ස්ථිරසාර කාර්මික සාමය තහවුරු කිරීම
- සුනිසි වැඩ පරිසරයක් ඇති කිරීම හා ශ්‍රම ප්‍රමිතීන් සකස් කිරීම මගින් ශ්‍රමිකයාගේ සේවා තත්ත්වය වැඩි දියුණු කිරීම
- ශ්‍රමිකයාගේ සමාජ ආරක්ෂණය තහවුරු කිරීම
- ස්ත්‍රීන් හා තරුණ අයගේ වෘත්තීමය සුරක්ෂිතතාවය තහවුරු කිරීම හා ළමා ශ්‍රමය තුරන් කිරීම
- ශ්‍රමිකයන්ගේ සෞඛ්‍ය තත්ත්වයන්ට හිතකර හා අනතුරු රහිත වැඩ පරිසරයක් නිර්මාණය කිරීම

**කාර්යභාරය**

- ආයතනවල සේවා යෝජකයන් හා සේවකයන් අතර කතිකාව ප්‍රවර්ධනය කිරීම
- කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම හා සමාජ කතිකාවත ප්‍රවර්ධනය මඟින් කාර්මික ආරවුල් ඇතිවීම වැළැක්වීම හා ඇතිවූ ආරවුල් නිරවුල් කිරීම
- ඵලදායීව ආයතන පරීක්ෂණ (ශ්‍රමික පරීක්ෂණ) සිදු කිරීම සහ ඒ සඳහා දෙපාර්තමේන්තු නිලධරයන්ට ඇවැසි දැනුම නිරන්තරව යාවත්කාලීන කිරීම මගින් ශ්‍රමිකයන්ගේ ව්‍යවස්ථාපිත හිමිකම් තහවුරු කිරීම.
- සේවක, සේවා යෝජක දෙපාර්ශවය තුළ කම්කරු නීති පිළිබඳව පවතින දැනුම හා අවබෝධය පුළුල් කිරීම තුළින් කාර්මික සාමය තහවුරු කිරීම.
- ජාතික ආර්ථික ව්‍යුහයේ වෙනස්කම් අනුව උචිත වන්නා වූ ශ්‍රම ප්‍රමිතීන්, අන්තර්ජාතික ප්‍රමිතීන් අනුව යමින් සැකසීම හා ක්‍රියාවට නැංවීම.

- සේවක අර්ථසාධක අරමුදල මනා ලෙස පරිපාලනය කිරීම තුළින් හිමිකරුවන්ට ප්‍රතිලාභ නියමිත පරිදි ලබා දීම තහවුරු කිරීම සහ එපරිදිම අනුමත පෞද්ගලික අර්ථසාධක අරමුදල් හා විශ්‍රාම දීමනා ක්‍රම පිළිබඳ පරිපාලනය

- කාන්තාවන්, තරුණ අය හා ළමුන් පිළිබඳ කම්කරු නීති ඇතුලු සියලු කම්කරු නීති සාධනීය ලෙස ක්‍රියාවට නැංවීම

- වැඩ බිම තුළ සෞඛ්‍ය ආරක්ෂිත බව හා අනතුරු රහිත බව පිළිබඳව ශ්‍රමිකයන් දැනුවත් කිරීම, සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම හා අනතුරු රහිත බව තහවුරු කිරීම

- ඉහත කාර්යයන් සඳහා තීරණ ගැනීමට අවශ්‍ය සංඛ්‍යා ලේඛන දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය

- ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් නීතියෙන් හා භාවිතයෙන් බලාත්මක කිරීමට කටයුතු කිරීම

- ළමා ශ්‍රමය හා අනතුරුදායක ළමා ශ්‍රමය තුරන් කිරීමට කටයුතු කිරීම

### 2.2.1.1. ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය සඳහා කාර්මික සාමය සුරක්ෂිත කිරීම

දෙපාර්තමේන්තුවේ මූලික හා අත්‍යවශ්‍ය කාර්ය වන කාර්මික සාමය පවත්වා ගැනීම සඳහා සේවායෝජක සේවක දෙපාර්ශවය අතර කතිකාවක් පවත්වාගෙන යාම, සේවා ස්ථාන (ශ්‍රමික) පරීක්ෂා කිරීම, ව්‍යවස්ථාපිත හිමිකම් අහිමිවීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරවුල් නිරවුල් කිරීම, ශ්‍රමිකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරැකීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම යන ප්‍රධාන අංශ 04 යටතේ දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ.

### I. සේවායෝජක සේවක දෙපාර්ශවය අතර කතිකාවතක් පවත්වා ගැනීම

දිවයින පුරා විසිරී ඇති අර්ධ රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතනවල උපරිම ඵලදායීතාව හා කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා සේවායෝජක සේවක දෙපාර්ශවය අතර කාර්මික සාමය තහවුරු කෙරෙන වැඩ පරිසරයක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය ඉටු කිරීම උදෙසා 2019 වර්ෂයේ දී පහත කාර්යයන් ඉටු කරන ලදී.

- යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් සේවායෝජක සේවක දෙපාර්ශවයට කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීම සඳහා ආයතන මට්ටමේ වැඩසටහන් සහ කළමනාකරුවන් හා සේවායෝජකයින් සඳහා වන වැඩසටහන් පහත පරිදි සංවිධානය කොට පැවැත්වීම.



ඡායාරූපය 2.2.1.1.සමාජ කතිකා අංශයෙන් සිදුකළ සේවා සේවක දෙපාර්ශවය දැනුවත් කිරීමේ ආයතන මට්ටමේ වැඩසටහනක්

| අනු. අංකය | වැඩසටහන | වැඩසටහන් ගණන |
|---|---|---|
| 01 | සමාජ කතිකා අංශයෙන් සිදු කළ සේවා සේවක දෙපාර්ශවය දැනුවත් කිරීමේ ආයතන මට්ටමේ වැඩසටහන් | 66 |
| 02 | සමාජ කතිකා අංශයෙන් සිදුකළ කළමනාකරුවන් හා සේවායෝජකයින් සඳහා පවත්වන ලද වැඩසටහන් | 10 |
| 03 | සමාජ කතිකා අංශයෙන් සිදුකළ අර්ධ රාජ්‍ය ආයතනවල පවත්වන ලද වැඩසටහන් | 13 |
| 04 | දිස්ත්‍රික් කාර්යාල මඟින් සිදු කළ සේවායෝජක සේවක දෙපාර්ශවය දැනුවත් කිරීමේ වැඩමුළු | 37 |
| 05 | උප කාර්යාල මඟින් සිදු කළ සේවායෝජක සේවක දෙපාර්ශවය දැනුවත් කිරීමේ වැඩමුළු | 13 |

වගුව 2.2.1.1. ආයතන මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් - 2019


- සේවායෝජක, සේවක දෙපාර්ශවය හා නියෝජ්‍ය/සහකාර කම්කරු කොමසාරිස්වරුන්ගේ සහභාගීත්වයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ පළාත් කාර්යාල හරහා ත්‍රෛපාර්ශවීය සබඳතාවය ගොඩනැගීම සහ ප්‍රතිපත්ති සම්පාදනයට අවශ්‍ය තොරතුරු රැස් කර ගැනීමට කලාප උපදේශන සභා 19ක් පැවැත්වීම.

- දැනුම බෙදා හදා ගැනීමටත් සේවායෝජක සේවක දෙපාර්ශවය අතර, කම්කරු නීති පිළිබඳව පවතින ගැටළු නිරාකරණය කිරීමටත් කලාප කතිකාවත වැඩසටහන් 11ක් පැවැත්වීම.

- සමාජ කතිකාව කොතරම් දුරට ආයතන තුළ තහවුරු වී තිබේද යන්න පිළිබඳව වාර්ෂිකව නිෂ්පාදන, සේවා, ඇඟලුම් හා වතු අංශය නියෝජනය වන පරිදි කුඩා, මධ්‍ය හා මහා පරිමාණ වශයෙන් දීප ව්‍යාප්තව සමාජ කතිකාව හා වැඩපොළ සහයෝගීතාවය පිළිබඳ තරඟාවලියක් වාර්ෂිකව පැවැත්වීමටත් කටයුතු කරනු ලබයි. 2019 වර්ෂය සඳහා වන මෙම තරඟයේ මූලික කටයුතු සිදු කර ඇති අතර සම්මාන ප්‍රධානෝත්සවය 2020 වර්ෂයේ ජනවාරි මාසයේ දී පැවැත්වීමට නියමිතය.

## II. සේවා ස්ථාන (ශ්‍රමික) පරීක්ෂණ සිදු කිරීම

සේවා ස්ථාන (ශ්‍රමික) පරීක්ෂණ සිදුකිරීමේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ වැඩ පියසේ දී ශ්‍රමිකයන්ගේ ව්‍යවස්ථාපිත හිමිකම් ආරක්ෂා කිරීම සඳහා පනවා ඇති නීති හා රෙගුලාසි නිසි පරිදි ක්‍රියාත්මක වේද යන්න පරීක්ෂාවට ලක් කර, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ සේවායෝජක සේවක දෙපාර්ශවය අතර ගැටළු ඇති වීම පාලනය කර සුහද සම්බන්ධතාවයක් ඇති කිරීමයි. මෙම කාර්යය ඉටු කිරීම සඳහා කලාප කම්කරු කාර්යාල 11ක්, ඒ යටතේ දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40ක් හා උප කම්කරු කාර්යාල 17ක් ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි ස්ථාපනය කර ඇති අතර, කම්කරු නිලධරයන් 493ක් සේවයේ යොදවා ඇත. දැනට ලැබී ඇති දත්ත අනුව, 2019 වසරේදී කම්කරු නිළධරයන් විසින් සිදු කළ සමස්ත ශ්‍රමික පරීක්ෂණ සංඛ්‍යාව 76,108 කි.





ප්‍රස්ථාරය 2.2.1.1. සේවා ස්ථාන (ශ්‍රමික) පරීක්ෂණ -2019

සටහන - දැනට ලැබී ඇති දත්ත අනුව ඉහත ප්‍රස්ථාරය සකස් කර ඇති බැවින් මෙම දත්ත වෙනස් විය හැකිය.

## III. ව්‍යවස්ථාපිත හිමිකම් අහිමිවීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරවුල් නිරවුල් කිරීම

ව්‍යවස්ථාපිත නීති උල්ලංඝනය වීම් හා කාර්මික ආරාවුල් ඇති වීමට ඉඩ ඇති අවස්ථා හා වැඩ වර්ජන පිළිබඳ පැමිණිලි ප්‍රධාන කාර්යාලයට දිස්ත්‍රික් කාර්යාල හා උප කාර්යාල වෙත යොමු කිරීම සේවකයන් හෝ වෙනත් විවිධ පාර්ශවයන් විසින් කරනු ලැබේ. දිස්ත්‍රික් කාර්යාල, කලාප කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ අදාළ අංශ මඟින්ද ඒවා විසඳීමට කටයුතු කරනු ලැබේ. එම උත්සහය අසාර්ථක වුවහොත් අදාළ කාර්මික ආරවුල් විෂයභාර ගරු ඇමතිතුමන්ගේ නියෝග මත බේරුම්කරුවෙකු වෙත හෝ කාර්මික අධිකරණය වෙත යොමු කර විසඳුමක් ලබා දීමට කටයුතු කරනු ලැබේ.


2019 වර්ෂයේදී ව්‍යවස්ථාපිත නීති උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් පහත පරිදි වේ.




ප්‍රස්ථාරය 2.2.1.2. ව්‍යවස්ථාපිත නීති උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් - 2019

සටහන - දැනට ලැබී ඇති දත්ත අනුව ඉහත ප්‍රස්ථාරය සකස් කර ඇති බැවින් මෙම දත්ත වෙනස් විය හැකිය.

වර්ෂය තුළ ලැබෙන ව්‍යවස්ථාපිත නීති උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි ගණනට සාපේක්ෂව විසඳූ පැමිණිලි ගණන ඉහළ අගයක් ගැනීමත් පැමිණිලි විසඳීමේ ප්‍රවණතාවය පැමිණිලි ලැබීමේ ප්‍රවණතාවයට සාපේක්ෂව වැඩි ආනතියක් දැරීමත්, පැමිණිලි විසඳීමට ගත වන කාලය ඉදිරියේ දී අවම කර ගැනීමට ඇති විභවය පෙන්නුම් කරයි.




ප්‍රස්තාරය 2.2.1.3. කාර්මික ආරවුල් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම් - 2019

සටහන - දැනට ලැබී ඇති දත්ත අනුව ඉහත ප්‍රස්ථාරය සකස් කර ඇති බැවින් මෙම දත්ත වෙනස් විය හැකිය.


වැඩ වර්ජනයක් දක්වා වර්ධනය විය හැකි තත්ත්වයන් නිරීක්ෂණය වූ වහාම දෙපාර්තමේන්තු නිලධරයන් විසින් එම තත්ත්වය පාලනය කිරීමට කටයුතු කරන අතර, වැඩ වර්ජනයක් ඇති වුවහොත් ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදු කර විසඳීමට කටයුතු කරනු ලැබේ. 2018 වසරට සාපේක්ෂව 2019 වසරේ වාර්තා වූ වැඩ වර්ජන සංඛ්‍යාව කැපී පෙනෙන ලෙස පහත වැටී ඇත.

| අනු. අංකය | සිදුවීම | වතු | ඉදිකිරීම් | නිෂ්පාදන | පතල් කැණීම් | අර්ධ රාජ්‍ය | වෙනත් සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | වැඩ වර්ජන වාර්තා වීම් | 8 | 1 | 11 | - | - | 1 | 21 |
| 02 | සහභාගි වූ සේවක සංඛ්‍යාව | 1,952 | 100 | 4,701 | - | - | 16 | 6,769 |
| 03 | අහිමි වූ මිනිස් දින සංඛ්‍යාව | 28,218 | 200 | 26,403 | - | - | 16 | 54,837 |

වගුව 2.2.1.2.- වැඩ වර්ජන පිළිබඳ වාර්තා වූ දත්ත - 2019

කාර්මික ආරවුල් සමථකරණයේදී සාමූහික ගිවිසුම්වලට එළඹීම මගින් සේවායෝජකයන් හා සේවකයන් දෙපාර්ශවය වෙත වඩා ස්ථිර විසඳුමක් ලැබීම මෙන්ම කම්කරු නීතිරීති වලින් ලබා දී ඇති අයිතිවාසිකම් සහ වරප්‍රසාදවලට වඩා වැඩි වරප්‍රසාද ලබා ගැනීමට හැකියාව ද ලැබේ.

පසුගිය වසර කිහිපය තුළ ලියාපදිංචි කරන ලද සාමූහික ගිවිසුම් සංඛ්‍යාවේ ක්‍රමික අඩුවීමක් පෙන්නුම් කෙරෙන බැවින් සාමූහික ගිවිසුම් සඳහා සමාජ කතිකාවත තුළින් පෙළඹවීමක් සිදු කිරීමට දෙපාර්තමේන්තුව විසින් උත්සාහ ගනු ලැබේ.




ප්‍රස්තාරය 2.2.1.4. සාමූහික ගිවිසුම් ලියාපදිංචි කිරීම -2019

කම්කරු කාර්යාල මඟින් හෝ සෘජුවම දෙපාර්තමේන්තුවේ කාර්මික සම්බන්ධතා අංශය මඟින් කටයුතු කළ ද සමථ නොවන ආරවුල්, බේරුම්කරණයට හෝ කාර්මික අධිකරණයකට යොමු කරනු ලබන අතර 2019 වර්ෂයේදී අනිවාර්ය බේරුම්කරණයට යොමු කිරීම් 125ක් ද ප්‍රදාන නිකුත් කිරීම් 56ක් ද සිදු කර ඇත.

කාර්මික සාමය කඩවීමක දී සේවායෝජක, සේවක දෙපාර්ශවය වෙතින් ඉදිරිපත් වන කරුණු සාධාරණ හා යුක්ති සහගතව සම අවධානයන් සහිතව සැලකිල්ලට ගැනීමට අවස්ථාව සැලසීම සඳහා තනි තනි සේවකයන් වශයෙන් නොවූ සමූහයන් වශයෙන් කරුණු දැක්වීමට අවස්ථාව සලසා දීම සඳහා වෘත්තීය සමිති පිහිටුවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමට අවස්ථාව සලසා දී ඇත. ඒ අනුව, 2019 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිති සංඛ්‍යාව 132කි. 2019.12.31 දිනට ක්‍රියාත්මක වලංගු මුළු වෘත්තීය සමිති සංඛ්‍යාව 1903කි.

### 2.2.1.2. ශ්‍රමික අයිතීන් ප්‍රමිතිගත කිරීම

පෞද්ගලික අංශයේ සේවා නියුක්තයන්ගේ රැකියා සුරක්ෂිතභාවය හා සුභසාධනය කෙරෙහි බලපාන්නා වූ වැටුප්, සේවා තත්ත්වයන් හා කොන්දේසි පිළිබඳව ප්‍රමිතීන් සකස් කිරීම, යාවත්කාලීන කිරීම හා ඒවාට නෛතික තත්ත්වය ලබා දීම දෙපාර්තමේන්තුවේ අනවරත ක්‍රියාවලියකි. ඒ අනුව, 2019 වර්ෂයේදී පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

| | වැඩසටහන/ක්‍රියාකාරකම් | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| 1 | කාලය ඉකුත් වන පඩි පාලක සභා සඳහා නියෝජිතයන් පත් කිරීම | 23 |
| 2 | දින පහ වැඩ සතිය සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම | 203 |
| 3 | සේවා සේවක දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 2 |
| 4 | කොකෝවා, කරදමුංගු හා ගම්මිරිස් වැවීමේ හා තැනීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවේ අවම වැටුප් මාසිකව ප්‍රසිද්ධ කිරීම | 12 |
| 5 | සාමූහික ගිවිසුම්වල නීතිමය වලංගුභාවය පරීක්ෂා කිරීම | 22 |

| | වැඩසටහන/ක්‍රියාකාරකම් | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| 6 | 2016 අංක 04 දරන අය වැය සහන දීමනාව පනත යටතේ පැහැදිලි කිරීම් හා නීතිමය අර්ථකථන ලබා දීම | 45 |
| 7 | පඩි පාලක සභා ආඥා පනත යටතේ පැහැදිලි කිරීම් හා නීතිමය අර්ථකතන ලබා දීම | 65 |
| 8 | සාප්පු හා කාර්යාල පනත යටතේ පැහැදිලි කිරීම් හා නීතිමය අර්ථකථන ලබා දීම | 46 |
| 9 | පඩි පාලක සභා ආඥාපනත් හා සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ වැටුපෙන් අඩු කිරීම් සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම | 44 |
| 10 | පඩි පාලක සභා ආඥා පනත් හා සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ දඩ අරමුදල් පිහිටුවීම සහ දඩ අරමුදලින් වියදම් කිරීමට ලැබෙන ඉල්ලීම් සඳහා අනුමැතිය ලබා දීම | 5 |
| 11 | පඩි පාලක සභා සම්බන්ධව විශේෂ නිවාඩු දින හා මැතිවරණ නිවාඩු පුවත් පත් මගින් දැනුම් දීම | 3 |
| 12 | අංශය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට්, පනත් සංශෝධන හා රෙගුලාසි වල මෘදු පිටපත් දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි උඩුගත කිරීම සඳහා යොමු කිරීම | 17 |
| 13 | පඩි පාලකසභා තීරණ සංශෝධනය කිරීම හා මුද්‍රණය | 44 |

වගුව 2.2.1.3. ශ්‍රමික අයිතීන් ප්‍රමිතිගත කිරීමේ ක්‍රියාකාරකම් -2019

## 2.2.1.3 ශ්‍රමිකයාගේ වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව හා අනතුරු රහිත වැඩ පරිසරය තහවුරු කිරීම

### I. වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම

බලපවත්නා කර්මාන්ත ශාලා ආඥා පනත අනුව සේවකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා වන පරිදි සේවා ස්ථානයේ පරිසරය සැකසීම සේවා යෝජකයාගේ අනිවාර්ය වගකීමක් වන අතර, ආරක්ෂිත සේවා පරිසරයක සේවය කිරීමට ඇති හිමිකම සේවකයන්ගේ මූලික අයිතිවාසිකමක් වේ. මේ සඳහා 2019 වර්ෂයේ දී සිදු කරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පහත පරිදි වේ.

- **සේවා ස්ථානවල සෞඛ්‍යාරක්ෂිත බව පරීක්ෂාවට ලක් කිරීම**

| | වැඩසටහන/ක්‍රියාකාරකම් | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| 1 | පාරිසරික මිනුම් | 131 |
| 2 | ජෛව විද්‍යාත්මක අධීක්ෂණ | 2495 |
| 3 | වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විගණනයන් | 292 |
| 4 | දැනුවත් කිරීමේ වැඩසටහන් | 240 |
| 5 | සේවක අර්ථසාධක අරමුදල් වෛද්‍ය මණ්ඩල | 24 |

වගුව 2.2.1.4. සේවා ස්ථානවල සෞඛ්‍යාරක්ෂිත බව පරීක්ෂාවට ලක් කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාකාරකම් - 2019

## II. අනතුරු රහිත වැඩ පරිසරය තහවුරු කිරීම

කර්මාන්තශාලා තුළ සේවයෙහි යෙදෙන ශ්‍රමිකයන් හට භෞතිකමය වශයෙන් යම් ශාරීරික හානි සිදුවීම්, විදුලිය, තාපය, වායු පීඩනය, අධික ආලෝකය හා ශබ්දය මඟින් ශාරීරික හානි හෝ මරණය පවා සිදුවීමේ අවධානමක් පවතින අතර ඒ තුළින් ඇතිවන අනතුරු අවම කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයකි.

ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි පිහිටුවා ඇති දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10හි සේවයේ නියුතු ඉංජිනේරුවරු විසින් කර්මාන්තශාලා පරීක්ෂා කර මෙම කාර්ය ඉටු කරනු ලැබේ.

නව කර්මාන්තශාලා ලියාපදිංචි කිරීමේ දී ලියාපදිංචි වී ඇති කර්මාන්තශාලා සංඛ්‍යාව 31,346කි. මෙම වසර තුළ ලියාපදිංචි කරන ලද නව කර්මාන්ත ශාලා සංඛ්‍යාව - 1,409කි.

ගොඩනැගිලි පිඹුරුපත් පරීක්ෂා කිරීම හා අනුමත කිරීම - 147

කර්මාන්තශාලා පරීක්ෂා කිරීම - 3944

**අනතුරු විමර්ශනය සහ අන්තරාදායී සිදුවීම් විමර්ශනය**

2019 වර්ෂය තුළ මරණීය අනතුරු 84ක් හා මරණීය නොවන අනතුරු 1,409ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව වෙත වාර්තා වී ඇත. මෙම මරණීය අනතුරු සියල්ලම හා මරණීය නොවන බරපතල අනතුරු විමර්ශනය කර අනතුරට හේතු සොයා ගැනීම තුළින් එවැනි අනතුරු නැවත සිදු නොවන ආකාරයට කටයුතු කිරීමට ආයතන දැනුවත් කිරීමත් කර්මාන්තශාලා ආඥා පනත උල්ලංඝණය වන පරිදි කටයුතු කිරීම තුළින් අනතුරු සිදුවී ඇති අවස්ථාවන්හිදී එම ආයතනයන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇත.

- නීතිමය පියවර ගැනීම - 29
- අධිඅන්තරායදායී යන්ත්‍ර පරීක්ෂාව නියාමනය කිරීම - 9832
- දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම

| අනු. අංකය | අදාළ අංශය | පැවැත් වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | ඉදිකිරීම් | 41 | 3,100 |
| 02 | ඇඟළුම් | 23 | 2,500 |
| 03 | වෙනත් නිෂ්පාදන | 19 | 1,800 |
| 04 | වෙනත් | 13 | 2,000 |
| 05 | එකතුව | 96 | 9,400 |

වගුව 2.2.1.5. වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය ඉහළ නැංවීම් සඳහා සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩමුළු-2019

- **වෘත්තීය අනතුරු හා ලෙඩ රෝගවලට ගොදුරු වන්නන් කම්කරු වන්දි කොමසාරිස් හා ශ්‍රම වාසනා අරමුදල වෙත යොමු කිරීම**

2019 වර්ෂය තුළ දී වාර්තා වූ අනතුරු 349ක් කම්කරු වන්දි කොමසාරිස් වෙත යොමු කර වින්දිතයන්ගේ යැපෙන්නන්ට හා වින්දිතයන්ට වන්දි ලබා ගැනීමට කටයුතු සලසා ඇත.

මීට අමතරව වින්දිත පවුල්වල අධ්‍යාපනය ලබන දරුවන් සඳහා ශිෂ්‍යාත්ව ලබා දීමට අදාළ තොරතුරු ශ්‍රම වාසනා අරමුදල වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.

* *ලෝක සුරක්ෂිතතා දිනය සැමරුම*

2019.05.30 දින ලෝක සුරක්ෂිතතා දිනය වෙනුවෙන් කම්කරු දෙපාර්තමේන්තුව විසින් ජාතික සම්මන්ත්‍රණයක් ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. එය සීතාවක ආයෝජන මණ්ඩල ශ්‍රවණාගාරයේදී සේව්‍ය සේවක 250 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.



ඡායාරූපය 2.2.1.2. 2019 වර්ෂයේ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ සම්මන්ත්‍රණයේ අවස්ථාවක්

**ස්ත්‍රීන්, තරුණ ශ්‍රමිකයන්ගේ වෘත්තීය හිමිකම් ආරක්ෂා කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීම**

වැඩ බිමෙහි කාන්තාව ආවරණය වන කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම, එම නීති කාලීනව සමාලෝචනය කරමින් අවශ්‍ය සංශෝධනයන් නිර්දේශ කිරීම මඟින් ඵලදායී කාන්තා ශ්‍රම දායකත්වයක් රටට ලබා දීම දෙපාර්තමේන්තුවේ එක් ප්‍රමුඛ වගකීමක් වේ.

එසේම, සියලු පාර්ශවකරුවන්ගේ දායකත්වය සහිතව ළමා ශ්‍රමය තුරන් කිරීම, වයස අවුරුදු 18ට අඩු ළමුන් සඳහා වන කම්කරු නීති ක්‍රියාත්මක කිරීම, පවත්නා නීතිය සංශෝධනය කොට වර්තමාන සමාජ ගැටළුවලට අදාළව, පවත්නා නීතියෙහි කළ යුතු සංශෝධනයන් නිර්දේශ කිරීම ද මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ වගකීමක් වේ.

**I. රැකියාවක නියුතු කාන්තාවන්, තරුණ අය හා ළමුන් පිළිබඳ පවතින නීති ක්‍රියාත්මක කිරීම - 2019 වර්ෂයේ ප්‍රගතිය.**

| අනු. අංකය | කාණ්ඩය | සංඛ්‍යාව | නිරීක්ෂණ |
|---|---|---|---|
| 01 | ළමා ශ්‍රමය පිළිබඳ පරීක්ෂණ | 189 | පැමිණිලි 162ක පරීක්ෂණ අවසන් කර ගොනු පියවන ලදී. එයින් පැමිණිලි පරීක්ෂණ 7ක දී ළමා ශ්‍රමයක් අනාවරණය වී ඇති බැවින් ඒ සඳහා නඩු කටයුතු ආරම්භ කර ඇත. |
| 02 | කාන්තාවන්ගේ සේවා කොන්දේසි පිළිබඳව ලැබුණු පැමිණිලි පරීක්ෂණ | 35 | පැමිණිලි 16ක් පරීක්ෂණ අවසන් කර ගොනු පියවන ලදී. |
| 03 | කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා දීම | 962 | කාන්තා හා ළමා කටයුතු අංශය මඟින් අනුමැතීන් 26ක් ද දිස්ත්‍රික් කාර්යාල මඟින් අනුමැතීන් 909ක් ද උප කාර්යාල මඟින් අනුමැතීන් 27ක් ද වශයෙන් කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා දී ඇත. |
| 04 | අනතුරුදායක ළමා ශ්‍රමය හා ළමා ශ්‍රමය පිළිබඳ විශේෂ කණ්ඩායම් පරීක්ෂණ | 67 | ආයතන 336ක් පරීක්ෂා කරන ලද අතර අනතුරුදායක ළමා ශ්‍රමයක් වාර්තා නොවීය. |
| 05 | කාන්තා ශ්‍රමිකයන් පිළිබඳ විශේෂ කණ්ඩායම් පරීක්ෂණ | 93 | ආයතන 465ක් පරීක්ෂා කරන ලදී. ආයතන 77ක කොන්දේසි කඩ කිරීම් වාර්තා වී ඇත. |

වගුව 2.2.1.6. රැකියාවක නියුතු කාන්තාවන්, තරුණ අය හා ළමුන් පිළිබඳ පවතින නීති ක්‍රියාත්මක කිරීම - 2019

## II. අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

- **අදාළ ප්‍රධාන සැමරුම් දිනයන් පැවැත්වීම මගින් දැනුවත් කිරීම**

**(අ) ජාත්‍යන්තර කාන්තා දින සැමරුම**

2019 වර්ෂයේ කාන්තා දින සැමරුම් වැඩසටහන 2019.03.08 වන දින කම්කරු දෙපාර්තමේන්තුවේ 10 වන මහල ශ්‍රවණාගාරයේදී කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

**(ආ) ජාත්‍යන්තර ළමා ශ්‍රම විරෝධී දින සැමරුම**

ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය හා අනර්ථකාරී රැකියා අවම කිරීම තුළින් දරු පරපුරට සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම හා එමඟින් දරුවන්ගේ කායික, මානසික සංවර්ධනය ඇති කිරීම, සෞඛ්‍ය හා අධ්‍යාපනය ඉහළ නැංවීමෙන් රටෙහි තිරසාර සංවර්ධනය ඇති කිරීම යන අරමුණු පෙරදැරි කර ගනිමින් කම්කරු දෙපාර්තමේන්තුව විසින් දීප ව්‍යාප්ත අනර්ථකාරී ශ්‍රම වැටලීමේ හා දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. ඊට සමගාමීව ජන මාධ්‍ය හරහා ද ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. මෙම වැටලීම් මාලාව මගින් සේවා ස්ථාන 236ක් ආවරණය වූ අතර අනර්ථකාරී රැකියාවන්හි යෙදෙන දරුවන් කිසිවෙකු හඳුනාගෙන නොමැත.

**(ඇ) ලෝක ළමා දින සැමරුම**

2019 වර්ෂයේ ලෝක ළමා දින සැමරුම් වැඩසටහන 2019.10.01 දින මොරටුව බෞද්ධ මන්දිරයේ දී කම්කරු දෙපාර්තමේන්තුවේ කාන්තා හා ළමා කටයුතු අංශයේ සංවිධානත්වයෙන් පවත්වන ලදී.

II. ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීමේ ව්‍යාපෘතිය යටතේ ළමා ශ්‍රමයෙන් තොර කලාප පිහිටුවීමේ වැඩසටහන

මෙම වැඩසටහන යටතේ නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කේන්ද්‍ර කරගනිමින් දෙමව්පියන් සහ දරුවන් දැනුවත් කිරීමක් සිදු කරන ලද අතර දිවයින පුරා පැවති දිස්ත්‍රික් ප්‍රාදේශීය ළමා සංවර්ධන කමිටුවලදී අදාළ නිලධරයන් දැනුවත් කිරීමටද කටයුතු කරන ලදී.

III. වෙනත් ආයතන මඟින් කාන්තාවන්, තරුණ අය සහ ළමුන්ගේ සුරක්ෂිතතාවය වෙනුවෙන් සිදු කරන ලද කාර්යයන්හි දී දෙපාර්තමේන්තුව පහත පරිදි සහය වී ඇත.

- ❖ ජාතික මව්කිරි දීමේ සතිය වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද මාධ්‍ය සාකච්ඡාවේ දී ප්‍රසූතිකාධාර නීතිය පිළිබඳව දැනුවත් කිරීම
- ❖ මිනිස් ජාවාරමට එරෙහි කමිටුව සඳහා සහභාගී වීම.
- ❖ ජාතික පෝෂණ ක්‍රියාකාරී සැලැස්ම සඳහා ක්‍රියාකාරී දායකත්වය ලබා දීම.

IV. අනෙකුත් විශේෂ වැඩසටහන් පිළිබඳ තොරතුරු

| අ.අ. | වැඩසටහන | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 05 | 405 |
| 2 | ළමා ශ්‍රමය සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කිරීමේදී ඒ සඳහා සහභාගීවන හා ඊට සහායවන නිලධාරීන් දැනුවත් කිරීම | 01 | 75 |
| 3 | රැකියා නියුක්ත කාන්තාවන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන | 01 | 75 |
| 4 | වැවිලි අංශයේ සේවක සේවිකාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 03 | 106 |
| 5 | කාන්තාවන්, ළමුන් හා තරුණ අය සේවයෙහි යෙදවීම පිළිබඳ කම්කරු නීති සම්බන්ධයෙන් කම්කරු නිලධරයන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් | 07 | 348 |

වගුව 2.2.1.7. කාන්තා හා ළමා කටයුතු සම්බන්ධ විශේෂ වැඩසටහන් - 2019

V. පවතින අදාළ නීති පද්ධතිය සංශෝධනය කිරීමේ කටයුතු වල ප්‍රගතිය

1956 අංක 47 දරන ස්ත්‍රීන් හා තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනතේ අංක 24 දරන සංශෝධනය අනුව පනතේ 20 (අ) වගන්තිය යටතේ පනවා ඇති රෙගුලාසි යටතේ වයස අවුරුදු 18ට අඩු කිසිවෙකු අනතුරුදායක රැකියාවල හෝ රැකියාවක යෙදවීම තහනම් කොට ඇත. 2018 වර්ෂයේ දී අනතුරුදායක රැකියා ලැයිස්තුව සංශෝධනය කොට වයස අවුරුදු 18ට අඩු පුද්ගලයන්ගේ කායික හා මානසික සෞඛ්‍යයට හා ආරක්ෂාවට හානිකර රැකියා අවස්ථාවන් හඳුනාගනිමින් "නව අනතුරුදායක රැකියා රෙගුලාසිය" කෙටුම්පත් කර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලදී. මෙම කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යොමු කර, පළමු කෙටුම්පත සඳහා කම්කරු දෙපාර්තමේන්තු නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට ද දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.

ළමයින් සේවයේ යෙදවිය හැකි අවම වයස අවුරුදු 14 සිට 16 දක්වා ඉහළ නැංවීම සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව, මෙම දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන පනත් 5ක කෙටුම්පත් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.

### 2.2.1.5. ශ්‍රමිකයාගේ සමාජ ආරක්ෂණය

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ ශ්‍රමිකයන්හට යහපත් ආර්ථික තත්ත්වයක් සහිත විශ්‍රාම දිවියක් උරුම කරදීමේ මූලික පරමාර්ථය පෙරදැරි කරගෙන ස්ථාපිත කර ඇති සේවක අර්ථසාධක අරමුදලෙහි පරිපාලනය කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. අරමුදලේ සමස්ත වටිනාකම රුපියල් මිලියන 2,514,515ක් වන අතර, අරමුදලේ සක්‍රීය හා අක්‍රීය ගිණුම් සංඛ්‍යාව මිලියන 18.9 ක් වේ.

- **සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවා ආයතන ලියාපදිංචි කිරීම**

සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ ආවරණය වන සියලුම අර්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන අරමුදලේ ලියාපදිංචි විය යුතුය. ඒ අනුව, 2019 වර්ෂය තුළ ලියාපදිංචි වූ ආයතන සංඛ්‍යාව 6218කි. 2019 වර්ෂය තුළ අරමුදල වෙත දායක මුදල් බැර කර ඇති ආයතන සංඛ්‍යාව 84,874කි. වර්ෂය තුළ අරමුදලට බැර වූ දායක මුදල රුපියල් මිලියන 157,434ක් වේ.

- **සේවක අර්ථසාධක අරමුදල සඳහා සාමාජිකයන් ලියාපදිංචි කිරීම**

සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් ආවරණය වන සියලු සේවකයින් වෙත අංක ලබා දී ඔවුන් අරමුදලේ ලියාපදිංචි කරවීම දෙපාර්තමේන්තුව යටතේ සිදුවේ. ඒ අනුව 2019 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ සාමාජික සංඛ්‍යාව 532,107ක් වන අතර මේ වන විට සක්‍රීය සාමාජික ගිණුම් මිලියන 2.52ක් මහ බැංකුවේ පවතී.

දායක මුදල් නිසි පරිදි නොගෙවන සේවා යෝජකයන් සඳහා ප්‍රථම නිවේදන හා රතු නිවේදන නිකුත් කෙරෙන අතර ඒ සඳහා ප්‍රතිචාර නොදක්වන්නේ නම් නීති මඟින් කටයුතු කර දායක මුදල් හා අධිභාර අයකර ගිණුම් ගත කරනු ලැබේ. 2019 වර්ෂයේ දී පළමු නිවේදන 20,436ක් නිකුත් කිරීම මඟින් රුපියල් මිලියන 8,226ක මුදලක්ද රතු නිවේදන 13,756ක් නිකුත් කිරීම මඟින් රුපියල් මිලියන 5,559ක මුදලක් ද අයකර ගෙන ඇත.

- **සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම**

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් හා දිවයින පුරා පිහිටි දිස්ත්‍රික් කම්කරු කාර්යාල 35කින් හා උප කම්කරු කාර්යාල 12කින් මෙම සේවය ලබාගැනීමේ පහසුකම් සලසා ඇති අතර 2019 වර්ෂය තුළ ප්‍රතිලාභ ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව පහත පරිදි වේ. එහි දී රු.මි. 126,042ක මුදලක් ගෙවීම් කර ඇත.

| | කරුණ | 2019 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | සිට දෙසැම්බර් දක්වා තීරණ ලිපි (DL) යැවූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | විශ්‍රාම වයසට එළඹී සේවයෙන් ඉවත්වූ පසු සේ.අ.අ. ප්‍රතිලාභ ගෙවීම | 92,125 | 90,216 |
| 02 | විවාහ හේතුමත සේවයෙන් ඉවත්වූ කාන්තා සාමාජිකාවන්ට ප්‍රතිලාභ ගෙවීම | 22,333 | 21,895 |
| 03 | පූර්ණ දුබලතාවයට පත්වීම නිසා සේවයෙන් ඉවත්වීම හේතුවෙන් ප්‍රතිලාභ ගෙවීම | 1,316 | 1,294 |
| 04 | මියගිය සාමාජික ප්‍රතිලාභ | 5,621 | 4,978 |
| 05 | 30% විශ්‍රාම පූර්ව ප්‍රතිලාභ | 28,199 | 27,811 |
| 06 | විදේශ රටක ස්ථිර පදිංචියට යෑම නිසා ප්‍රතිලාභ ගෙවීම | 2,808 | 2,777 |
| 07 | රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් ලැබීම නිසා සේවයෙන් ඉවත්වීම හේතුවෙන් ප්‍රතිලාභ ගෙවීම | 9,267 | 9,057 |
| 08 | රාජ්‍ය සංස්ථාවක් /මණ්ඩලයක් වසා දැමීම, වියදම් අඩුකිරීමට සේවකයන් ඉවත්කිරීම හෝ සමාගමක් බවට පරිවර්තනය කිරීම හේතුවෙන් සේවය හැරගිය සේවකයන්ට ප්‍රතිලාභ ගෙවීම | 58 | 57 |

වගුව 2.2.1.8.ප්‍රතිලාභ අයදුම්පත් ලැබීම් හා තීරණ ලිපි ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යැවීම් - 2019

- **අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය**

සේවක අර්ථසාධක අරමුදල යටතේ අනුමත අර්ථසාධක අරමුදල් පවතින ආයතන 123ක් ලියාපදිංචිව ඇති අතර, සමස්ත සාමාජික සංඛ්‍යාව 134,456කි. එම අරමුදල්වල දායක මුදල් බැර කිරීම, ප්‍රතිලාභ ගෙවීම ඇතුලුව ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කරමින් නිසි ලෙස ක්‍රියාත්මක නොවන අරමුදල් අධිකරණ ක්‍රියාවලිය තුළින් සේවක අර්ථසාධක අරමුදල යටතට පවරා ගනු ලැබේ.

| | |
|---|---|
| ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව | 85 |
| විසඳී ගොනු පියවා ඇති පැමිණිලි සංඛ්‍යාව | 89 |
| ක්ෂේත්‍ර නිලධරයන් විසින් අධීක්ෂණය කරන ලද පු.අ.අ. සම්බන්ධ වාර්තා සංඛ්‍යාව | 197 |
| අධීක්ෂණය සිදු කොට ඇති ආයතන සංඛ්‍යාව | 123 |

වගුව 2.2.1.9. අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය ප්‍රගතිය - 2019

- **අරමුදල ප්‍රවර්ධනය**

  අරමුදලෙහි පරිපාලනය වඩාත් සඵලවත් කරගනිමින් සාමාජික ජීවන තත්වය උසස් කර ගැනීමෙහිලා පහත කාර්යයන් ඉටු කරනු ලැබේ.

- **සේවක අර්ථසාධක අරමුදලෙහි ගිණුම් ශේෂය මත පදනම්ව නිවාස ණය ලබා දීම**

  සාමාජිකයන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් සේවක අර්ථසාධක අරමුදල් ගිණුම් ශේෂය ඇපයට තබා 75% ක් උපරිමයක් දක්වා නිවාස ණය ලබා ගැනීමේ පසුකම සලසා ඇත. ඒ අනුව වර්ෂය තුළ නිවාස ණය ඉල්ලීම් 10,022ක් සඳහා අනුමැතිය ලබා දී ඇත. අනුමැතිය ලබා දී ඇති මුදල රු.බිලියන 5.10කි.

- **සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රවර්ධනය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

  සේවා සේවක දෙපාර්ශවය තුළ සේවක අර්ථසාධක අරමුදල පිළිබඳව ඇති දැනුවත්භාවය වර්ධනය කිරීම හා ලියාපදිංචිය පුළුල් කිරීමේ අරමුණින් රූපවාහිනී සහ පුවත්පත් දැන්වීම් ප්‍රචාරණය කිරීමට කටයුතු කරන ලදී. තවද දිවයින පුරා සියලුම පළාත් ආවරණය වන පරිදි ජංගම සේවා වැඩසටහන් 16ක් පවත්වන ලද අතර එමඟින් ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව 965කි.

- සාමාජික තොරතුරුවල විෂමතා නිවැරදි කිරීම සඳහා සලසා තිබූ සේවය විමධ්‍යගත කිරීම තුළින් කාලය, ශ්‍රමය හා මුදල් ඉතිරි කර ගනිමින් තම අවශ්‍යතා ඉටු කරගැනීමේ පහසුව සාමාජිකයන් වෙත සලසා ඇත.
- අධීක්ෂණ දත්ත පද්ධතිය හා ගෙවීම් දත්ත පද්ධතියට ප්‍රවේශ අවස්ථා වර්ධනය කිරීම හා ජාල සම්බන්ධතා පුළුල් කිරීම මඟින් සපයනු ලබන සේවාවන්හි කාර්යක්ෂමතාව වැඩි කිරීමටත් ප්‍රධාන කාර්යාලය වෙත පැමිණෙන සාමාජික ප්‍රමාණය සීමා කිරීමටත් හැකිවිය.

### 2.2.1.6 ශ්‍රමිකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරැකීම සඳහා නෛතික රැකවරණය

ශ්‍රමිකයන්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සඳහා දෙපාර්තමේන්තුව විසින් විවිධ පනත් ගණනාවක් ක්‍රියාත්මක කරනු ලබයි. මෙහිදී ව්‍යවස්ථාපිත හිමිකම් ශ්‍රමිකයන් වෙත ලබා දීම සඳහා අවශ්‍ය මූලික නෛතික පියවර ගන්නා ලද නමුත් එකඟතාවයක් ඇති නොවන අවස්ථාවලදී අයිතිවාසිකම් උල්ලංඝනය වීම් වැළැක්වීමටත් අයිතිවාසිකම් බලාත්මක කිරීමටත් අධිකරණය වෙත කරුණු ඉදිරිපත් කිරීම මඟින් සේවකයා වෙත යුක්තිය ඉටු කර දීමට ක්‍රියාමාර්ග ගනු ලබයි.

| | පනත | ගොනු කළ නඩු සංඛ්‍යාව | අවසන් නඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | සේවක අර්ථසාධක අරමුදල් පනත | 2,546 | 1,288 |
| 02 | පාරිතෝෂිත පනත | 1,143 | 726 |
| 03 | පඩි පාලක සභා ආඥා පනත | 156 | 53 |
| 04 | සාප්පු හා කාර්යාල සේවක පනත | 52 | 33 |
| 05 | කාර්මික අවුල් පනත | 21 | 8 |
| 06 | කම්කරු විනිශ්චය සභා නියෝග | 62 | 40 |
| 07 | සේවය අවසන් කිරීමේ පනත | 3 | 2 |
| 08 | කාන්තාවන් හා ළමයින් සේවයේ | 1 | 2 |
| 09 | ප්‍රසූතිකාධාර ආඥා පනත | 0 | 1 |
| 10 | අයවැය සහන දීමනා පනත | 82 | 48 |
| 11 | අනුමත අර්ථසාධක අරමුදල් පනත | 0 | 0 |

සටහන - දැනට ලැබී ඇති දත්ත අනුව ඉහත වගුව සකස් කර ඇති බැවින් මෙම දත්ත වෙනස් විය හැකිය

වගුව 2.2.1.10. සියලුම දිස්ත්‍රික් කාර්යාල මගින් පවරන ලද සහ විසඳී ඇති නඩු - 2019

| අධිකරණය | 2019 වර්ෂයට ඉදිරියටගෙන ආ ශේෂය | 2019 වර්ෂයේදී අවසන් කරන ලද නඩු |
|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 205 | 0 |
| අභියාචනාධිකරණය | 383 | 2 |
| මහාධිකරණ | 178 | 46 |
| දිසා අධිකරණ සහ වාණිජ මහාධිකරණ | 216 | 17 |

වගුව 2.2.1.11. අධිකරණ අනුව නඩුවල කාර්යසාධනය - 2019

### 2.2.1.7. පරිපාලනය හා ඉදිකිරීම් කටයුතු

### I. පරිපාලනය

කාර්යය මණ්ඩලය ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාම තුළින් දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීම පහසු වේ.

ඒ අනුව, දෙපාර්තමේන්තුව විසින් සෑම වර්ෂයකම සිදු කරනු ලබන දෙපාර්තමේන්තුවේ මානව සම්පත් අවශ්‍යතාව සම්පූර්ණ කිරීම, සේවකයන්ගේ සේවය ස්ථිර කිරීම, කාර්යසාධනය ඇගයීම, වැටුප් වර්ධක ලබා දීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග නියමිත කාලය තුළ පැවැත්වීම, ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාවට නැංවීම යන කටයුතු සහ දෛනික පාලන කටයුතු 2019 වර්ෂයේදී ද කාර්යක්ෂමව සිදු කරන ලදී. එම කටයුතුවලට අතිරේකව පරිපාලන කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා 2019 වර්ෂයේ දී පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- දෙපාර්තමේන්තුවේ සියලුම නිලධරයන්ට පණිවුඩ, සිහි කැඳවීම් සහ හදිසි නිවේදන දැනුම් දීම සඳහා කෙටි පණිවුඩ සේවාවක් ආරම්භ කිරීම.
- දෙපාර්තමේන්තුවේ සියලුම නිලධරයන්ගේ පෞද්ගලික ලිපි ගොනුවල ඇතුළත් තොරතුරුවල සංක්ෂිප්තයක් ඇතුළත් කර Google Drive සහ දත්ත පද්ධතියක් සකස් කරන ලද අතර මෙමඟින් කාර්යමණ්ඩලය යාවත්කාලීන කිරීම Google Drive භාවිතයෙන් සිදු කිරීමට සහ නිවැරදි තොරතුරු දෛනිකව ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.
- කම්කරු මහලේකම් කාර්යාල පරිශ්‍රයේ දෛනිකව එකතු වන කසල විධිමත්ව බැහැර කිරීම, කසල ප්‍රතිචක්‍රීකරණය සහ කසල පරිසරයට මුදා හැරීම අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

### II. ඉදි කිරීම්

දිවයින පුරා විසිරී සිටින කම්කරු ජනතාවට වඩාත් කාර්යක්ෂම සේවයක් සලසාලීම අරමුණු කර ගනිමින් දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක් පාසාම දිස්ත්‍රික් කම්කරු කාර්යාල ස්ථාපනය කර ඇත. එම කාර්යාල වඩාත් නවීන පහසුකම් ඇති ව ඉදිකිරීම මඟින් සේවාලාභීන්ට තෘප්තිමත් සේවයක් ලබා ගැනීමට හැකි වනවා මෙන්ම හිතකර වැඩ පරිසරයක් නිර්මාණය කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ට ඵලදායි සේවයක් ලබා දීමට ද අවස්ථාව හිමිවේ.

ඒ අනුව, 2019 වර්ෂයේ දී කුරුණෑගල, පුත්තලම, මීගමුව සහ යාපනය දිස්ත්‍රික් කම්කරු කාර්යාලයන්හි යටිතල පහසුකම් සංවර්ධනය කරන ලදී. ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතින අම්බලන්ගොඩ, නාවුල, හැටන් සහ බදුල්ල යන කම්කරු කාර්යාලයන්හි වර්ෂයට අදාළ ඉදි කිරීම් කටයුතු සිදු කරන ලදී. එසේම, අනුරාධපුර සහ මහියංගණය දිස්ත්‍රික් කම්කරු කාර්යාලයන්හි ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලදී.

දෙපාර්තමේන්තු භූමියෙහි ඉදි කරන ලද 'මෙහෙවර පියෙස' ගොඩනැගිල්ල අතිගරු ජනාධිපතිතුමන්ගේ සුරතින් විවෘත කිරීම 2019 වර්ෂයේ දී සිදු කරන ලදී.



ඡායාරූපය 2.2.1.3.'මෙහෙවර පියෙස' ගොඩනැගිල්ල අතිගරු ජනාධිපතිතුමන් විසින් 2019 අගෝස්තු 20 වන දින විවෘත කිරීම

### III. පුස්තකාලය සහ තොරතුරු සේවාව

දෙපාර්තමේන්තුවේ සේවකයන්ට සහ පොදු මහජනතාවට කම්කරු ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් පුස්තකාලයක් පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව, පාඨකයන්ගේ දැනුම, අවබෝධය සහ රසාස්වාදය උදෙසා පොත් හා සඟරා 216ක් වර්ෂය තුළ දී අළුතින් මිලදී ගැනීමට කටයුතු කර ඇත.

### 2.2.1.8. මූල්‍ය කළමනාකරණය

2019 වාර්ෂික අයවැය මඟින් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරන ලද මූල්‍ය සම්පත් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව, කාර්යක්ෂමව, ඵලදායීව හා පිරිමැසුම්දායීව පරිපාලනය කිරීමට දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

ඒ අනුව, 2019 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත වාර්ෂික අයවැය මඟින් වෙන්කරන ලද පුනරාවර්තන ප්‍රතිපාදනයන්ගෙන් 82%ක ප්‍රතිශතයක්ද ප්‍රාග්ධන ප්‍රතිපාදනවලින් 98%ක ප්‍රතිශතයක්ද දෙපාර්තමේන්තුව විසින් සිය ක්‍රියාකාරකම් සඳහා කාර්යක්ෂමව යොදවා ඇත.

| | | |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | ප්‍රතිපාදනය (රු) | 2,207,000,000 |
| | වියදම (රු) | 1,801,245,439 |
| ප්‍රාග්ධන වියදම් | ප්‍රතිපාදනය (රු) | 1,522,010,000 |
| | වියදම (රු) | 1,307,883,464 |

වගුව 2.2.1.12. 2019 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ සමස්ත මූල්‍ය ප්‍රගතිය

| වියදම් වර්ගය | 2019 අයවැය ප්‍රතිපාදන | 2019 සත්‍ය වියදම | සත්‍ය වියදම ප්‍රතිපාදනයන්ගෙන් ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම | 58,490,000 | 41,965,156 | 71.7% |
| ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 1,447,920,000 | 1,252,189,466 | 86.5% |
| එකතුව | 1,506,410,000 | 1,294,154,621 | 85.9% |

වගුව 2.2.1.13. 2019 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් වර්ගීකරණය

### 2.2.1.9. සංඛ්‍යා ලේඛන කටයුතු

ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රයේ දිශානතිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම, ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, පවතින කම්කරු නීති සහ අණපනත් සංශෝධනය කිරීමේ අවශ්‍යතාව හඳුනා ගැනීම හා ක්ෂේත්‍රය පිළිබඳව අනාගත පුරෝකථනය සඳහා කම්කරු ක්ෂේත්‍රයට අදාළව දත්ත එක් රැස් කර විශ්ලේෂණය කිරීම දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අංශය විසින් සිදු කරනු ලැබේ.

ඒ අනුව, 2019 වර්ෂයේ දී පහත කාර්යයන් සිදු කරන ලදී.

| වැඩසටහන් / ක්‍රියාකාරකම | 2019 වසර තුළ සිදු කළ රාජකාරි |
|---|---|
| 1. වාර්ෂික රැකිරක්ෂා සමීක්ෂණය 2017 | මුද්‍රණයෙන් සහ වෙබ් අඩවිය මඟින් ප්‍රකාශයට පත්කිරීම |
| 2. වාර්ෂික රැකිරක්ෂා සමීක්ෂණය 2018 | වාර්තාව මුද්‍රණය සඳහා සූදානම් කිරීම |
| 3. කම්කරු සංඛ්‍යාති 2017 වාර්ෂික ප්‍රකාශනය | මුද්‍රණය සඳහා සූදානම් කිරීම |
| 4. කම්කරු සංඛ්‍යාති 2018 වාර්ෂික ප්‍රකාශනය | වගු සකස් කර අවසන් කිරීම |
| 5. වැඩකළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබඳ නව සමීක්ෂණය - ආරම්භය | ප්‍රශ්න නිර්මාණය සහ පූර්ව පරීක්ෂාව අවසන් කර ඇත |
| 6. වැඩකළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබඳ නව සමීක්ෂණය - 2019 (හතරවන කාර්තුව) | ප්‍රශ්නාවලිය සකස් කර අදාළ ආයතන වෙත තැපැල මඟින් යවා ඇත |
| 7. අවම වැටුප් අනුපාත දර්ශකාංකය ගණනය කිරීම | ගණනය කර ඉදිරිපත් කර ඇත. |
| 8. සේවක අර්ථසාධක අරමුදල් නව ලියාපදිංචි කිරීම් පරිගණක ගත කිරීම | මේ සඳහා දත්ත පද්ධතියක් නිර්මාණය කර ඇති අතර දත්ත ඇතුලත් කර යාවත්කාලීන කිරීමේ කාර්යය සිදු කිරීම |

වගුව 2.2.1.14. ඉටු කරනු ලැබූ කාර්යන්- 2019

### 2.2.1.10. දෙපාර්තමේන්තු කාර්යයන් අධීක්ෂණය මඟින් ඉලක්කයන් වෙත මෙහෙයවීම හා මානව සම්පත් සංවර්ධනය

#### I. දෙපාර්තමේන්තු කාර්යයන් අධීක්ෂණය මඟින් ඉලක්කයන් වෙත මෙහෙයවීම

කම්කරු දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කිරීම සඳහා සියලුම දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල හා දෙපාර්තමේන්තුවේ සියලු අංශ ක්‍රියාත්මක වන ආකාරය සහ ඉලක්ක කරා යොමු වීම අධීක්ෂණය මඟින් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ප්‍රවර්ධනය, ඉහළ දැමීම සඳහා අත්‍යවශ්‍ය කාර්යයක් වේ.

ඒ සඳහා, දෙපාර්තමේන්තුවේ 2019 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර සියලු අංශයන්හි ප්‍රගතිය මාසිකව සමාලෝචනය සඳහා මාසික රැස්වීම් පවත්වන ලදී.

එසේම, දිස්ත්‍රික්/උප කම්කරු කාර්යාල අධීක්ෂණය සඳහා පැවති ක්‍රමවේදය 2018 වර්ෂයේ දී වඩාත් විධිමත් වැඩසටහනක් ලෙස සකස් කරන ලද අතර 2019 වර්ෂයේ දී එම ක්‍රමවේදය තවදුරටත් සංවර්ධනය කරමින් සියලු දිස්ත්‍රික්/උප කම්කරු කාර්යාල ආවරණය කරමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. මෙම වැඩසටහනෙහි ප්‍රතිඵලයක් ලෙස කම්කරු නිලධරයන්ගේ ක්ෂේත්‍ර පරීක්ෂණයන්හි ගුණාත්මකභාවය වර්ධනය වීම, එම වාර්තාවන්හි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය වර්ධනය වීම, හිඟ සේවක අර්ථසාධක අරමුදල් අයකර ගැනීමේ කටයුතු කාර්යක්ෂම වීම, සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීමේ කටයුතු කාර්යක්ෂම වීම, පැමිණිලි විසඳීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම වීම, විවෘත වරෙන්තු සහිත නඩු හා අක්‍රිය නඩු සක්‍රිය කිරීමට හැකි සියලු පියවර ගැනීම සහ පොදු තැන්පත් ගිණුමේ තැන්පත් වන මුදල් අප්‍රමාදව ගෙවීම් කිරීමට පියවර ගැනීම දැක්විය හැකිය.

එසේම, සියලුම දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල පරීක්ෂා කර ඒ ඒ කාර්යාලයේ ප්‍රගතිය සම්බන්ධ විශ්ලේෂණාත්මක වාර්තා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කලාප මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී. එම ප්‍රගති සමාලෝචන රැස්වීම්වල දී එක් කාර්යාලයක් විසින් එක් කාර්යයක් සඳහා ඉහළ ප්‍රගති මට්ටමක් අත්කර ගෙන ඇතත් තවත් කාර්යයක් සඳහා අපේක්ෂිත මට්ටමක ප්‍රගතියක් අත්කර ගෙන නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව, ඉහත සියලු කාර්යයන් සම්බන්ධයෙන් ඉලක්ක සකස් කර එම ඉලක්ක කරා 2020 වර්ෂයේ දී ළඟා වීම සඳහා දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල මෙහෙයවීම පිළිබඳ කලාප භාර නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරු දැනුවත් කරන ලදී. ඒ අනුව, 2020 වර්ෂයේ දී සියලුම කාර්යාල හා නිලධාරීන් ඒ ඒ ඉලක්කයන් කරා ළඟාවී ඇත්ද යන්න හා ඒ අනුව කාර්යසාධනය මැනීම පිළිබඳව අවධානය යොමු කිරීමට හැකියාව ලැබේ.

## II. මානව සම්පත් සංවර්ධනය

දෙපාර්තමේන්තුව විසින් සපයන සේවාවල ගුණාත්මකභාවය තීරණය වනුයේ දෙපාර්තමේන්තු නිලධරයන් වෙත තම කාර්යභාරය පිළිබඳව පවත්නා දැනුම හා ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීමට ඇති අවබෝධය මතය. ඒ අනුව, දෙපාර්තමේන්තුව විසින් පුහුණුව ලබා දීමේ දී නිලධරයන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව සම්පත්දායකයන් ගෙන්වා පුහුණුව ලබා දීම මඟින් ද වෙනත් ආයතන විසින් පවත්වන පාඨමාලා සඳහා සහභාගී වීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම මෙන්ම විදේශ පුහුණුවීම් සඳහා යොමු කිරීමට අවස්ථා ලද විට ඊට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හා සම්බන්ධීකරණය සිදු කිරීම මඟින් මෙම පුහුණු කාර්යයන් සිදු කරනු ලැබේ.

| අ.අ. | වැඩසටහන | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ නිලධරයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | කම්කරු නීති පිළිබඳ පුහුණු වැඩමුළු | 04 | 298 |
| 02 | සේවක අර්ථසාධක අරමුදල් ක්‍රියාකාරකම් පිළිබඳ පුහුණු වැඩසටහන් | 18 | 1,023 |
| 03 | වෘත්තීය සෞඛ්‍ය සහ කර්මාන්තමය සුරක්ෂිතතාවය පිළිබඳ පුහුණු වැඩසටහන් | 02 | 100 |
| 04 | දෙමළ භාෂා පුහුණු වැඩසටහන | 01 | 30 |
| 05 | නවක සංවර්ධන නිලධරයන් සහ කළමනාකරණ සහකාර නිලධරයන් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන | 01 | 80 |
| 06 | නවක කාර්යාල කාර්ය සහයක සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන | 01 | 11 |
| 07 | රියදුරන් සඳහා පුහුණු වැඩසටහන | 01 | 80 |
| 08 | ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහය යටතේ පැවැත්වූ පුහුණු වැඩමුළු | 09 | 259 |
| 09 | **එකතුව** | **37** | **1,881** |

වගුව 2.2.1.15.දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් සඳහා සංවිධානය කර පවත්වන ලද පුහුණු වැඩසටහන් 2019

| අ.අ. | වැඩසටහන | ප්‍රතිපාදන ලබා දුන් නිලධරයන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | පශ්චාත් උපාධි | 20 |
| 2 | නීති උපාධි | 15 |
| 3 | සහතික පත්‍ර පාඨමාලා සහ වැඩමුළු | 14 |
| | **එකතුව** | **49** |

වගුව 2.2.1.16. බාහිර පුහුණු ආයතන්හි පුහුණු සඳහා දෙපාර්තමේන්තු නිලධරයන් වෙත ප්‍රතිපාදන ලබා දීම 2019



ඡායාරූපය 2.2.1.4.සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය විසින් සංවිධානය කර පවත්වන ලද පුහුණු වැඩසටහනක්

| වැය ශීර්ෂය | 2019 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු) | 2019.12.31 දිනට වියදම (රු) | 2019.12.31 දිනට ශේෂය (රු) | වියදම ප්‍රතිපාදනයන්ගේ ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|---|
| 221-01-01-2401 | 5,600,000.00 | 5,592,044.00 | 7,956.00 | 99.86% |
| 221-02-02-2401 | 160,000.00 | 155,177.00 | 4,823.00 | 96.99% |
| 221-02-03-2401 | 560,000.00 | 535,610.00 | 24,390.00 | 95.64% |
| 221-02-04-2401 | 2,250,000.00 | 2,149,411.37 | 100,588.63 | 95.53% |
| **එකතුව** | **8,570,000.00** | **8,432,242.37** | **137,757.63** | **97.01 %** |

වගුව 2.2.1.17. ධාරිතා වර්ධන ක්‍රියාකාරකම් සඳහා 2019.12.31 දිනට සමස්ත වියදම- 2019

### 2.2.1.11. සේවා සැපයීම සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම

සේවාලාභීන්ට සේවය ලබා දීමේ දී තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් පරිගණක පද්ධති ඔස්සේ එම සේවා ලබා දීම මගින් සේවය ලබාදීමේ පහසුව වැඩි දියුණු කිරීම කෙරෙහි දෙපාර්තමේන්තුව දැඩි අවධානය යොමු කර ඇත. මේ වන විට සේවක අර්ථසාධක අරමුදල ක්‍රියාත්මක කිරීම සඳහා පරිගණක පද්ධතියක් භාවිතා වන අතර ආයතන (ශ්‍රමික) පරීක්ෂණවල දත්ත රැස් කිරීම, ඒ මගින් ආයතන පරීක්ෂණවල ක්‍රියාකාරී මට්ටම අධ්‍යයනය හා සිදුකළ යුතු වැඩි දියුණු කිරීම් හා කළමනාකරණ තීරණ ගැනීම සඳහා LISA (Labour Inspection System Application) දත්ත පද්ධතිය 2015 වසරේ සිට ක්‍රියාත්මකව පවතින අතර තව දුරටත් වැඩි දියුණු කිරීම් කළ යුතුව පවතී.

මෙම පරිගණක පද්ධති දෙකම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර ක්‍රියාවලිය පහසු කිරීම සඳහා සකසා තිබුණ ද සේවාලාභීන් සමඟ ඍජු සබඳතා පැවැත්වීම සඳහා වැඩි දියුණු කළ යුතුව ඇත. එමගින් තම ජංගම දුරකථනය ඔස්සේ තම සේවා අවශ්‍යතා සලසා ගැනීම සඳහා සම්බන්ධ වීමට අවශ්‍ය පහසුකම් සැපයීම ආරම්භ කිරීම අරමුණු කොට මූලික සාකච්ඡා සිදු කරමින් පවතී.

මේ හැරුණු කොට මහජනතාවට සේවා ලබා ගැනීමට අවශ්‍ය අයදුම්පත් ආකෘති හා පනත්, සේවා යෝජකයින් විසින් අවධානය යොමු කළ යුතු පඩි පාලක සභා තීරණ ආදී අවශ්‍ය ලේඛන බාගත කරගත හැකි පරිදි දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි පළ කර ඇත.

ඒ අනුව, 2019 වසරේ දී වෙබ් අඩවිය හරහා දෙපාර්තමේන්තුව විසින් සපයන ලද සේවා පහත පරිදි වේ.

| අ.අ. | දිනය | සේවාව | ඉලක්කගත කණ්ඩායම |
|---|---|---|---|
| 01 | 2019 වර්ෂය පුරා | ● දෙපාර්තමේන්තු ප්‍රතිලාභීන් වෙත අවශ්‍ය වන සියලු ආකෘති පත්‍ර භාෂා ත්‍රිත්වයෙන්ම බාගත කරගත හැකි පරිදි පළ කිරීම<br>● සංඛ්‍යාලේඛන තොරතුරු කම්කරු සංඛ්‍යාති, වාර්ෂික රැකි රක්ෂා සමීක්ෂණ, වාර්ෂික වාර්තා ආදී (භාෂා ත්‍රිත්වයෙන්ම බාගත කරගත හැකි පරිදි පළ කිරීම) | අභ්‍යන්තර හා බාහිර සේවාලාභීන් |
| 02 | 2019 වර්ෂය පුරා | වෙබ් අඩවියෙහි ඇතුළත් කර පවතින තොරතුරු යාවත්කාලීන කිරීම<br>● ප්‍රධාන කාර්යාලයේ අංශ මඟින් සපයන සේවා<br>● සියලු කම්කරු කාර්යාලයන්හි ඇමතුම් තොරතුරු<br>● නීති අසන පැන සහ විසඳුම් | අභ්‍යන්තර හා බාහිර සේවාලාභීන් |
| 03 | 2019 වර්ෂය පුරා | දෙපාර්තමේන්තුවේ විවෘත හා සීමිත විභාග තොරතුරු හා ප්‍රතිඵල, විදේශ ශිෂ්‍යත්ව, ලංසු කැඳවීම්, පුහුණු වැඩසටහන්, බඳවාගැනීමේ පරිපාටි. කම්කරු අණපනත් හා අති විශේෂ ගැසට් පත්‍ර, දෙපාර්තමේන්තු චක්‍රලේඛ, දෙපාර්තමේන්තු නිලධරයන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල, වෘත්තීය සමිති ලේඛනය ආදී තොරතුරු පළ කිරීම | අභ්‍යන්තර හා බාහිර සේවාලාභීන් |
| 04 | 2019.11.29 | කම්කරු දෙපාර්තමේන්තුවේ සංචාරක බංගලා සම්බන්ධ විස්තර ඇතුලත් කිරීම | අභ්‍යන්තර හා බාහිර සේවාලාභීන් |

වගුව 2.2.1.18. වෙබ් අඩවිය හරහා දෙපාර්තමේන්තුව විසින් සපයන ලද සේවා - 2019

### 2.2.1.12. අභ්‍යන්තර විගණනය

අනෙකුත් සියලුම රාජ්‍ය ආයතන මෙන්ම කම්කරු දෙපාර්තමේන්තුව විසින් ද සිය සියලු ක්‍රියාකාරකම් මුදල් රෙගුලාසි, රජය විසින් කලින් කලට නිකුත් කරන ලද චක්‍රලේඛ සහ දෙපාර්තමේන්තුව විසින්ම නිකුත් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව විධිමත් පරිදි සිදු කළ යුතු වේ. ඒ අනුව එම කටයුතු සම්පත්වල ඉහළ උපයෝගිතාවයක් සහිතව මනා විනිවිදභාවයකින් සහ ප්‍රශස්ත මට්ටමින් සිදුවේද යන්න අධීක්ෂණය කම්කරු කොමසාරිස් ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ සිදු වේ. ඒ අනුව, 2019 වර්ෂයේ දී සිදු කරන ලද කාර්යයන් පහත පරිදි වේ.

- 2019 වර්ෂයේ දී අභ්‍යන්තර විගණන අංශය විසින් වර්ෂයට අදාළව සකස් කරන ලද විගණන සැලැස්ම අනුව දිස්ත්‍රික් කම්කරු කාර්යාල 06ක් සහ එක් කලාප කම්කරු කාර්යාලයක්ද ප්‍රධාන කාර්යාලයේ වැටුප් අංශය ද පරීක්ෂා කරන ලදී.

- රජයේ විගණන අංශය මඟින් දෙපාර්තමේන්තුවේ විවිධ කාර්යාල පරීක්ෂා කර නිකුත්කර තිබූ විගණන විමසුම් 28ක් සඳහා පිළිතුරු සපයන ලදී.

- වර්ෂය තුළ කාර්තුමය වශයෙන් විගණන හා කළමනාකරණ රැස්වීම් 04ක් පවත්වන ලදී.

2.2.2.

# මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

2010.02.12 දිනැති අංක 1640/31 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව මිනිස්බල හා රැකීරක්‍ෂා දෙපාර්තමේන්තුව 2010 වසරේදී කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදි. වර්තමානයේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තුව වෙත රාජ්‍ය රැකියා සේවාවන් පවත්වාගෙන යාම හා ජාතික මානව සම්පත් හා රැකියා ප්‍රතිපත්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ වගකීම ද පැවරී ඇත.

**දැක්ම**

ලෝක මට්ටමේ ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්

**මෙහෙවර**

පුළුල් නිපුණතාවයෙන් යුත්, ක්‍රියාශීලී සහ ගෝලීය වශයෙන් තරඟකාරී ශ්‍රම බලකායක් ගොඩනැගීම සහ අපේ මානව සම්පත්වල මුළු ශක්තිය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා යොදා ගැනීම

### 2.2.2.1 දෙපාර්තමේන්තුවේ අරමුණු

ඉහත ඉලක්කයන් ඉටුකරගැනීම බලපැවැත්වන්නේ පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම තුළිනි.


- ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය සකස් කර වැඩසටහන් ක්‍රියාත්මක කිරිම
- කුසලතා නොගැලපීම යන ව්‍යුහාත්මක සේවා වියුක්ති ගැටළුව විසඳීම
- වර්තමාන ශ්‍රම බලකායට අයත් සහ අනාගතයේ ශ්‍රම වෙළඳපොළට එක්වීමට නියමිත සියලුම ශ්‍රී ලාංකිකයන් හට නිවැරදි වෘත්තීය දිශානතිය නිශ්චය කරගැනීම සඳහා පහසුකම් සැලසීම
- මිනිස්බල සැලසුම් කිරීම යන සංවර්ධනය හා පුරෝකථනය
- අවිධිමත් අංශය සංවර්ධනය
- පෞද්ගලික අංශයේ රැකියා සඳහා රැකියා අපේක්ෂකයින් පෙළඹවීම
- නිදහස් රාජ්‍ය රැකියා සේවය ලබාදීම
- අවධානමට ලක් වූ කණ්ඩායම්, ආබාධිත පුද්ගලයන් හා ඌණ සංවර්ධිත ප්‍රදේශවල වෙසෙන පුද්ගලයන් සඳහා මිනිස්බල හා සේවා නියුක්තිය ආශ්‍රිත පහසුකම් සැපයීම
- ගෝලීය හා දේශීය වශයෙන් නිවැරදි ශ්‍රම වෙළඳපොළ තොරතුරු සියලුම ශ්‍රී ලාංකිකයන්ට ලබාදීම
- දේශීය හා ගෝලීය ශ්‍රම වෙළඳපොළ නැමියාවන් පුරෝකථනය

### 2.2.2.2. 2019 දෙසැම්බර් 31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| | 2019 අයවැය ප්‍රතිපාදනය (රු.000) | 15% අඩු කිරීම | 10% අඩු කිරීම | 2019 අයවැය ප්‍රතිපාදන 25% අඩු කිරීමෙන් පසු | වියදම (රු.000) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 387,000 | - | - | 387,000 | 374,398 | 96.74% |
| ප්‍රාග්ධන වියදම් | 35,000 | 5,250 | 1,975 | 27,775 | 25,459 | 91.66% |
| එකතුව | 422,000 | | | 414,775 | 399,857 | 96.40% |

වගුව 2.2.2.1. 2019 දෙසැම්බර් 31 දක්වා මූල්‍ය ප්‍රගතිය

### 2.2.2.3. රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශනය





රූපසටහන 2.2.2.1. රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු

## 2.2.2.4. මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශය

### I. ජාතික රැකියා කේන්ද්‍රය

මෙම අංශය මිනිස්බල සැලසුම්,සංවර්ධන හා පර්යේෂණ අංශය යටතේ ක්‍රියාත්මක වේ. දිවයිනේ දිස්ත්‍රික්ක 25ක ම දිස්ත්‍රික් රැකියා කේන්ද්‍රය (Job Centre/ PES) ක්‍රියාත්මක වේ. ජාතික රැකියා කේන්ද්‍රය බත්තරමුල්ල කාර්යාල පරිශ්‍රයෙහි ස්ථාපිත කර ඇත.

රැකියා කේන්ද්‍ර ක්‍රියාවලිය




රූපසටහන 2.2.2.2. රැකියා කේන්ද්‍ර ක්‍රියාවලිය

රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම ක්‍රම කිහිපයකට සිදුවේ. ප්‍රාදේශීය මට්ටමේ මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් විසින් හා රැකියා පොළවල්, රැකියා කේන්ද්‍ර මධ්‍යස්ථාන හරහා ලබා දෙන තොරතුරු මඟින් මෙම තොරතුරු ලබා ගැනේ. මේ යටතේ රැකියා අපේක්ෂිතයන් දැනුවත් කිරීමේ මූලික වැඩසටහන් සංවිධානය කෙරේ.

දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට මාර්ගගත (online) රැකියා සේවා රැකියා සේවා සැපයීමේ අන්තර්ජාල බිහිදොර මඟින් ද රැකියා අපේක්ෂිතයන්ට හා ලියාපදිංචි විය හැකි අතර සේවා යෝජකයන්හට ද මෙහි ලියාපදිංචි වී තම අවශ්‍යතා අනුව පුරප්පාඩු සඳහා රැකියා අපේක්ෂිතයන් තෝරා ගත හැක.(www.dome.gov.lk)

එසේම රැකියා අපේක්ෂිතයන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය, පුහුණුව සඳහා යොමු කිරීම, Career Me ආයතනය විසින් පහසුකම් සපයන පෞරුෂත්ව පුහුණු වැඩසටහන් සඳහා නොමිලේ පෙනී සිටීමට අවශ්‍ය පහසුකම් සපයා ඇත. මෙයට අමතරව විවිධ නිපුණතාවයක් සහිත වෘත්තිකයන් සඳහා සිය සේවාවන්

දෙපාර්තමේන්තු අන්තර්ජාල බිහිදොර මගින් ලියාපදිංචි වී ලබා දීමටත් එම සේවා අවශ්‍ය පිරිස සඳහා අන්තර්ජාලය මගින් තම පදිංචි ප්‍රදේශ අනුව සේවා සපයන්නන් තෝරා ගැනීමටත් අවස්ථාව සලසා ඇත.

ඉහත දැක්වූ මෙම සේවා ජංගම දුරකථන ආශ්‍රිත යෙදවුමක් (Mobile App.) මගින් ලබා ගැනීමටත් හැකියාව ඇතිවන පරිදි මෘදුකාංග සංවර්ධනය කර ඇත. උක්ත දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හා ඒ ආශ්‍රිත සංවර්ධනය පිළිබඳ කෙටි ව්‍යාපෘති දෙකක් සඳහා ලෝක කම්කරු සංවිධානය (ILO) මගින් අනුග්‍රහය දක්වා ඇත.



ඡායාරූපය 2.2.2.1. කෑගල්ල දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහනෙහි අවස්ථාවක්

## II ශ්‍රම වෙළඳපළ තොරතුරු ඒකකය

ශ්‍රම වෙළඳපළ තොරතුරු විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා මෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යාපන වැඩසටහන්, පුහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන් සම්පාදකයන් සඳහා ද අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ කාලීන හා සංවර්ධන අවශ්‍යතාවන්ට සරිලන ලෙස ශ්‍රම වෙළඳපළ පර්යේෂණ හා සමීක්ෂණ පැවැත්වීම, ශ්‍රම ඉල්ලුම හා සැපයුම පිළිබඳ අධ්‍යයන සිදු කිරීම හා එම තොරතුරු බෙදා හැරීම ශ්‍රම වෙළඳපළ ඒකකයෙන් සිදුකරයි. ශ්‍රම වෙළඳපොළ තොරතුරු සඟරාව හා පාසල් පාදක දත්ත අත්පොත මේ මගින් ප්‍රකාශයට පත්කරනු ලබයි.

## III ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්ති ඒකකය

මෙම ඒකකය මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශය යටතේ ක්‍රියාත්මක වේ. 2017 වර්ෂයේ දී ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය හා සම්බන්ධව කරන ලද ප්‍රගතිය වර්තමාන රජයේ මධ්‍යකාලීන සංවර්ධන ප්‍රතිපත්ති රාමුවට අනුකූලව නැවත සංශෝධනය කරන ලදී. එම සංශෝධිත ප්‍රතිපත්තිය සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ඇති අතර සියලුම අදාළ අමාත්‍යාංශවල මධ්‍යකාලීන ක්‍රියාකාරී සැලසුම් අනුව ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ සම්බන්ධීකරණය හා ප්‍රගති ඇගයුම් හා වාර්තාකරණය මෙම ඒකකය මගින් සිදු කරනු ලබයි. මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ සම සභාපතිත්වය කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය යන අමාත්‍යාංශ දෙක මගින් දරන ලදී.

| | වැඩසටහන/ ක්‍රියාකාරකම | 2019 වසර සඳහා වූ ඉලක්ක | | 2019/01/01 දින සිට 2019/12/31 දක්වා ප්‍රගතිය | | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය (රු.මි.) | භෞතික | මූල්‍ය (රු.මි.) | |
| රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය | | | | | | |
| 1 | අ.පො.ස සාමාන්‍ය පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 1865 | 1.100 | 2023 | 1.180 | 58,455 |
| 2 | අ.පො.ස උසස් පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 1328 | 1.240 | 1289 | 1.304 | 40,108 |
| 3 | ස්වයං රැකියා පෙළඹවීම් වැඩසටහන | 311 | 0.777 | 407 | 0.714 | 14,329 |
| 4 | වෘත්තීය අභියෝග ජය ගැනීම | 50 | 0.275 | 53 | 0.227 | 2,108 |
| 5 | උපාධි අපේක්ෂිතයන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන අභ්‍යන්තර / බාහිර | 15 | 0.567 | 11 | 0.408 | 459 |
| 6 | ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 15 | 0.428 | 24 | 0.379 | 901 |
| 7 | දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන | 311 | 0.817 | 435 | 0.808 | 20,437 |
| 8 | හසර සඟරාව මුද්‍රණය | 2 | 0.360 | 2 | 0.344 | - |
| 9 | ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 20 | 0.455 | 26 | 0.485 | 798 |
| 10 | ප්‍රාදේශීය රැකියා පොළ වැඩසටහන | 120 | 0.840 | 129 | 1.038 | 13,943 |
| 11 | අවශ්‍යතා මත පුහුණු වැඩසටහන | 200 | 1.400 | 172 | 0.972 | 4,874 |
| 12 | උද්‍යාන අලංකරණ වැඩසටහන | 3 | 0.110 | 3 | 0.100 | 103 |
| 13 | ලක් රැකියා හරසර වැඩසටහන - I | 100% | 2.000 | 100% | 1.703 | - |
| | ලක් රැකියා හරසර වැඩසටහන - සුනිසි මෙහෙවර | 100% | 1.000 | 100% | 0.609 | - |
| මිනිස්බල සැලසුම් සංවර්ධන හා පර්යේෂණ අංශය | | | | | | |
| 14 | ආංශික අධ්‍යයනයන් - Sectoral Studies | 26 | 0.400 | 23 | 0.087 | - |
| 15 | මාසික වාර ප්‍රකාශන - Monthly LMI News letter | 5 | 0.200 | 4 | 0.114 | - |
| 16 | ශ්‍රම වෙළඳපොළ තොරතුරු තැටිය (bulletin CD) | 100% | 0.130 | 100% | 0.085 | - |
| 17 | ශ්‍රම වෙළඳපොළ තොරතුරු සඟරාව Annual LMI Bulletine | 100% | 0.200 | 100% | 0.202 | - |
| 18 | ශ්‍රම වෙළඳපොළ සම්මේලනය (LMI forum) | 100% | 0.030 | 45% | - | - |
| 19 | සමාජ ආර්ථික දත්ත අත්පොත (Socio - Economic Data Hand book) | 100% | 1.000 | 100% | 0.795 | - |
| 20 | Development of LMIS | 100% | 1.000 | 85% | 0.873 | - |
| 21 | Periodic Reports on demand | 100% | 0.040 | 20% | - | - |

| | වැඩසටහන/ ක්‍රියාකාරකම | 2019 වසර සඳහා වූ ඉලක්ක | | 2019/01/01 දින සිට 2019/12/31 දක්වා ප්‍රගතිය | | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය (රු.මි.) | භෞතික | මූල්‍ය (රු.මි.) | |
| **<u>මහජන රැකියා සේවා මධ්‍යස්ථානය</u>** | | | | | | |
| 22 | දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම හා ආරම්භ කිරීම | 3 | 0.750 | 1 | 0.232 | - |
| 23 | දිස්ත්‍රික් රැකියා පොළ පැවැත්වීම | 12 | 1.750 | 11 | 1.891 | 11,935 |
| 24 | රැකියා අපේක්ෂිතයන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 300 | 1.500 | 408 | 1.357 | 16,865 |
| 25 | මහජන රැකියා සේවා මධ්‍යස්ථාන පවත්වාගෙන යාම | | 0.450 | | 0.644 | |
| | 1.රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීම | 100,000 | | 90,550 | | 90,550 |
| | 2.රැකියා පුරප්පාඩු ලියාපදිංචි කිරීම | 39,600 | | 38,689 | | 38,689 |
| | 3.රැකියා ගැලපීම | | | 31,343 | | 31,343 |
| | 4.රැකියා ගත කිරීම | 27,580 | | 14,832 | | 14,832 |
| 26 | හාම්පුතුන් සමඟ කතිකාවත - Conducting of Employer Forums | 8 | 0.400 | 4 | 0.155 | 159 |
| 27 | WAPES Membership - ලෝක මහජන රැකියා සේවා සංගමය | 100% | 0.650 | | 0.503 | - |
| 28 | අවශ්‍යතාවය අනුව පවත්වන විශේෂ වැඩසටහන් Tailormade Programmes for Companies and Job Seekers | 25 | 0.500 | 14 | 0.586 | 515 |
| **<u>කළමනාකරණ තොරතුරු පද්ධතිය - MIS</u>** | | | | | | |
| 29 | තෝරා ගත් දිස්ත්‍රික්ක සඳහා ක්ෂේත්‍ර නිලධාරින් වෙනුවෙන් ලැප්ටොප් යන්ත්‍ර මිලදී ගැනීම | 100% | 3.000 | 100% | 3.000 | - |
| **<u>සුනිසි මෙහෙවර</u>** | | | | | | |
| 30 | පූජා කටයුතු සඳහා යොදා ගන්නා මල් වගා කිරීම,මල් මාලා සැකසීම හා අලවි කිරීමේ ව්‍යාපෘතිය - කතරගම | 100% | 1.230 | 80% | 0.748 | 266 |
| 31 | ජාතික මානව සම්පත් රැකියා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම - තොරතුරු තාක්ෂණ පද්ධතිය නඩත්තු කිරීම. | 100% | 0.530 | 100% | 0.513 | - |
| 32 | මහනුවර දිස්ත්‍රික් රැකියා කේන්ද්‍රය ස්ථාපිත කිරීම | 100% | 0.970 | 100% | 0.949 | - |
| 33 | අත්පොත් මුද්‍රණය | 100% | 0.641 | 100% | 0.483 | - |

වගුව 2.2.2.2. එක් එක් අංශ වල ප්‍රගතිය - 2019

| | |
|---|---|
| රැකියා ගත කිරීම - දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර මඟින් | 6,359 |
| රැකියා ගත කිරීම - ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් | 8,473 |
| ස්වයං රැකියාලාභීන් බිහි කිරීම | 2,845 |
| මුළු රැකියාගත කිරීම | 17,677 |

වගුව 2.2.2.3. රැකියාගත කිරීමේ ප්‍රගතිය

**සේවා යෝජකයන් සමග පවත්වන ලද විශේෂ වැඩසටහන්**

| දිනය | ස්ථානය | සහභාගීත්වය (ආයතන සංඛ්‍යාව) | වැය ශීර්ෂය | වියදම රු. |
|---|---|---|---|---|
| 2019-02-07 | කෑගල්ල | 42 | 2-2509 | 40,000.00 |
| 2019-03-12 | මහනුවර | 48 | 2-2509 | 40,000.00 |
| 2019-04-04 | ගාල්ල | 31 | 2-2509 | 40,000.00 |
| 2019-08-08 | වව්නියාව | 38 | 2-2509 | 35,300.00 |

2.2.2.4. සේවා යෝජකයන් සමඟ පවත්වන ලද විශේෂ වැඩසටහන්

දෙපාර්තමේන්තුවත්, දෙපාර්තමේන්තුවේ සේවය සැපයිය හැකි සේවා යෝජකයන් අතරත් යහපත් සම්බන්ධතාවයක් ඇති කර ගැනීම මඟින් රැකියා සේවා ලබා ගැනීම හා සැපයීම අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ සලසා ගැනීම මෙහි මූලික අරමුණ වේ. මේ යටතේ කෑගල්ල, මහනුවර, ගාල්ල හා වවුනියාව දිස්ත්‍රික්කයන්හි දී පිළිවෙළින් ආයතන 42,48,31 හා 38 ක සහභාගිත්වයෙන් වැඩසටහන් පවත්වන ලදී.

## 2.2.2.5 විශේෂ වැඩසටහන් වල ප්‍රගතිය

### I. ලක් රැකියා හරසර වැඩසටහන

තරුණ රැකියා අපේක්ෂිතයන් සඳහා රැකියා ලබා දීම හා අනෙකුත් පහසුකම් සැපයීම සම්බන්ධව දිස්ත්‍රික්ක 9ක සේවායෝජකයන් එනම්, මඩකලපුව, හම්බන්තොට, මහනුවර, කෑගල්ල, කිලිනොච්චි, මොණරාගල, පොළොන්නරුව, පුත්තලම හා ගම්පහ දිස්ත්‍රික්කයන්හි විවිධ ව්‍යවසායකයින් ඇගයීමට ලක් කරන ලදී. මෙහිදී නිෂ්පාදන, සේවා, කෘෂිකර්ම හා ස්වයං රැකියා වශයෙන් සේවායෝජකයන් විශේෂ නිර්ණායක ඔස්සේ ඇගයීමට ලක් කර රන්, රිදී, ලෝකඩ සම්මාන ලබා දෙන ලදී. ලක් රැකියා හරසර වැඩසටහන මඟින් රැකියා කේන්ද්‍රය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්යසාධනය, එනම් රැකියා අපේක්ෂිතයන් රැකියා ගත කරවීම ප්‍රමුඛ කොට ගෙන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්කයන් ළඟා කර ගැනීම පිළිබඳව සලකා ශ්‍රේණිගත කිරීම් සිදු කර දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර 25 ම ඇගයීමට ලක් කර රන්, රිදී, ලෝකඩ සම්මාන ප්‍රදානය කරන ලදී.



ඡායාරූපය 2.2.2.2. ලක් රැකියා හරසර සම්මාන ප්‍රධානෝත්සවයේ අවස්ථාවක්

**II කොරියානු රාජ්‍ය ත්‍රාන්තික මැදිහත් වීම මත සේවා නියුක්තිය හා ශ්‍රම වැඩසටහන් පිළිබඳ ප්‍රතිපත්ති උපදේශන වැඩසටහන**

මෙම ක්‍රියාවලිය ප්‍රතිපත්ති උපදේශන ක්‍රියාවලියකි (Policy consultation Programe). එය කොරියානු කම්කරු අමාත්‍යාංශය යටතේ ස්ථාපිත ආයතනයක් වන KEIS –Korean Employment Information Service ආයතනය මඟින් සිදු කෙරේ. මෙවර 2019 සංචාරයේ දී දෙපාර්තමේන්තුවට අවශ්‍ය Employment sourcing and delivery ක්‍රමවේදය සඳහා වූ පූර්ව ශක්‍යතා අධ්‍යයනයේ ප්‍රතිඵල ඔවුන් විසින් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව, එම ව්‍යාපෘතිය මධ්‍යස්ථ අවධානම් සහිත ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව, එම නියෝජිත කණ්ඩායම විසින් සිය අමාත්‍යාංශය වෙත කරුණු ඉදිරිපත් කර 2020 හා ඉන් ඉදිරියට යෝජිත ශක්‍යතා අධ්‍යයනය සඳහා අනුමැතිය ලබා ගත යුතුව ඇත. එසේ අනුමැතිය ලබා ගත් පසු සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.

**III. පූජා කටයුතු සඳහා යොදා ගන්නා මල් වගා කිරීම, මල් මාලා සැකසීම හා අලවි කිරීමේ ව්‍යාපෘතිය - කතරගම**

කතරගම පූජා භූමිය ආශ්‍රිතව වන්දනාවේ පැමිණෙන බැතිමතුන් සඳහා අවශ්‍ය මල් අවශ්‍යතාවයන් සැපිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

කතරගමට පැමිණෙන බැතිමතුන් කතරගම දේවාලයට හා අනෙකුත් දේවාලවලට පූජා වට්ටියක් ලබා දීම සිදු කරයි. මෙම පූජා වට්ටියට “මල් මාලාවක්” තැබීම සිරිතක්ව පවතී. මෙම මල්මාලාව පොලිතීන් වලින් සකසා තිබේ. මෙම පොලිතීන් උපයෝගී කරගෙන තැනූ මල් මාලා භාවිතය විශාල පරිසර බලපෑමක් ඇති කරන්නක් බවට පත්ව ඇත. එම නිසා මෙම පොලිතීන් මල් මාල වෙනුවට ස්වාභාවික මල් මාලයක් යොදා ගැනීම කාලෝචිත කටයුත්තක් ලෙස සැලකිය හැක.

මෙම ව්‍යාපෘති මඟින් සිදු කරන්නේ පූජා භූමිය ආශ්‍රිතව පවතින මල් පූජා කිරීමේ අවශ්‍යතාවය සැපිරීම හා පොලිතීන් මල් මාලා වෙනුවට ස්වාභාවික මල් මාලා සැපයීම අරමුණු කොටගෙනය. මෙහිදී මල් වගාව, (තවාන් පාලනය ඇතුළුව) මල් මාලා සැකසීම හා අලෙවිය සිදුවේ.

## 2.2.3.

# ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

2009 අංක 38 දරණ ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත මඟින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිහිටුවන ලදී. මෙරට තුළ මනා සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රියාමාර්ග තුළින් වෘත්තීය අනතුරු හා වෘත්තීය රෝග වැළැක්වීම හා නිවැරදි ආරක්ෂිත ප්‍රතිපත්තියක් හා ක්‍රමවේදයන් පිළිපැදීම තුළින් යහපත් වැඩ පරිසරය තත්ත්වයක් සෑම පුද්ගලයෙකුටම ලබා දීමට මෙම ආයතනය කටයුතු කරන අතර මෙවැනි පුහුණුවක් තුළින් ප්‍රතිලාභ ලබාගත හැකි සේවක සේව්‍යය හා ඕනෑම පුද්ගලයකු සඳහා අවශ්‍ය අධ්‍යාපනය ද මෙම ආයතනය විසින් ලබාදෙනු ලබයි.

**දැක්ම**

" සෑමට වෘත්තීය සුරක්ෂිතතාව සෞඛ්‍ය හා සුභසාධනය ලබාදීම"

**මෙහෙවර**

"සේවා ස්ථානවල සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සහතික කරලීම සහ ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා සියලු ආකාරයේ රැකියා උපද්‍රවයන් වළක්වාලීම පිණිස අධ්‍යාපනය පුහුණුව හා පර්යේෂණය තුළින් ත්‍රෛපාර්ශවීය කොටස්කරුවන් සවිබලගැන්වීම "

**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම්**

- වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- කාර්මාන්තයන් පිළිබඳ වැඩ අධ්‍යයන වැඩසටහන
- කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙදියන් පුහුණු කිරීම
- රෝහල් කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය
- ආහාර පරිහරණය කරන්නන් සඳහා සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය
- ආතති කළමණාකරන පුහුණු වැඩසටහන
- රසායනික ද්‍රව්‍ය ආරක්ෂා සහිතව පරිහරණය කිරීම
- කාර්යාලයීය කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය
- පරික්ෂණාගාරවල වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය
- බොයිලේරු ක්‍රියාකරවන්නන් පුහුණු කිරීම
- ආතති කළමණාකරන පුහුණු වැඩසටහන
- වැවිලි අංශයේ වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ උසස් සහතිකය

### 2.2.3.1 පාරිසරික සමීක්ෂණ

වෘත්තිකයන් සේවයේ නිරතවී සිටින පරිසරය සුදුසු මට්ටමක තිබේද යන්න පරීක්ෂාකර බැලීම මෙමඟින් සිදු කරනු ලැබේ. එහිදී වාතයේ තත්ත්වය සමීක්ෂණය කිරීම හා දුම් පරීක්ෂා කිරීම, කර්මාන්තය තුළ දූවිලි මට්ටම් සමීක්ෂණය කිරීම, ඝෝෂා මට්ටම සමීක්ෂණය කිරීම හා ශබ්ද මැනීම, උෂ්ණත්ව මට්ටම සමීක්ෂණය කිරීම ආදිය සිදු කරනු ලැබේ. මේ සඳහා අදාළ උපකරණ භාවිතා කරමින් අදාළ පරිසර තත්වයන් සේවකයන්ගේ සෞඛ්‍ය තත්වයට හිතකර අයුරින් පවතින්නේ ද යන්න තීරණය කරනු ලැබේ. එසේ අවශ්‍ය ආකාරයට පරිසර

තත්වයන් නොමැති වූ විට ඒවා නිසි ආකාරයට පවත්වාගෙන යාමට අවශ්‍ය තාක්ෂණික උපදේශ ඔවුන් වෙත ලබා දී සෞඛ්‍යාරක්ෂිත ලෙස සේවයේ යෙදීමේ අවශ්‍යතාව පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සිදු කරනු ලැබේ.

2019 වර්ෂය පුරාවට පාරිසරික සමීක්ෂණ 206ක් සිදු කර ඇති අතර නිවැරදි ලෙස පාරිසරික තත්වයන් පවත්වාගෙන යාමේ වැදගත්කම පිළිබඳව ද දැනුවත් කරන ලදී.

### 2.2.3.2. වෛද්‍ය පරීක්ෂණ

සේවයේ නිරතවන වෘත්තිකයන්ගේ සෞඛ්‍ය තත්වය නිසියාකාරව පවතිනවාද යන්න විමසා බැලීම උදෙසා වෛද්‍ය පරීක්ෂණ සිදු කරනු ලැබේ. එහිදී, පුද්ගලයන් ශ්‍රවණ තත්වය මැනීමේ පරීක්ෂණ, රුධිර විශ්ලේෂණය, වැඩ කිරීමට යෝග්‍යතාව තක්සේරු කිරීම, පෙනහළු ක්‍රියාකාරිත්වය පිළිබඳ පරීක්ෂණ, දෘෂ්ටි පරීක්ෂණ සිදුකිරීම ආදිය සිදු කරනු ලැබේ. වෘත්තිකයන් තුළ පවත්නා රෝගී තත්වයන් හඳුනාගෙන ඔවුන් එම වෘත්තියේ නියළීම සුදුසු වන්නේද නොවන්නේද යන්න වෛද්‍ය පරීක්ෂණ තුළින් අනාවරණය කර දෙනු ලැබේ. එමෙන්ම ඔවුන් තුළ පවත්නා රෝගී තත්වයන්ට අවශ්‍ය වෛද්‍ය උපදෙස් ලබා දෙමින් නිරන්තරයෙන් ඔවුන් දැනුවත් කිරීම මෙතුළින් ඉටු කරනු ලැබේ.

මෙම සේවාව අවශ්‍ය ආයතනය වෙත ගොස් වෛද්‍ය පරීක්ෂණ සිදු කරනු ලබන අතර අවශ්‍ය නම් ආයතනය තුළදී ද මෙම සේවාව ලබා ගැනීමට හැකියාව පවතී. 2019 වර්ෂයේදී වෛද්‍ය පරීක්ෂණ 679ක් සිදු කර ඇත.

### 2.2.3.3. වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ ජාතික ආයතනයේ අවදානම් හඳුනා ගැනීම සහ උපදෙස් ලබාදීමේ සේවය

ආයතන වෙත ගොස් ඒවායේ පවතින අවදානම් තත්වයන් හඳුනාගෙන ඒ පිළිබඳව අධ්‍යයනය කර ආයතනය දැනුවත් කිරීම මෙහි දී සිදු කරනු ලැබේ. ආයතනය තුළ පවත්නා අවදානම් සහගත තත්වයන් පිළිබඳව අදාළ ආයතනය දැනුවත් කර අවශ්‍ය උපදෙස් ලබාදෙනු ලැබේ. 2019 වර්ෂයේදී ආයතන 31ක් සඳහා මෙම සේවාව ලබා දෙනු ලැබීය.

**2019. 01. 01 - 2019. 12. 31 දින දක්වා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ විශේෂ වැඩසටහන් හා ඒවායේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය.**

| | පාඨමාලාව | පැවැත් වූ පාඨමාලා ගණන | සහභාගී වූ සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය රු. මි. |
|---|---|---|---|---|
| 01 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 02 | 50 | 10.03 |
| 02 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 06 | 90 | 9.99 |
| 03 | ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා එක් දින වැඩමුළුව | 02 | 20 | 0.38 |
| 04 | අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ එක්දින වැඩමුළුව | 01 | 10 | 0.95 |
| 05 | අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දින 10 වැඩමුළුව | 01 | 10 | 0.49 |
| 06 | අබාන්ස් ආයතනයේ සේවකයින් සඳහා වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ දෙදිනක දැනුවත් කිරීමේ දෙදින වැඩසටහන | 01 | 10 | 0.73 |

| | පාඨමාලාව | පැවැත් වූ පාඨමාලා ගණන | සහභාගී වූ සංඛ්‍යාව | මුල්‍ය ප්‍රගතිය රු. මි. |
|---|---|---|---|---|
| 07 | හෙදියන් සඳහා වූ එක්දින පුහුණු පාඨමාලාව | 01 | 10 | 0.84 |
| 08 | ඇඟලුම් ක්ෂේත්‍රය සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ එක්දින වැඩමුළුව | 01 | 15 | 0.98 |
| 09 | අනාරක්ෂිතභාවය හා අනතුරු සහිත ස්ථානවල වැඩ කිරීම පිළිබඳ එක් දින වැඩමුළුව | 01 | 15 | 1.47 |
| 10 | සුපරීක්ෂකවරුන් සඳහා වූ එක්දින සුරක්ෂිතතා වැඩමුළුව | 01 | 10 | 0.73 |
| 11 | විදුලි ආරක්ෂණ ක්ෂේත්‍ර පිළිබඳ දෙදින වැඩමුළුව | 01 | 10 | 1.90 |
| 12 | ගුරුවරුන් සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව | 01 | 10 | 5.0 |

වගුව 2.2.3.1. පවත්වන ලද වැඩසටහන් වල ප්‍රගතිය - 2019

### 2.2.3.4 පරීක්ෂණාගාරය හා ගොඩනැගිල්ල නවීකරණය

වෛද්‍ය පරීක්ෂණ පවත්වනු ලබන පරීක්ෂණාගාරය අඩු පහසුකම් යටතේ පරිහරණයට නුසුදුසු ආකාරයට පැවතුණු අතර එය නවීන පහසුකම් යටතේ නැවත පිළිසකර කරගැනීම 2019 වර්ෂයේ දී සිදු විය. එමෙන්ම නව පහසුකම් යටතේ 90 දෙනෙකුට පමණ අසුන්ගත හැකි නවීන දේශණ ශාලාවක් ඉදිකිරීම ද මේ වර්ෂයේ දී සිදුකරන ලදී. ආයතනයේ පාඨමාලා හදාරන ශිෂ්‍යයන්ට අධ්‍යාපනය ලබා ගැනීමට අවශ්‍ය සියලු පහසුකම් ලබා දීම ගොඩනැගිලි නවීකරණය කිරීමෙන් හැකියාව ලැබී ඇත.

### 2.2.3.5 ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව

ශ්‍රී ලංකාව තුළ සුරක්ෂිත වැඩබිම් බිහි කරවීම සඳහා අවශ්‍ය වන සෞඛ්‍ය හා සුරක්ෂිතතා නිළධාරීන් බිහි කිරීමේ ජාතික වගකීම ඉටු කරනු වස් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව පවත්වාගෙන යනු ලැබේ. එහිදී සෞඛ්‍ය හා සුරක්ෂිතතා නිළධාරීන්ට අවශ්‍ය න්‍යායාත්මක දැනුම දේශණ තුළින් ලබා දෙන අතර අවශ්‍ය ප්‍රයෝගික දැනුම වැඩබිම් වෙත ගොස් ලබා දීමට කටයුතු කරනු ලැබේ. එමෙන්ම ඇගයීම් වාර්තා, ඉදිරිපත් කිරීම් ආදිය තුළින් හා විභාග තුළින් ඔවුන්ගේ දැනුම පරීක්ෂාවට ලක්කර ඔවුන්ට ඩිප්ලෝමාව පිරිනමනු ලැබේ. පාඨමාලාව හැදෑරීමෙන් පසු විදේශීය රැකියා සඳහා සුදුසුකමක් වන අතර මේ වන විටත් පාඨමාලාව සාර්ථකව නිමකළ සිසුන් විදේශීය රටවල සේවයේ නියුක්තව සිටියි.

පාඨමාලාව නිම කරනු ලැබූ 16 හා 17 යන කණ්ඩායම්වල සිසුන් 135 දෙනෙකුට පමණ 2019 ඔක්තෝම්බර් 14 වන දින ෂැන්ග්‍රිලා හෝටලයේ ඩිප්ලෝමා පිරිනමන ලදී. මේ වන විට කණ්ඩායම් 18 හා 19 පාඨමාලාවන් පවත්වාගෙන යනු ලැබේ.

### 2.2.3.6 ජාතික වෘත්තීය සුරක්ෂිතතා සම්මාන උළෙල පැවැත්වීම

වැඩ කරන ශ්‍රී ලාංකික ජනතාවගේ වැඩබිමේ දී සිදුවන අනතුරු හා රෝගාබාධ වළක්වාළීම හා එම අනතුරු වලින් සිදුවන හානි වීම් අවම කිරීම සඳහා වැඩබිම් පරිසර සම්බන්ධයෙන් කැප වී ක්‍රියා කළ ආයතන ඇගයීමේ අරමුණින් NIOSH ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය විශිෂ්ඨතා සම්මාන උළෙල තෙවන වරටත් ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගේ සහභාගීත්වයෙන් අගෝස්තු මස 22 වන දින නෙළුම් පොකුණ රඟහලේ පැවැත් වූ අතර මේ සඳහා දිවයින පුරා පිහිටි විවිධ

ක්ෂේත්‍රයන් නියෝජනය කරන සේවා සේවක දෙපාර්ශවයන් 1500කට අධික ප්‍රමාණයක් සහභාගී විය. සම්මාන ප්‍රදානය සඳහා ආයතන තෝරා ගනු ලැබුවේ විශේෂඥ කණ්ඩායමක් යොදවා නිරීක්ෂණය කර ලකුණු ලබාදීමේ පටිපාටියකිනි. මෙහි දී හෝටල්, කර්මාන්ත, ප්‍රවාහන, ඇඟලුම්, බහු ජාතික සමාගම් හා රෝහල් ආදී වශයෙන් විවිධ අංශ සඳහා සුළු, මධ්‍ය හා මහා පරිමාණ වශයෙන් ඇගයීම සිදු කරන ලදී.




ඡායාරූපය 2.2.3.1. ජාතික වෘත්තීය සුරක්ෂිතතා සම්මාන ප්‍රදානෝත්සවයේ අවස්ථාවක්

**2.2.4**

# කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය

සේවයේ යෙදී සිටින අවස්ථාවේ දී සිදුවන අනතුරු සම්බන්ධයෙන් වන්දි ලබාදීම සඳහා 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත පනවා ඇත. මෙම පනතට යම් යම් අවස්ථාවන්හිදී සංශෝධන කිහිපයක් ඇතුළත් වූ අතර, අවසාන සංශෝධනය 2005 අංක 10 පනතින් සිදුකර ඇත. කම්කරු වන්දි උසාවිය දිසා විනිසුරු හා මහේස්ත්‍රාත් බලතල සහිතව මුළු දිවයිනම ආවරණය වන පරිදි සංචාරක උසාවි 14 කින් ද සමන්විත වේ. අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් පත්කරනු ලබන අධිකරණ නිලධාරීන් වන කම්කරු වන්දි කොමසාරිස්, අතිරේක කම්කරු වන්දි කොමසාරිස් හා නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස් යන තනතුරු 3කින් ද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I වන පන්තියේ තනතුරක්ද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරක් ද ඇතුළු තනතුරු 43 කින් සමන්විත වේ.

එසේම මෙම කාර්යාලය නඩු අංශය, ආයතන අංශය, ගිණුම් අංශය, බාලවයස්කාර වන්දි කටයුතු සහ රක්ෂණ බලපත්‍ර අංශයෙන් සමන්විත වේ. කම්කරු වන්දි අධිකරණ ක්‍රියාවලිය සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය සහ සාක්ෂි ආඥා පනත අදාළ කර ගන්නා අතර අභියාචන පටිපාටිය දිසා අධිකරණයකට සමාන වේ.

රැකියාවේ යෙදී සිටියදී සිදුවන අනතුරුවලින් තුවාල ලබන සේවකයින්ට රැකියාවේ ස්වභාවය නිසා වැළඳුණු රෝගවලින් පීඩා විඳින සේවකයින්ට සේවයේ යෙදී සිටින විට සිදුවන අනතුරුවලින් මියයන සේවකයින්ගේ යැපෙන්නන්ට වන්දි අයකර දීම ප්‍රධාන අරමුණ වේ.

**දැක්ම**

ආපදාවකට හෝ මරණයකට හෝ පත්වන සේවකයින් වෙනුවෙන් සේවා යෝජකයින්ගෙන් අප්‍රමාදව වන්දි අයකර දීම මගින් සේවක තෘප්තිය ඇති කිරීම.

**මෙහෙවර**

රැකියාවේ යෙදී සිටීම හේතුකොට ගෙන ඇතිවූ අනතුරු මරණ හෝ රෝග පීඩා සම්බන්ධයෙන් සේවකයින්ට හෝ ඔවුන්ගේ යැපෙන්නන්ට නියමිත වන්දි මුදල අයකර දීමට කටයුතු කිරීම සඳහා උසාවි ක්‍රියා මාර්ග ගැනීම සහ උපදෙස් දීම.

**1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනතේ බලතල හා විධිවිධාන අනුව කම්කරු වන්දි කොමසාරිස්ට හිමි ප්‍රධාන කාර්යභාරයන් වන්නේ,**

1. රජයේ සහ පෞද්ගලික අංශයේ සේවකයන්ට සේවයේ යෙදී සිටියදී සිදුවන අනතුරු, වෘත්තීය රෝගාබාධ සහ මරණයකදී නම් යැපෙන්නන්ට වන්දි අයකර දීමේ කටයුතු (2005 අංක 10 දරණ අවසන් සංශෝධනයට අනුව ලබාදිය හැකි උපරිම වන්දි මුදල රු. 550,000/=කි.)
2. බාල වයස්කරුවන් වයස් පූර්ණත්වයට පත්වන තුරු කම්කරු වන්දි කොමසාරිස් භාරයේ ජාතික ඉතිරිකිරීම් බැංකුවේ ගිණුම් පවත්වා ගෙන යාම හා ඒවායේ පරිපාලන කටයුතු
3. සේවකයන්ට සිදුවන අනතුරකදී සේවායෝජකයන් වන්දි ගෙවීම පැහැර හැරි අවස්ථාවල ඔවුන්ගේ නිශ්චල හා චංචල දේපල තහනමට ගෙන ඒවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා වන්දි මුදල් අයකර දීම
4. එමෙන්ම කම්කරු වන්දි රක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම, බලපත්‍ර අවලංගු කිරීමේ කටයුතු
5. සේවකයකුට අනතුරක් සිදුවූ විට එම ස්ථානයට ගොස් පරීක්ෂා කර බැලීම
6. ලංකාවේ ලියාපදිංචි කර ඇති නැව්වල සහ ගුවන් නැව්වල සේවකයන්ට ලංකාවෙන් පිටත දී සිදුවන අනතුරු සඳහා වන්දි අයකර දීම



ඡායාරූපය 2.2.4.1 වෘත්තිය අනතුරු වෙනුවෙන් වන්දි ලබා දීමේ අවස්ථාවක්

### 2.2.4.1. 2019.01.01 සිට 2019.12.31 දක්වා ප්‍රගතිය (උසාවි කටයුතු)

| කාර්යය | ප්‍රගතිය |
|---|---|
| විධිමත් ලෙස වාර්තාගත කරන ලද අනතුරු සංඛ්‍යාව | 468 |
| විභාගයට ගන්නා ලද ලිපිගොනු සංඛ්‍යාව | 2712 |
| කටයුතු අවසන් කරන ලද වන්දි අයදුම්පත් සංඛ්‍යාව | 464 |
| ලියාපදිංචි කළ ගිවිසුම් සංඛ්‍යාව | 100 |
| මාරක අනතුරු සම්බන්ධයෙන් වන්දි ලෙස අයකර ගත් මුදල් (රු.මි.) | 231.33 |
| මාරක නොවන අනතුරු වෙනුවෙන් උසාවි නියෝගයන් අනුව සේවා යෝජකයන් | 46.17 |
| ලියාපදිංචි කළ ගිවිසුම්පත් අනුව මාරක නොවූ අනතුරු වෙනුවෙන් සේවකයින්ට | 12.62 |
| මාරක අනතුරු සම්බන්ධයෙන් අයකර ගන්නා ලදුව බාලවයස්කාර | 33.83 |
| බාලවයස්කරුවන් වෙනුවෙන් විවෘත කළ ගිණුම් සංඛ්‍යාව | 168 |
| බාලවයස්කරුවන්ගේ වයස අවුරුදු 18 සම්පූර්ණ වීමෙන් පසු නිදහස් කළ ගිණුම් | 135 |
| නිදහස් කළ බාලවයස්කාර ගිණුම් වලින් ගෙවූ මුදල් ප්‍රමාණය (රු.මි.) | 16.38 |

වගුව 2.2.4.1. උසාවි කටයුතුවල ප්‍රගතිය - 2019

### 2.2.4.2 2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2019 වර්ෂයේ ප්‍රතිපාදන රු. | 2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වියදම රු. | ඉතිරිවීම් රු. | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 39,180,000 | 32,934,912.33 | 6,245,087.67 | 84.06 % |
| ප්‍රාග්ධන වියදම් | 520,000 | 373,337.34 | 146,662.66 | 71.80 % |
| මුළු වියදම් | 39,700,000 | 33,308,249.67 | 6,391,750.33 | 83.90% |

වගුව 2.2.4.2. මූල්‍ය ප්‍රගතිය - 2019

**2.2.5.**

## ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය 2007 සැප්තැම්බර් 11 වන දින නිල වශයෙන් ස්ථාපිත කරන ලද අතර 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත මඟින් බලාත්මක කරන ලදී. එම ආයතනය, කම්කරු ක්ෂේත්‍රයේ ත්‍රෛපාර්ශව හවුල්කරුවන් වන සේවා පාර්ශවය, වෘත්තීය සමිති නියෝජනය වන සේවක පිරිස් හා රජයේ නිලධාරීන්ගෙන් සැදුම්ලත් පාලක මණ්ඩලයක් මඟින් පාලනය වේ. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය වර්තමානයේ දී කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

කම්කරු අණපනත්, නීති රීති රෙගුලාසි පිළිබඳව දැනුවත් ඵලදායී ශක්තිමත් ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පුහුණු හා පර්යේෂණ කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, සංවිධානය හා මෙහෙයවීම මෙම ආයතනය මඟින් සිදුකරනු ලබයි.

**දැක්ම**

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා කාර්මික සාමය හා සංහිඳියාව.

**මෙහෙවර**

අධ්‍යාපන, පර්යේෂණ සහ පුහුණුව ඔස්සේ ඵලදායී කම්කරු සබඳතාවක් පවත්වා ගැනීම සහ සංවර්ධනය කිරීම සඳහා ත්‍රෛපාර්ශවීය කොටස්කරුවන් වෙත පහසුකම් සැලසීම.

මෙම කාර්යයන් ඉටුකිරීම සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය තුළ ප්‍රධාන අංශ තුනක් ක්‍රියාත්මක වේ.

i. පාලන හා සංවර්ධන අංශය
ii. පුහුණු හා විභාග අංශය
iii. මුදල් අංශය

### 2.2.5.1. සංවිධාන ව්‍යුහය

සභාපති ඇතුළු දහනව දෙනකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මඟින් පාලනය කෙරේ. අධ්‍යක්ෂ ජනරාල්වරයකු, මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් තිදෙනෙකු, කනිෂ්ඨ කළමනාකරුවන් පස් දෙනෙකු හා සහායක සේවාවන් ඇතුලත් 21ක සේවක සංඛ්‍යාවකින් සමන්විත කාර්ය මණ්ඩලයක් 2019 වර්ෂය තුළ සේවයේ යෙදී සිටියහ.

### 2.2.5.2. නව ස්ථානයක ස්ථාපනය කිරීම.

පන්නිපිටිය පාර, පැලවත්ත, බත්තරමුල්ල යන ස්ථානයේ සිට 2019.11.11 දින සිට කම්කරු මහ ලේකම් කාර්යාලයේ දෙවන මහලෙහි ස්ථාපනය කර ඇති අප ආයතනය අධ්‍යාපන, පර්යේෂණ සහ පුහුණුව ඔස්සේ ඵලදායී කම්කරු සබඳතාවක් පවත්වා ගනිමින් සහ සංවර්ධනය කිරීම සඳහා ත්‍රෛපාර්ශවීය කොටස්කරුවන් වෙත පහසුකම් සලසමින් නව මුහුණුවරකින් මේ වන විට ක්‍රියාත්මක වේ.

### 2.2.5.3. 2019-01-01 සිට 2019-12-31 දක්වා සිදුකළ වැඩසටහන්වල ප්‍රගතිය

| වැඩසටහන් විස්තරය | සැලසුම් කළ වැඩ සටහන් සංඛ්‍යාව | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | අපේක්ෂා කළ ආදායම (රු.මිලි.) | සත්‍ය ආදායම (රු.මිලි.) |
|---|---|---|---|---|
| ඩිප්ලෝමා පාඨමාලා | 3 | 3 | 1.2 | 0.78 |
| දින අටේ වැඩසටහන් | 4 | 1 | 1.8 | 0.5 |
| සහතික පත්‍ර පාඨමාලා | 15 | 11 | 4.8 | 2.8 |
| Tailor made Courses | 24 | 23 | 2.4 | 3.9 |
| දින හතරේ වැඩසටහන් | 4 | 1 | 1 | 0.4 |
| දින තුනේ වැඩසටහන් | 8 | 8 | 1.6 | 1.4 |
| දෙදින වැඩසටහන් | 14 | 16 | 2.1 | 2.2 |
| එක් දින වැඩසටහන් | 30 | 29 | 2.2 | 1.9 |
| වැඩමුළු | 11 | 10 | 4.7 | 2.7 |
| විභාග පැවැත්වීම් | 2000 (candidates) | 2265 | 6 | 6.1 |
| විදේශ වැඩ සටහන් | 35 (participants) | 13 | 9.6 | 3.0 |

වගුව 2.2.5.1. වැඩසටහන් වල ප්‍රගතිය - 2019



ඡායාරූපය 2.2.5.1. සහතික පත්‍ර ප්‍රදානෝත්සවයේ අවස්ථාවක්

**2.2.6**

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වර්තමානයේ ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම හා ප්‍රමුඛ සමාජ ආරක්ෂණ අරමුදල වන අතර, එය 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත මඟින් සංස්ථාපිතව 1981 මාර්තු මස 01වන දින සිට ක්‍රියාත්මක වේ. මෙම අරමුදල සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මඟින් පරිපාලනය වන අතර, 2019 වර්ෂයේදී කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය.

පෞද්ගලික අංශයේ හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තයන් මෙම අරමුදලේ අනිවාර්ය සාමාජිකයන් වේ. පනතේ විධිවිධාන ප්‍රකාරව සේවා නියුක්තයන්ගේ මාසික දළ ඉපයීම් වලින් 3% කට සමාන ප්‍රමාණයක් මාසිකව මෙම අරමුදලට බැර කිරීමට සේවා යෝජකයන් බැඳී සිටී. තවද, ස්වයංරැකියාලාභීන් හා විදේශගත ශ්‍රමිකයන්ටද ස්වේච්ඡාවෙන් මෙම අරමුදලේ සාමාජිකත්වය ලබා ගත හැකිය.

මණ්ඩලය විසින් සේවා දායකයන්ගේ සෞඛ්‍ය හා නිවාස අවශ්‍යතා වෙනුවෙන් සහ ඔවුන්ගේ දූ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් ප්‍රතිලාභ යෝජනා ක්‍රම 10ක් ක්‍රියාත්මක කරනු ලබයි.

2019 වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට මණ්ඩලයේ සාමාජික ගිණුමේ ශේෂය රු.බිලියන 339ක් වන අතර, මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 14.6ක් වේ.එයින් සාමාජික ගිණුම් මිලියන 2.6ක් වර්තමානයේ සාමාජික මුදල් ගෙවන ක්‍රියාකාරී සාමාජික කොටසට අයත් වේ. 2019 දෙසැම්බර් මස 31 වන දිනට අදාළව සාමාජික මුදල් ලැබීම් වල වටිනාකම රු.බිලියන 27.4ක් වන අතර, සාමාජිකයන් වෙත ගෙවනු ලැබූ ප්‍රතිලාභ වල වටිනාකම රු බිලියන 20.3ක් වේ.

2019 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනට මණ්ඩලය සතුව රු.බිලියන 343ක වත්කම් පවතින අතර, සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා රු.බිලියන 32.4ක ආදායමක්ද, රු. බිලියන 25.9ක ලාභයක්ද උපයා ඇත.

**දැක්ම**

ආයතනික විශිෂ්ඨත්වය තුළින් සමස්ථ පාර්ශවකරුවන් සඳහා වූ ක්‍රියාශීලී හා ස්ථාවර
ප්‍රමුඛ භාරයක් බවට පත් වීම

**මෙහෙවර**

සාමාජිකයන් සඳහා වූ පුළුල් පරාසයක වූ මූල්‍ය ප්‍රතිලාභ හා විශිෂ්ඨ සේවාවක් සලසන
සුහදශීලී හා විචක්ෂණශීලී භාරයක් වීම

### 2.2.6.1 මණ්ඩලයේ අරමුණු

- මූල්‍ය සම්පාදනයට හා ආයෝජනයට සහභාගී වීමෙන් සේවක අයිතිය, සේවක සුභසාධනය, ආර්ථික ප්‍රජාතාන්ත්‍රීය ප්‍රවර්ධනය කිරීම
- ව්‍යවසායන්හි සමාන කොටස් අත්කර ගැනීමෙන් කළමණාකරණයෙහි සේවක සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම
- සේවා නියුක්තයන්ට විශ්‍රාම ගැනීමේදී දායක නොවන ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම

**2.2.6.2 දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාල**

1. කොළඹ දිස්ත්‍රික් කාර්යාලය
2. කොළඹ 01-07
3. කොළඹ 08-15
4. මහනුවර
5. ගම්පහ
6. මාතර
7. ගාල්ල
8. හම්බන්තොට
9. කළුතර
10. රත්නපුර
11. කෑගල්ල
12. කුරුණෑගල
13. අනුරාධපුර
14. බදුල්ල
15. යාපනය
16. අම්පාර
17. වව්නියා (නව ප්‍රාදේශීය කාර්යාලය)
18. නුවරඑළිය (නව ප්‍රාදේශීය කාර්යාලය)
19. ත්‍රිකුණාමලය (නව ප්‍රාදේශීය කාර්යාලය)

**2.2.6.3 මණ්ඩලයේ ප්‍රගතිය**

| | 2019.12.31 (රු.මිලියන) | | වෙනස |
|---|---|---|---|
| | 2018 | 2019 | % |
| සාමාජික අරමුදල | 306,455 | 338,614 | 10.5% |
| මුළු වත්කම | 310,771 | 343,392 | 10.5% |
| වාර්ෂික ආදායම | 28,803 | 32,370 | 12.4% |
| ශුද්ධ ලාභය | 23,285 | 25,915 | 11.1% |
| රජයට ගෙවන ලද බදු ප්‍රමාණය | 3,395 | 4,219 | 24.3% |

වගුව 2.2.6.1. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රගතිය

**2.2.6.4. 2019 දෙසැම්බර් මස 31 වන දිනට අයවැයගත සංඛ්‍යාවලට සාපේක්ෂව තත්‍ය සංඛ්‍යා**

| ක්‍රියාකාරකම | අයවැයගත අගය | තත්‍ය අගය | වෙනස % |
|---|---|---|---|
| දායක මුදල් රැස් කිරීම (රු.මිලියන) | 28,058 | 27,395 | (2.36) |
| අධිභාර (රු මිලියන) | 300 | 319 | 6.33 |
| අන්තර්ජාල බැංකු ක්‍රමය හරහා දායක මුදල් ගෙවනු ලබන ආයතන සංඛ්‍යාව | - | 5,628 | N/A |

වගුව 2.2.6.2. දායක මුදල් රැස්කිරීමේ ප්‍රගතිය - 2019

**2.2.6.5. ප්‍රතිලාභ යෝජනා ක්‍රම**

- **සෞඛ්‍ය ප්‍රතිලාභ**

  i. නිත්‍ය දුබලතා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය - රු. 200,000
  ii. හෘද සැත්කම් සඳහා මූල්‍යාධාරය - රු. 300,000
  iii. වකුගඩු බද්ධ කිරීම සඳහා මූල්‍යාධාරය - රු. 300,000
  iv. අක්ෂි කාච බද්ධ කිරීම සඳහා මූල්‍යාධාරය - රු. 30,000

v. ශ්‍රමසුව රැකවරණ රෝහල් රක්ෂණ ක්‍රමය - රු. 50,000
vi. මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය - රු.100,000

- අධ්‍යාපන ප්‍රතිලාභ

vii. සේ.නි.භා.අ.සාමාජිකයන්ගේ දරුවන් සඳහා වූ 5 වසර ශිෂ්‍යත්ව මූල්‍යාධාර රු 15000.00 බැගින් ශිෂ්‍යත්ව 9000ක් වාර්ෂිකව

viii. සේවා කාලය තුළදී නිත්‍ය දුබලතාවයට පත් අරමුදලේ සාමාජිකයින්ගේ 5 වසර සමත් දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය

ix. අ.පො.ස.(උ.පෙ) විභාගය සමත් අරමුදලේ සාමාජිකයින්ගේ දරුවන් 5000කට රු 12000.00බැගින් වාර්ෂික මූල්‍යාධාර

- නිවාස ප්‍රතිලාභ

x. "වියන" අඩු පොලී නිවාස ණය යෝජනා ක්‍රමය

**2.2.6.6. 2019 දෙසැම්බර් මස 31 දිනට අයවැයට සාපේක්ෂව තත්‍ය දත්තයන්**

**දායක මුදල් ආපසු ගෙවීම්** *(රු මිලියන)*

| ආපසු ගෙවීම් | අයවැයගත | තත්‍ය | වෙනස |
|---|---|---|---|
| දායක මුදල් ආපසු ගෙවීම් | 21,206 | 20,314 | 892 |
| සාමාජික ප්‍රතිලාභ | 605 | 503 | 102 |
| එකතුව | 21,811 | 20,817 | 994 |

වගුව 2.2.6.3. දායක මුදල් ආපසු ගෙවීම්

**ප්‍රතිලාභ ගෙවීම්**

| ප්‍රතිලාභ වර්ගය | අයවැයගත | තත්‍ය | වෙනස |
|---|---|---|---|
| මරණ ප්‍රතිලාභ | 120 | 102 | 18 |
| නිත්‍ය දුබලතා | 14 | 10 | 4 |
| හෘද සැත්කම් | 216 | 175 | 41 |
| වකුගඩු බද්ධ කිරීම් | 8 | 6 | 2 |
| අක්ෂි කාච බද්ධ කිරීම් | 7 | 4 | 3 |
| 5 වසර ශිෂ්‍යත්ව | 135 | 135 | - |
| උසස් පෙළ ශිෂ්‍යත්ව | 60 | 60 | - |
| ශ්‍රම සුව රැකවරණ | 45 | 10 | 35 |
| **එකතුව** | **605** | **502** | **103** |
| වියන නිවාස ණය | 1004 | 955 | 49 |

වගුව 2.2.6.4. ප්‍රතිලාභ ගෙවීම්

**+ වාසිදායක වෙනස**

**- අවාසිදායක වෙනස**




ඡායාරූපය 2.2.6.1.ජාතික ඵලදායිතා සම්මාන උළලේ දී වව්නියාව කම්කරු කාර්යාලයේ සේවා අංශය මඟින් තුන්වෙනි ස්ථානය ලබා ගැනීම.

***මණ්ඩලයේ ආයෝජන කොටස් දෙකකින් සමන්විත වේ.***
***ස්ථාවර ආදායම් උපකරණ***

- හාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත්
- ස්ථාවර තැන්පත්, ණයකර
- NDB වියන තැන්පතු

***කොටස් ආයෝජන***

- ලැයිස්තුගත කොටස්
- ඒකක භාර

## 2.2.6.7. 2019 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනට ආයෝජන කළඹ

*(රු. මිලියන)*

| ආයෝජන වර්ගය | වටිනාකම | දේපල % |
|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර (8 % සිට 10.13% ) | 248,725 | 77.9% |
| ස්ථාවර තැන්පතු | 51,369 | 16.1% |
| ණයකර | 4,990 | 1.6% |
| බැඳුම්කර (Kerawalapitiya – 9.7%) | 1,586 | 0.5% |
| කොටස් ආයෝජන | 11,335 | 3.5% |
| ඒකක භාර | 191 | 0.1% |
| වෙනත් ආයෝජන | 954 | 0.3% |
| **එකතුව** | **319,150** | 100% |

වගුව 2.2.6.5 - 2019 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළඹ

### 2.2.6.8. ලංකා ලුණු සමාගමේ ආයෝජනය

1997/01/24 වන දින ලංකා ලුණු සමාගමේ සාමාන්‍ය කොටස් අයිතියෙන් 90%ක ප්‍රමාණයක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මගින් රු.මිලියන 452ක ප්‍රතිෂ්ඨාවකට මිළදී ගන්නා ලදී මෙම මිළ දී ගැනීම මුදල් අමාත්‍යාංශයේ සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය කොටස් මිළදී ගැනීම හා විකිණීම සඳහා වූ ගිවිසුමක් මගින් සිදුකර ඇත.

### 2.2.6.9. 2019 දෙසැම්බර් මස 31 වන දිනට ප්‍රධාන මූල්‍ය තොරතුරු

***(රු.මිලියන)***

| | අයවැයගත | තත්‍ය | වෙනස |
|---|---|---|---|
| ආයෝජන ආදායම් | 30,457 | 31,998 | 154 |
| වෙනත් ආදායම් | 365 | 372 | 7 |
| සේවක මණ්ඩල වියදම් | 1,271 | 1,258 | 13 |
| මෙහෙයුම් වියදම් | 297 | 231 | 66 |
| සාමාජික වියදම් | 969 | 747 | 222 |
| ආදායම් බදු වියදම් | 3,960 | 4,219 | 259 |
| **ශුද්ධ ලාභය** | 24,325 | 25,915 | 1,590 |

වගුව 2.2.6.6. මූල්‍ය තොරතුරු 2019

### 2.2.6.10 ප්‍රධාන කාර්ය සාධක දර්ශක- 2019 දෙසැම්බර් 31 වන දිනට

| | දෙසැම්බර් **2018** | දෙසැම්බර් **2019** |
|---|---|---|
| ආයෝජන මත ප්‍රතිලාභ | 10.25 | 10.45 |
| දළ ප්‍රතිලාභ (වෙනත් ආදායම් ඇතුළුව) | 10.41 | 10.57 |
| මෙහෙයුම් වියදම් | 0.49 | 0.49 |
| සාමාජික වියදම් | 0.26 | 0.29 |
| මුළු වියදම් | 0.75 | 0.73 |
| ආයෝජන මත ශුද්ධ ප්‍රතිලාභ අනුපාතය | 9.02 | 9.07 |

වගුව 2.2.6.7. ප්‍රධාන කාර්ය සාධක දර්ශක - 2019

### 2.2.6.11 කෙටිකාලීන සැලසුම්

- දායක මුදල් රැස් කිරීම වර්ධනය කිරීම 12%
- ආයෝජන ආදායම වර්ධනය කිරීම 10%
- සාමාජික අරමුදල වර්ධනය කිරීම 12%




ඡායාරූපය 2.2.6.2. රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය මගින් සංවිධාන
කරන වාර්ෂික වාර්තා තරඟයේ දී රන් සම්මාන දෙකක් ලබා ගැනීමේ අවස්ථාව

**(ආ) 2009/01/01 සිට 2019 දක්වා සැලසුම් කළ වැඩසටහන්වල ප්‍රගතිය**

- සේවායෝජකයින් විසින් අන්තර්ජාලය හරහා මුදල් ගෙවීම සහ දායක මුදල් එවීම පහසු කරලීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දායක මුදල් රැස්කිරීම වර්ධනය කිරීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ වේගවත් කිරීම ඉලක්ක කොට ගෙන මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය සහයෝගිතාවය සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) තාක්ෂණික සහයෝගිතාවය මත “ඊසා ව්‍යාපෘතිය” (ELSA-ETF Inspection System Application ) හඳුන්වා දීමට පියවර ගෙන ඇත.

- සේවා යෝජකයින් විසින් අන්තර්ජාලය හරහා මුදල් ගෙවීම සහ දායක මුදල් වාර්තා එවීම පහසු කරලීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා ඇත.

- මානව සම්පත් සංවර්ධන සැලැස්මක් හඳුන්වා දිම සහ ක්‍රියාත්මක කිරීම.

- සමස්ථ පාර්ශවකරුවන්ට පුළුල් සේවයක් සැලසීමේ අරමුණෙන් කලාප කාර්යාලයක් පිහිටුවීම සඳහා ගම්පහ, වවුනියා සහ හම්බන්තොට ප්‍රදේශයේ ඉඩම් අත්පත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

- අභ්‍යන්තර විගණන අංශය ප්‍රතිව්‍යුහගතකරණය සහ අවශ්‍ය සේවක සංඛ්‍යා ස්ථාපිත කිරීම සහ අවධානම් කළමනාකරණ ක්‍රියාවලියක් මණ්ඩලයට හඳුන්වා දිම.

- ජාතික හැඳුනුම්පත පදනම්ව සාමාජිකයා කේන්ද්‍රකොටගත් පද්ධතියක් සහ සේ.නි. භාර අරමුදල සඳහා ආවේනික අංකයක් හඳුන්වා දිම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව කම්කරු දෙපාර්තමේන්තුව සමඟ සහයෝගීතා ගිවිසුමක් අත්සන් කර ඇත.

- ජාතික ඵලදායිතා ආයතනයේ සහය ඇතිව ඵලදායිතා සංකල්ප හඳුන්වා දීම හා ඵලදායිතා අත් පොතක් පිළියෙල කිරීම.

- මානව සම්පත් සංවර්ධනය සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් දී ඇති අතර විවිධ මට්ටම්වල සේවකයින්ගේ දැනුම, ආකල්ප සහ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා විවිධ වැඩමුළු සම්මන්ත්‍රණ පුහුණු පාඨමාලා පැවැත්වීමට පියවර ගෙන ඇත. තවද, වෘත්තීය සමිති සාමාජිකයින් සඳහා ඔවුන්ගේ අදාළ ක්ෂේත්‍රයන්හි පුහුණුවීම් අවස්ථා ලබා දී ඇත. මෙම වසර තුළදී ඉහළ කළමනාකරණය සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සහ අනෙකුත් විදේශ ආධාර නියෝජිත ආයතනවල මෙම විදේශීය පුහුණු අවස්ථා ලබා දිමට හැකි විය. ඒ අනුව නිලධාරින් 46 දෙනෙකු මෙම විදේශීය පුහුණුවීම් සඳහා සහභාගි කරවීමට හැකි විය.

- 5 වසර ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයක් 2019 අගෝස්තු මස 30 වන දින බදුල්ල නගරයේ දී පවත්වන ලදි.

2.2.7.

# ශ්‍රම වාසනා අරමුදල

1988 අංක 12 දරණ (2019 අංක 15 දරණ සංශෝධිත) පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු සුභ සාධනය උදෙසා ආරම්භ කරන ලද ආයතනයකි. ශ්‍රම වාසනා අරමුදල් පනතේ අරමුණු 7 ක් ඔස්සේ ආරම්භයේ සිට මේ දක්වා විවිධ සුභ සාධන වැඩසටහන් පවත්වා ශ්‍රී ලාංකීය සේවා නියුක්තිකයින්ගේ උන්නතියට කටයුතු සම්පාදනය කර ඇත.

ශ්‍රම වාසනා අරමුදල වෙත ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ලබා දෙන දායකත්වය, ජාතික සම්පත ලොතරැයි අලෙවියත් සමඟ ක්‍රම ක්‍රමයෙන් වැඩිවෙමින් පවතින අතර එම දායකත්වය වැඩිවීමත් සමඟ කම්කරු සුභ සාධනය උදෙසා සිදු කිරීමට නියමිත සේවාවන් ද වර්ධනය කර ගත හැක.

### 2.2.7.1. ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු

(අ) සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම.

(ආ) සේවා නියුක්තයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක ඒ සේවා නියුක්තයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම.

(ඇ) හදිසි අවස්ථාවලදී සේවා නියුක්තයන්ට හා ඔවුන්ගේ යැපෙන්නන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම.

(ඈ) සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටකදී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම.

(ඉ) ව්‍යසන අවස්ථාවලදී සේවා නියුක්තයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය හා වෙනත් පහසුකම් සැපයීම.

(ඊ) සේවා නියුක්තිකයන්ගේ සුභ සාධනය සඳහා විශිෂ්ඨ සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම.

(උ) කම්කරු කොමසාරිස් ජනරාල්වරයා, කම්කරු විනිශ්චය සභාවක්, බේරුම්කරුවකු හෝ කම්කරු උසාවියක් හෝ යම් අධිකරණයක් ඉදිරියේ යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ පවරා ඇති හෝ විභාග වෙමින් පවතින යම් සේවා නියුක්තිකයෙකුගේ සේවා නියුක්තිය අවසන් කිරීම හා සම්බන්ධ හෝ කාර්මික ආරාවුලක් සම්බන්ධ නඩු කටයුතු සඳහා සේවා නියුක්තයන්ට නීතිමය සහාය ලබා ගැනීමට මූල්‍යමය සහන සැලසීම.



ඡායාරූපය 2.2.7.1. මීගහකිවුල ප්‍රදේශයේ පැවති අක්ෂි සායනය

### 2.2.7.2 2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වල ප්‍රගතිය

| වැඩසටහන / ක්‍රියාකාරකම | | 2019 වසර සඳහා වූ ඉලක්ක | | 2019.01.01. දින සිට 2019.12.31 දක්වා ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය (මිලියන) | භෞතික | මූල්‍ය (මිලියන) |
| 1. | වෛද්‍ය සායන කඳවුරු | 14 | 10.3 | 18 | 9.4 |
| 2. | සවිබල ගැන්වීමේ වැඩසටහන් | 7 | 5.15 | 14 | 4.7 |
| 3. | දැනුවත් කිරීමේ වැඩසටහන් | 28 | 0.84 | 29 | 0.50 |
| 4. | සුබසාධන වැඩසටහන් | 6 | 11 | 14 | 9.2 |
| 5. | කෘත්‍රිම අත් පා ලබා දීම | 35 | 1.05 | 2 | 0.04 |
| 6. | වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් | 12 | 0.36 | - | - |
| 7. | වෛද්‍ය සහන වැඩසටහන් | 30 | 1.3 | 10 | 0.5 |
| 8. | වෘත්තීය සෞඛ්‍ය ආරක්ෂණය හා දැනුවත් කිරීමේ වැඩසටහන් | 32 | 0.96 | 32 | 0.56 |
| 9. | නීති ආධාර වැඩසටහන් | 55 | 1.1 | 21 | 0.24 |
| 10. | ශිෂ්‍යත්ව වැඩසටහන් | 100 | 7 | 102 | 6.4 |
| 13. | ප්‍රවර්ධන වැඩසටහන් | 20 | 0.5 | 1 | 0.4 |
| 14. | දැන්වීම් හා පළ කිරීම් | 4 | 1.2 | 8 | 0.47 |

2.2.7.1. වැඩසටහන්වල ප්‍රගතිය

## 2.3 විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

1. වර්තමාන ජාතික හා ජාත්‍යන්තර සමාජ ආර්ථික තත්වයන්ට අනුකූල වන අයුරින් ශ්‍රී ලංකාව තුළ ආයෝජන හිතකාමී වාතාවරණයක් ඇති කිරීම උදෙසා ක්‍රියා කිරීම අමාත්‍යාංශය සතු කාලීන වගකීමකි. එහි දී පවතින අණ පනත්, නීති රීති වර්තමාන වැඩ ලෝකයට ගැලපෙන අයුරින් ප්‍රතිසංවිධානය කරන අතරම වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ද මෙම අමාත්‍යාංශය බැඳී සිටියි. ඒ සඳහා,

   i. සියලුම ශ්‍රී ලාංකික ශ්‍රම බලකාය ආර්ථිකයේ කොටස්කරුවන් කර ගැනීම සඳහාත්, අණ පනත් අතර පවතින විෂමතාවන් හා සංකීර්ණතා ඉවත් කර සරල බවට පත් කිරීම සඳහාත් සේවා කොන්දේසි ඇතුලත් කර එක් පනතක් හඳුන්වා දීමට කටයුතු කරගෙන යමින් පවතී.

   ii. ළමුන්ගේ අනිවාර්ය අධ්‍යාපනය සහතික වන පරිදි හා ළමා ශ්‍රමය සමාජයෙන් තුරන් කිරීම සඳහා සේවයෙහි යෙදවිය හැකි වයස අවුරුදු 14 සිට 16 දක්වා සංශෝධනයට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

   iii. සේවකයන් මුහුණ දෙන හදිසි අනතුරු වලදී ගෙවන වන්දි මුදල රු.550,000 සිට රු.මි.2 දක්වා වැඩි කිරීම සඳහා කම්කරු වන්දි ආඥාපනත සංශෝධනය කිරීමට කටයුතු කෙරේ.

   iv. කර්මාන්තශාලා පරීක්ෂණ වඩා පුළුල් ලෙස සිදු කිරීම සඳහා කර්මාන්තශාලා ආඥා පනතට නව රෙගුලාසි සකස් කරමින් පවතී.

   vi. සේවක අර්ථසාධක අරමුදල කාලානුරූපීව සංශෝධනය කරමින් පවතී.

   vii. වඩාත් පුළුල් ක්ෂේත්‍රයක සේවක සුභසාධන කටයුතු සිදු කිරීමට හැකිවන පරිදි ශ්‍රම වාසනා අරමුදල් පනත සංශෝධනය කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

   viii. සේවකයින්ගේ වැඩ පරිසරය යහපත් කිරීම සඳහා වෘත්තීය සුරක්ෂිතතාව, සෞඛ්‍ය හා සුභසාධනය පිළිබඳ නව පනතක් හඳුන්වා දීමට කටයුතු කරමින් පවතී.

   xi. ගෘහස්ථ සේවකයින් සඳහා ද සමාජ ආරක්ෂණය ව්‍යාප්ත කිරීම සඳහා ගෘහස්ථ සේවකයින් කම්කරු නීති මගින් ආවරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

   x. සේවකයින්ගේ අවම වේතනය රු.2500/- කින් වැඩි කිරීමට කටයුතු සිදු කෙරේ.

2. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සියවස් සැමරුම 2019 වර්ෂයට යෙදී තිබුණ අතර ශත සංවත්සර වැඩසටහන 2019 අප්‍රේල් මාසයේ දී අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් නෙළුම් පොකුණ රඟහලේ දී පැවැත්විණ. මෙහි දී ශ්‍රී ලංකා සේවක සඟරාවෙහි විශේෂ කලාපයක් එළි දැක්වීම සහ මුල් දින කවරයක් හා මුද්දරයක් නිකුත් කිරීම සිදු කරන ලදී.

3. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය විශිෂ්ටතා සම්මාන උළෙල ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහලේ දී පැවැත්විණ. ඒ සඳහා රු.මි. 8.91ක් වැය කරන ලදී.

4. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයට ආයතනික පරීක්ෂාවන් සිදු කිරීම සඳහා අංග සම්පූර්ණ ජංගම විද්‍යාගාරයක් රු.මි. 4.3 ක වැය බරක් දරමින් ස්ථාපනය කරන ලදී. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ පන්ති කාමරයක්, අංග සම්පූර්ණ නවීන පහසුකම් සහිත සම්මන්ත්‍රණ ශාලාවක් ලෙසින් නවීකරණය කරන ලද අතර, ඒ සඳහා රු.මි. 17.29ක් වැය කරන ලදී.

5. අමාත්‍යාංශ කාර්යාලය මෙතෙක් කලක් පවත්වාගෙන යනු ලැබුවේ කම්කරු මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙහිය. සියලු සමාජ ආරක්ෂණ අරමුදල් එකම වහලක් යටතට ගැනීමේ අරමුණින් කම්කරු දෙපාර්තමේන්තුව විසින් "මෙහෙවර පියෙස" නමින් 34 මහල් නව ගොඩනැගිල්ලක් ඉදි කරන ලද අතර, අමාත්‍යාංශ කාර්යාලය එම ගොඩනැගිල්ලෙහි සයවන හා හත්වන මහල්වල ස්ථානගත කිරීම 2019 අගෝස්තු මාසයේ දී සිදු විය.

6. මෙම කර්තව්‍යයන් ඉටු කිරීමේ දී විවිධ බාධක හා අභියෝගවලට මුහුණ පෑමට සිදු වූ අතර නීති ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් එය සුවිශේෂී වේ. කම්කරු ක්ෂේත්‍රයට අදාළ සියලු ප්‍රතිපත්තිමය තීරණයන්, අණ පනත් සංශෝධනයන් සිදු කරනු ලබන්නේ ත්‍රෛපාර්ශවීය සහභාගිත්වයෙනි. එනම්, සේවා නියෝජිතයන්, සේවකයන් නියෝජනය කරමින් වෘත්තීය සමිති හා රාජ්‍ය නිලධාරීන් සහභාගීත්වයෙනි. මේ සඳහා කම්කරු විෂය භාර අමාත්‍යවරයා සභාපතිත්වය දරන ජාතික කම්කරු උපදේශන සභාව ක්‍රියාත්මක වේ. මෙහි දී යම් කරුණක් සම්බන්ධව සියලු පාර්ශවයන්ගේ එකඟත්වය ලබා ගැනීම අභියෝගාත්මක වේ. එසේම, සියලු කර්තව්‍යයන් ක්‍රියාත්මක කළ යුත්තේ පවතින සීමිත මූල්‍ය හා මානව සම්පත උපයෝගී කර ගනිමිනි.

7. සංශෝධනය කිරීමට නියමිත අණපනත් සංශෝධනය කර යෝජිත නව පනත් හඳුන්වා දීමට 2020 වර්ෂයේ දී අපේක්ෂා කෙරේ. ඒ තුළින්, කම්කරු නීතිවල නම්‍යශීලිත්වය ඉහළ දැමීමටත් ඒ තුළින් ඔවුන්ගේ ජීවන තත්වය උසස් කිරීම හා සමාජ සුභසාධනය සහතික කිරීමටත් අපේක්ෂා කෙරේ.

8. වර්තමාන රජයේ ප්‍රතිපත්ති රාමුව වන "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රකාශනය යථාර්තයක් බවට පත් කිරීම උදෙසා කටයුතු කිරීම ද 2020 වර්ෂය තුළ දී සිදු කළ යුතු වේ. ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි සිව්වන පරිච්ඡේදයෙහි, "ඵලදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත් වන පවුලක්" මඟින් මෙරට මානව සම්පත් සංවර්ධනයෙහි නව දිශානතිය දක්වා ඇති අතර විශේෂයෙන් එහි පෞද්ගලික අංශය සංවර්ධනය සඳහා මෙම අමාත්‍යාංශය ක්‍රියා කළ යුතු වේ. එහි දී කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල වෙත නව සේවකයන්ගේ තොරතුරු ලබා දීම හාම්පුතුන්ට අනිවාර්ය කිරීමට පනත සංශෝධනය කිරීමට 2020 වර්ෂය තුළ දී අපේක්ෂා කෙරේ. එසේම, සේවකයාගේ ගිණුමට දායක මුදල් බැර වූ විට ඒ පිළිබඳව ජංගම දුරකථන කෙටි පණිවිඩයක් මඟින් සේවකයා දැනුවත් කිරීමට ද අපේක්ෂා කෙරේ. ජාතික හැඳුනුම්පත් අංකය, සේවක අර්ථසාධක අරමුදල් අංකය වශයෙන් භාවිතා කිරීම තුළින් වර්තමානයේ පවතින බොහෝ ගැටළු මඟ හරවා ගැනීමට හැකියාව ලැබේ. එබැවින් ජාතික හැඳුනුම්පත් අංකය, සේවක අර්ථසාධක අරමුදල් අංකය වශයෙන් භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. සාප්පු හා කාර්යාල සේවක පනතේ කොන්දේසි සියලුම සේවකයන්ට හඳුන්වා දීම මඟින් සේවා නියුක්ති නියමයන් හා කොන්දේසි වැඩි දියුණු කිරීමට අපේක්ෂිතය. එහි දී රැකියා සඳහා වැටුප් හා වේතන නියම කිරීමේ යාන්ත්‍රණයක් ද හඳුන්වා දීමට අපේක්ෂා කෙරේ. එහි දී දැනට පවතින සංකීර්ණ කම්කරු නීති, අණ පනත් සරල වීම හා ඒකමතික වීම තුළින් නියාමනය පහසු වීම සහ සේවක අයිතිවාසිකම් හා සමාජ සුබසාධනය ඉහළ දැමීමට අපේක්ෂා කෙරේ.

9. ශ්‍රී ලංකාවේ වර්තමාන ශ්‍රම වෙළඳපොළ අභියෝග ජයගැනීමේ වගකීම ද මෙම අමාත්‍යාංශය සතු වේ. මෙරට ශ්‍රම වෙළඳපොළෙහි ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කිරීම තුළින් රටේ ශ්‍රම බලකාය මඟින් ආර්ථික සංවර්ධනයට සහභාගීත්වය වැඩි කර ගත හැකි අතර ඒ සඳහා මෙම අමාත්‍යාංශයට ද කිසියම් දායකත්වයක් සැපයිය හැක. 2018 වර්ෂයේ පැවති ශ්‍රම බලකාය සමීක්ෂණය අනුව, මෙරට සේවා වියුක්තිය 4.4% ක් වැනි පහත් මට්ටමක පැවතිය ද ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 51.8% කි. පුරුෂයින් අතර විරැකියාව 3.0% ක් පමණ වන විට කාන්තාවන් අතර 7.1%ක් වේ. එසේම, තරුණයින් අතර විරැකියාව වැඩි අතර (වයස 15-24 අතර විරැකියාව 21.4%කි) ඔවුන් රැකියා වෙළඳපොළට නවක පිවිසුම්කරුවන් වේ. ඒ අතරම, අධ්‍යාපනය ලැබූ පිරිස අතර විරැකියාව වැඩි අතර (අ.පො.ස. (උ.පෙළ) හෝ ඊට වඩා වැඩි සුදුසුකම් සහිත පුද්ගලයින්ගේ විරැකියාව 9.1%කි) ඉන් 13.2%ක් කාන්තාවන්ය. නම්‍යශීලී සේවා වැඩමුර හඳුන්වා දීම තුළින් මෙම

කාන්තාවන් අතර සේවා වියුක්තිය යම් මට්ටමකට අවම කර ගත හැකි වෙතැයි අපේක්ෂා කෙරේ. එසේම, සම්මත වේලාවෙන් බැහැරව අන්තර්ජාතික වෙළඳාමට සම්බන්ධව රාජකාරි සිදු කරන පිරිස් කම්කරු නීති රීති හඳුන්වා දීම තුළින් ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර සුභ සාධනය තහවුරු කළ යුතු වේ.

10. මෙරට සේවා නියුක්තිය සඳහා අවිධිමත් අංශයේ දායකත්වය 58.7%ක් වන අතර ඔවුන් වර්තමාන කම්කරු නීති වලින් ආවරණය නොවේ. එබැවින් ඔවුන් සඳහා සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවන අතර ඒ තුළින් සමාජ ගැටළු ඇති විය හැක. ගෘහස්ත සේවකයින් කම්කරු නීතිවලින් ආවරණය කර ගැනීමට මේ වන විට කටයුතු කරගෙන යන අතර ඒ තුළින් මෙම තත්වයම කිසියම් සහනයක් අපේක්ෂා කළ හැක. ඒ අතරම අනිකුත් ව්‍යුහාත්මක ගැටළු සඳහා ද පිළියම් සෙවිය යුතු වේ.

11. මේ වන විට සංක්‍රමණික ශ්‍රමිකයන් නියාමනය කිරීමේ අවශ්‍යතාවයක් ද පැන නැඟී ඇත. පර්යේෂණවලින් පෙන්වා දී ඇති පරිදි මෙරටෙහි සංක්‍රමණික ශ්‍රමිකයින් ක්‍රමිකව වර්ධනය වේ. විශේෂයෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ මෙය බහුලව දැකිය හැකි වන අතර, ක්ෂේත්‍රය තුළ ශ්‍රමිකයින් හා පුහුණු ශ්‍රමිකයින්ගේ හිඟකම මෙයට හේතු වී ඇත. ඔවුන් නියාමනය කිරීම සඳහා ක්‍රමවේදයක් නොපවතින අතර එය කාලීන අවශ්‍යතාවයකි. ඒ සඳහා අදාළ සියලු පාර්ශව සම්බන්ධීකරණයෙන් නියාමන ක්‍රමවේදයක් සකස් කළ යුතු වේ.

12. සේවා සැපයීමේ සාම්ප්‍රදායික ක්‍රම වලින් බැහැර වී සේවාදායකයන්ට වඩාත් කාර්යක්ෂම සේවයක් සැපයීම සඳහා නූතන ඩිජිටල් ක්‍රම වෙත යොමු විය යුතු වේ.

13. සේවක අර්ථසාධක අරමුදල් කටයුතු සඳහා පරිගණකගත ක්‍රම භාවිතා කළ ද එය වඩා වර්ධනය කර ගත යුතු වේ. එසේම අනෙකුත් සේවා සැපයීම් සඳහා ද ව්‍යාප්ත කළ යුතුය. අදාළ කටයුතු සඳහා සුදුසු නවීන ක්‍රමවේද සකසා, සේවාලාභීන්ගේ සංචරණය අඩු මට්ටමකට පත්කර වඩා කාර්යක්ෂම සේවාවක් ලබා දීමට ඉදිරියේ දී අපේක්ෂා කෙරේ.

**ඩී. එම්. සරත් අබයගුණවර්දන**

ලේකම්

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

# තුන්වන පරිච්ඡේදය

# 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය

# 3.1 2019.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

3.1 2019.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| අයවැය 2019 | | සටහන | තත්‍ය 2019 | 2018 | |
|---|---|---|---|---|---|
| – | ආදායම් ලැබීම් | | – | – | |
| – | ආදායම් බදු | 1 | – | – | |
| – | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | – | – | ඒසීඒ-1 |
| – | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | – | – | |
| – | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | – | – | |
| – | මුළු ආදායම් ලැබීම් (අ) | | – | – | |
| – | ආදායම් නොවන ලැබීම් | | – | – | |
| – | භාණ්ඩාගාර අග්‍රිම | | 296,458,000 | 262,692,200 | ඒසීඒ-3 |
| – | තැන්පතු | | 247,750,937 | 174,688,271 | ඒසීඒ-4 |
| – | අත්තිකාරම් ගිණුම් | | 12,290,943 | 10,675,390 | ඒසීඒ-5 |
| – | වෙනත් ලැබීම් | | 6,527,260 | 6,038,704 | |
| – | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 563,027,140 | 454,094,565 | |
| – | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ) + (ආ) | | 563,027,140 | 454,094,565 | |
| | අඩුකළා : වියදම් | | | | |
| | පුනරාවර්තන වියදම් | | – | – | |
| 95,255,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 80,864,955 | 87,777,095 | |
| 106,026,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 89,772,765 | 88,376,753 | ඒසීඒ-2(ii) |
| 40,644,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 37,237,277 | 36,373,687 | |
| – | පොළී ගෙවීම් | 8 | – | – | |
| 75,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 74,841 | – | |
| 242,000,000 | මුළු පුනරාවර්තන වියදම් (ඈ) | | 207,949,838 | 212,527,535 | |
| | මූලධන වියදම් | | | | |
| 6,030,000 | මූලධන වත්කම් පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් | 10 | 664,006 | 1,951,415 | |
| 114,470,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 91,029,172 | 48,926,968 | |
| 9,100,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 4,657,937 | 2,190,291 | ඒසීඒ-2(ii) |
| – | මූල්‍ය වත්කම් අත්පත් කරගැනීම | 13 | – | – | |
| 1,400,000 | හැකියා වර්ධනය | 14 | 867,218 | 933,970 | |
| 16,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 13,860,467 | 12,412,683 | |
| 147,000,000 | මුළු මූලධන වියදම් (ඉ) | | 111,078,800 | 66,415,326 | |
| | ප්‍රධාන ලෙජර් වියදම ( ඊ ) | | 260,155,254 | 190,597,096 | |
| | තැන්පතු ගෙවීම් | | 243,426,324 | 180,229,774 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 16,728,929 | 10,227,822 | ඒසීඒ-5 |
| | ආදායමෙන් ආපසු ගෙවීම | | - | 139,500 | |
| | මුළු වියදම් උ= (ඈ+ඉ+ඊ) | | 579,183,892 | 469,539,957 | |
| | 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ - උ ) | | (16,156,752) | (15,445,392) | |

## 3.2 2019.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 2019 | 2018 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 491,612,257 | 415,000,224 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 19,837,076 | 34,582,662 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ -3 | - | - |
| මුළු වත්කම් | | 511,449,333 | 449,582,886 |
| **ශුද්ධ වත්කම්/ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | (2,352,509) | (2,247,110) |
| දේපළ, පිරියත හා උපකරණ සංචිතය | | 491,612,257 | 415,000,224 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | එසීඒ-5(බී) | | 19,183,573 |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 21,970,812 | 17,646,199 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 218,773 | - |
| මුළු වගකීම් | | 511,449,333 | 449,582,886 |

පිටු අංක 62හි දක්වා ඒසීඒ1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 64 සිට 66 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාල ගිණුම් සටහන් සහ අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟවන බවටත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම
තනතුර **ඩී. එම්. සරත් අබයගුණවර්දන**
දිනය **ලේකම්**
**නිපුණතා සංවර්ධන,**
**රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය**

ගණන්දීමේ නිලධාරි
නම
තනතුර **එම්. සී. කේ පීරිස්**
දිනය **ප්‍රධාන මූල්‍ය නිලධාරි**
**කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය,**
**6 වන මහල, "මෙහෙවර පියෙස"**
**නාරාහේන්පිට,**
**කොළඹ 05.**

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම **ජේ. ඒ. ඩී. එස්. නිශාමිණි**
දිනය **ප්‍රධාන ගණකාධිකාරි**
**කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය,**
**6 වන මහල, "මෙහෙවර පියෙස"**
**නාරාහේන්පිට,**
**කොළඹ 05.**

## 3.3 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

| | සත්‍ය 2019 | 2018 |
|---|---|---|
| | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| භාණ්ඩාගාරයෙන් ලැබීම් | 296,458,000 | 262,692,200 |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 6,527,260 | 5,912,280 |
| වෙනත් දෙපාර්තමේන්තු / අමාත්‍යාංශ මඟින් එකතු කරන ලද ආදායම් | - | - |
| අග්‍රිම ලැබීම් | - | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | 302,985,260 | 268,604,480 |
| | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 189,683,214 | 193,168,009 |
| සහනාධාර සහ මාරුකිරීම් | 20,667,239 | 16,029,389 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම් | - | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | 210,350,453 | 209,197,398 |
| | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ) | 92,634,807 | 59,407,082 |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොලී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | - | - |
| | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් අයෝජන අත්කර ගැනීම් | 90,893,985 | 49,601,752 |
| අත්තිකාරම් ගෙවීම් | | |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | 90,893,985 | 49,601,752 |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ) | (90,893,985) | 9,805,330 |
| | | |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ) | 1,740,822 | 69,212,412 |

| | | |
|---|---|---|
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඌ) | - | - |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 1,740,822 | 9,805,330 |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | 1,740,822 | 9,805,330 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | (1,740,822) | (9,805,330) |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (ළ)-(ඒ) | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදු කර ඇති අතර මෙහි දී වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. අවසන් ගිණුමෙහි ඇති සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් සහ අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති අතර ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වේ.

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

අනුකූල නොවේ

## 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

| වැඩසටහන | ව්‍යාපෘතිය | වියදම් වර්ගය | මුල් ප්‍රතිපාදනය (රු) | ශුද්ධ ප්‍රතිපාදනය (රු) | වියදම (රු) | ඉතිරි ප්‍රතිපාදනය (රු) | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|
| 1 | 1 | පුනරාවර්තන | 25,820,000 | 26,138,885 | 24,482,410 | 1,656,475 | 94 |
| | | මූලධන | 800,000 | 300,000 | 283,772 | 16,228 | 95 |
| | | එකතුව | 26,620,000 | 26,438,885 | 24,766,182 | 1,672,703 | 94 |
| 1 | 2 | පුනරාවර්තන | 90,025,000 | 99,925,160 | 85,897,715 | 14,027,445 | 86 |
| | | මූලධන * | 31,980,000 | 125,130,000 | 105,737,753 | 19,392,247 | 85 |
| | | එකතුව | 122,005,000 | 225,055,160 | 191,635,468 | 33,419,692 | 85 |
| 2 | 3(2) | පුනරාවර්තන | 12,000,000 | 12,000,000 | 10,768,854 | 1,231,146 | 90 |
| | | මූලධන | 1,600,000 | 1,600,000 | 472,583 | 1,127,417 | 30 |
| | | එකතුව | 13,600,000 | 13,600,000 | 11,241,437 | 2,358,563 | 83 |
| 2 | 3(3) | පුනරාවර්තන | 6,000,000 | 6,000,000 | 5,240,449 | 759,551 | 87 |
| | | මූලධන | 7,500,000 | 7,500,000 | 4,185,354 | 3,314,646 | 56 |
| | | එකතුව | 13,500,000 | 13,500,000 | 9,425,803 | 4,074,197 | 70 |
| 2 | 4 | පුනරාවර්තන | 58,975,000 | 58,755,955 | 48,618,159 | 10,137,796 | 83 |
| | | මූලධන | 1,400,000 | 200,000 | 26,000 | 174,000 | 13 |
| | | එකතුව | 60,375,000 | 58,955,955 | 48,644,159 | 10,311,796 | 83 |
| 2 | 5 | පුනරාවර්තන | 39,180,000 | 39,180,000 | 32,942,252 | 6,237,748 | 84 |
| | | මූලධන | 3,720,000 | 520,000 | 373,337 | 146,663 | 72 |
| | | එකතුව | 42,900,000 | 39,700,000 | 33,315,590 | 6,384,410 | 84 |
| | මුළු එකතුව | පුනරාවර්තන | 232,000,000 | 242,000,000 | 207,949,838 | 34,050,162 | 86 |
| | | මූලධන | 47,000,000 | 135,250,000 | 111,078,800 | 24,171,200 | 82 |
| | | එකතුව | 279,000,000 | 377,250,000 | 319,028,638 | 58,221,362 | 85 |

වගුව 3.6.1. වෙන් කළ ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

- 2019.09.24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 5/2019 අනුව ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් 25% ක් ඉතිරි කර ශුද්ධ ප්‍රතිපාදන ගණනය කර ඇත.

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| අනු. අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙ./ පාර්ලිමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණු | ප්‍රතිපාදනය | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| 1. | ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු නැවත පදිංචි කිරීමේ හා පුනරුත්ථාපන උතුරු පළාත් සංවර්ධන හා යෞවන කටයුතු අමාත්‍යාංශය | පුහුණු සංවර්ධන නිලධාරීන් සඳහා දීමනා | -- | 1,280,000.00 | 982,166.57 | 77 |
| 2. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | රජයට අය විය යුතු මුදල් සඳහා | -- | 192,009.84 | 192,009,84 | 100 |

වගුව 3.7.1. වෙනත් අමාත්‍යාංශවලින් ලැබුණු ප්‍රතිපාදන

## 3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 26,823,502 | 26,823,502 | - | 100 |
| 9152 | යන්ත්‍රෝපකරණ | 464,788,755 | 464,788,755 | - | 100 |
| 9153 | ඉඩම් | | | | |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | | |

වගුව 3.8.1. මූල්‍ය නොවන වත්කම්

# හතරවන පරිච්ඡේදය

# කාර්යසාධන දර්ශක

## 4.1 අමාත්‍යාංශයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50-74% |
| ශ්‍රමික අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අළුතින් පනවන ලද / සංශෝධනය කරන ලද නීති සංඛාව* | 5 | - | 7 |
| ලියාපදිංචි කරන ලද සාමූහික ගිවිසුම් සංඛ්‍යාව* | 16 | 26 | 19 |
| අපරානුමත කරන ලද ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් සඳහා වාර්ෂික වාර්තා කිරීම් සංඛ්‍යාව | 100% | 85% | - |
| කාර්මික සාමය වර්ධනය සඳහා එළඹි ප්‍රතිපත්තිමය තීරණ සංඛ්‍යාව* | 12 | - | - |
| මුළු කාර්ය මණ්ඩලයේ පුහුණු අවශ්‍යතා සහිත සංඛ්‍යාවෙන් පුහුණුව ලැබූ පිරිසෙහි ප්‍රතිශතය | 90% | | |

* අවශ්‍යතා ඇති වන පරිදි එම ක්‍රියාකාරකම් සිදු කරන බැවින් අවසන් නිමැවුම නිශ්චිත නැත. එබැවින් ප්‍රතිශත වශයෙන් ඉදිරිපත් කළ නොහැක.

වගුව 4.1.1. අමාත්‍යාංශයේ කාර්යසාධන දර්ශක

## පස්වන පරිච්ඡේදය

# තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

## 5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

**තිරසර සංවර්ධන ඉලක්ක යටතේ වෙන් වශයෙන් අමාත්‍යාංශයට අදාළව ඉලක්ක හඳුනා ගෙන නැති අතර අමාත්‍යාංශයට අදාළ තිරසර සංවර්ධන අරමුණු පහත පරිදි වේ.**

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය |
|---|---|---|---|
| 01.සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම | 1.3 පහළ මට්ටමේ අයද ඇතුළත්ව සියලුම පුද්ගලයින් සම්බන්ධයෙන් ජාතික වශයෙන් සුදුසු වන්නා වූ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම සහ 2030 වන විට දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානම් කණ්ඩායම් ප්‍රමාණවත් ලෙස එමගින් ආවරණය වී තිබීම | 1.3.1 සමාජ ආරක්ෂණ තල/ ක්‍රම මගින් ආවරණය සැපයෙන ජනගහනයේ ස්ත්‍රීපුරුෂභාවය අනුව, ළමුන්, රැකියා වියුක්ත පුද්ගලයන්, වැඩිහිටියන්, ආබාධිත පුද්ගලයන්, ගර්භණී කාන්තාවන්, ළදරුවන්, රැකියා ආශ්‍රිත අනතුරුවලට ගොදුරු වූවන් සහ දරිද්‍ර මෙන්ම අවදානම් කණ්ඩායම්හි ප්‍රමාණය | සේවක අර්ථසාධක අරමුදලෙහි සාමාජිකයින් සංඛ්‍යාව - මිලියන 2.52<br><br>සේවා නියුක්තයන්ගේ භාර අරමුදලෙහි සාමාජිකයින් සංඛ්‍යාව - ගිණුම් මිලියන 14.6 |
| 04. පරිපූර්ණ, සාධාරණ ප්‍රණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම | 4.3 2030 වන විට සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්වවිද්‍යාල අධ්‍යාපන ද ඇතුළත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකිවීම | 4.3.1 ස්ත්‍රීපුරුෂභාවය අනුව පූර්ව මාස 12 තුළ විධිමත් හා නොවිධිමත් අධ්‍යාපනය සඳහා යෞවනයන්ගේ සහ වැඩිහිටියන්ගේ සහභාගීත්ව අනුපාතය | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව මඟින් පවත්වන ලද වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් සඳහා 2019 වර්ෂයේ දී සහභාගි වූ සිසුන් සංඛ්‍යාව - 101 130, දෙමාපියන් සංඛ්‍යාව - 20 437 හා ගුරුවරුන් සංඛ්‍යාව - 901 |
| 05. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම | 5.ඇ. ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානත්වය සහ සියලුම මට්ටම්වල කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සඳහා යහපත් ප්‍රතිපත්ති යොදා ගැනීම සහ ශක්තිමත් කිරීම හා නීතිමය ලෙස බලාත්මක කිරීම | 5.ඇ.1. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම හඳුනා ගැනීමට සහ රාජ්‍ය මුදල් වෙන් කිරීමක් සහිත ක්‍රමයන් පවත්නා රටවල් ප්‍රමාණය | **ශ්‍රම වාසනා අරමුදල** මඟින් 2019 වර්ෂයේදී පැවැත්වූ කාන්තාවන් සවිබල ගැන්වීමේ වැඩසටහන් ප්‍රමාණය - 14<br>දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය - 60<br>**කම්කරු දෙපාර්තමේන්තුව** මඟින් කාන්තාවන්ගේ සේවා කොන්දේසි පිළිබඳව ලැබුණු පැමිණිලි පරීක්ෂණ - 35<br>කාන්තා ශ්‍රමිකයන් පිළිබඳ විශේෂ කණ්ඩායම් පරීක්ෂණ - 93 |

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය |
|---|---|---|---|
| | | | රැකියා නියුක්ත කාන්තාවන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන - වැවිලි අංශයේ සේවක සේවිකාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් - 03 |
| 08. සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම | 8.5. 2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබා දීම | 8.5.1. රැකියාව, වයස සහ ආබාධිත සහිත පුද්ගලයන් යන සාධක අනුව පිරිමි සහ ගැහැණු සේවා නියුක්තිකයන්ගේ පැයක සාමාන්‍ය ආදායම් ඉපැයීම | රැකියාව, වයස සහ ආබාධ සහිත පුද්ගලයන් යන සාධක අනුව පිරිමි සහ ගැහැණු සේවා නියුක්තිකයන්ගේ පැයක සාමාන්‍ය ආදායම් ඉපැයීම වෙනස් නොවේ. (විශේෂයෙන්ම අප විෂය පථයට අයත් වන පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනවල) එය 100% ක් අත්පත් කරගෙන ඇත (අවිධිමත් අංශය ආවරණය නොවේ). |
| | | 8.5.2. ස්ත්‍රී පුරුෂභාවය. වයස සහ ආබාධ සහිත පුද්ගලයන්ට අදාළව විරැකියා අනුපාතය | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව මඟින් 2019 වර්ෂයේ දී රැකියා ගැලපීම් සිදු කළ ප්‍රමාණය, මුළු ලියාපදිංචි රැකියා අපේක්ෂිතයින් ප්‍රමාණයෙන් 35% කි. |
| | 8.7. බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම තුරන් කිරීම සඳහා වහාම ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම, කාන්තාවන් වහල් සේවයේ යෙදවීම සහ මානව කුට්ටනය අවසන් කිරීම සහ ළමුන් සොල්දාදුවන් වශයෙන් බඳවා ගැනීම ද ඇතුළත්ව අතිශය නරක ආකාරයෙන් ළමා ශ්‍රමය යොදා ගැනීම තහනම් කිරීම සහ තුරන් කිරීම සහ 2025 වන විට සියලුම ආකාරයේ ළමා ශ්‍රමය යොදා ගැනීම අවසන් කිරීම | 8.7.1. ස්ත්‍රී පුරුෂභාවය සහ වයස අනුව අවුරුදු 5-17 අතර ළමා ශ්‍රමිකයින් ලෙස යොදාගෙන ඇති ප්‍රමාණය සහ සංඛ්‍යාව | ළමා ක්‍රියාකාරකම් වාර්තාව (Child Activity Survey – 2016) අනුව මෙරට ළමා ශ්‍රමය 1% ක් වන අතර ශුන්‍ය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

| ඉලක්කය/ අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය |
|---|---|---|---|
| | 8.8. කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම, විශේෂයෙන්ම සංක්‍රමණික කාන්තාවන් ඇතුලු සංක්‍රමණිකයින් සහ අවධානම් සහගත රැකියාවල නිරත වුවන් ඇතුලත්ව වැඩ කරන සියලුදෙනා සඳහා ආරක්ෂාකාරී සහ ප්‍රවේසම් සහගත සේවා ස්ථාන සහිත පරිසරයන් ප්‍රවර්ධනය කිරීම | 8.8.1. ස්ත්‍රී පුරුෂභාවය සහ සංක්‍රමණික තත්ත්වය අනුව රැකියාව ආශ්‍රිත මාරක සහ මාරක නොවන අනතුරු සිදුවීමේ අනුපාතයන් | රැකියාව සම්බන්ධ මාරක හා මාරක නොවන අනතුරු සිදුවීම වාර්තා වුවත් එය ස්ත්‍රී පුරුෂභාවය අනුව සහ සංක්‍රමණික තත්ත්වය අනුව වාර්තා තබා ගෙන නැති අතර ඉදිරියේ දී සිදු කිරීමට අපේක්ෂිතය. |
| | | 8.8.2. ස්ත්‍රී පුරුෂභාවය සහ සංක්‍රමණික මට්ටම් අනුව, අන්තර්ජාතික කම්කරු සංවිධානයේ ලේඛන මූලාශ්‍ර ජාතික ව්‍යවස්ථාව පදනම්ව කම්කරු අයිතිවාසිකම් (රැස්වීමේ සහ සාමූහික කේවල් කිරීමේ නිදහස) සම්බන්ධයෙන් ඇති ජාතික අනුකූලතාවයේ මට්ටම | රැස්වීමේ හා කේවල් කිරීමේ නිදහස පවතින අතර, ඒ අනුව 2019.12.31 දිනට මෙරට ලියාපදිංචි වෘත්තීය සමිති සංඛ්‍යාව 1903කි. ස්ත්‍රී පුරුෂභාවය හා සංක්‍රමණික මට්ටම අනුව දත්ත ඉදිරියේ දී ලබා ගැනීමට අපේක්ෂිත ය. එසේම විදෙස්ගත ශ්‍රමිකයින්ට සමාජ ආරක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. |

වගුව 5.1.1. අමාත්‍යාංශයට අදාළ තිරසර සංවර්ධන අරමුණු

## 5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

2030 වර්ෂය වන විට තිරසාර සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීම තුළින් වඩාත් හොඳ සංවර්ධන මට්ටමක් අත්පත් කර ගැනීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරයි. තිරසාර සංවර්ධන අරමුණු අතුරින් 8 වන අරමුණ වන "තිරසර හා සංයුක්ත ආර්ථික වර්ධනය, සැමට පූර්ණ හා ඵලදායී රැකියා සහ සුනිසි රැකියා ප්‍රවර්ධනය" (Promote sustained inclusive and Sustainable economic growth full and productive employment and decent work for all) සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම අමාත්‍යාංශයේ දායකත්වය සැපයිය යුතු වේ.

තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබුණ ද මෙම ඉදිරිපත් කිරීමේ ආකෘතිය අනුව සකස් කර නොතිබුණි. තිරසර සංවර්ධන ඉලක්ක අනුව ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේ දී ඉලක්ක හා දර්ශක අමාත්‍යාංශයට හා අනුබද්ධිත ආයතනවලට ගැලපෙන අයුරින් සකස් කිරීමට මඟ පෙන්වීම සඳහා වැඩමුළුවක්, අමාත්‍යාංශයට අනුබද්ධිත සියලුම ආයතනවල සහභාගීත්වයෙන් තිරසර සංවර්ධන සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2019 ජූලි 07 වන දින අමාත්‍යාංශයේ දී පවත්වන ලදී. ඒ අනුව තිරසාර සංවර්ධන ඉලක්ක අනුව කාර්යසාධන වාර්තා කිරීමටත්, අවශ්‍ය තිරසාර සංවර්ධන අරමුණු වාර්තාකරණයේ දී මූලික අඩිතාලම යොදන ලදී. සියලු තොරතුරු ස්ත්‍රී පුරුෂ භාවය අනුව බෙදා වෙන් කළ යුතු වුවත්, අපගේ මෙතෙක් අනුමනය කළ ක්‍රියාපිළිවෙල තුළ එසේ වාර්තා වීමක් නොමැති අතර ඉදිරියේ දී ඒ සඳහා පියවර ගත යුතු වේ. එසේම, විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් පිළිබඳව ද තොරතුරු රැස් කළ යුතු වේ.

# හයවන පරිච්ඡේදය

# මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | ආයතනය | ජ්‍යෙෂ්ඨ මට්ටම | | තෘතීය මට්ටම | | ද්විතීය මට්ටම | | ප්‍රාථමික මට්ටම | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
| 1 | අමාත්‍යාංශ කාර්යාලය | 16 | 12 | 05 | 03 | 71 | 43 | 35 | 28 | 127 | 86 | 41 |
| 2 | කම්කරු දෙපාර්තමේන්තුව | 210 | 143 | 668 | 500 | 1,761 | 1,507 | 489 | 452 | 3,128 | 2,602 | 526 |
| 3 | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 15 | 06 | 04 | 0 | 673 | 569 | 15 | 13 | 707 | 588 | 119 |
| 4 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 09 | 04 | 13 | 05 | 18 | 08 | 05 | 02 | 45 | 19 | 26 |
| 5 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය | 07 | 02 | 03 | 02 | 10 | 08 | 05 | 05 | 25 | 17 | 8 |
| 6 | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | 05 | 02 | 02 | 01 | 31 | 27 | 05 | 03 | 43 | 33 | 10 |
| 7 | සේ.නි.භා.අ. මණ්ඩලය | 75 | 62 | 310 | 282 | 544 | 521 | 180 | 175 | 1109 | 1040 | 138 |
| 8 | ශ්‍රම වාසනා අරමුදල | 01 | 01 | 03 | 03 | 08 | 0 8 | 04 | 04 | 16 | 16 | 00 |
| | **එකතුව** | **338** | **232** | **1008** | **796** | **3116** | **2691** | **703** | **682** | **5350** | **4401** | **868** |

වගුව 6.1.1. සමස්ථ කාර්ය මණ්ඩලය

## 6.2. අමාත්‍යාංශයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන අයුරු

අමාත්‍යාංශයේ දැනට පවතින මානව සම්පත් හිඟය විධායක නිලධාරී පුරප්පාඩු 04 (අනුමත 16) වේ. නිළධාරීන් රාජකාරී ඉටු කිරීමේ ඵලදායීතාව අඩු වීම මින් ඇතිවී තිබෙන ප්‍රධාන ගැටළුවයි. විශේෂයෙන් විධායක නිලධාරී හිඟය නිසා ආයතනික ධූරාවලිය තුළ තීරණ ගැනීම, මූල්‍ය බලතල ආදී වගකීම් භාර ගැනීම මෙන්ම මඟපෙන්වීම් පහසු කිරීම හා විධිමත් කිරීම වැනි අවස්ථාවලදී ප්‍රායෝගික ගැටළු උද්ගත වේ. එහි දී නිළධාරීන්ට තමාට නියමිත රාජකාරිවලට අමතරව අනෙකුත් පුරප්පාඩු තනතුරුවල රාජකාරි ඉටුකිරීමට සිදුවීමේ දී ඔවුන්ට දැරීමට සිදුවන වැඩ ප්‍රමාණය අධික වීම තුළින් කායික මෙන්ම මානසික පීඩාවට ලක්වීමට ඉඩ ඇත. මීට අමතරව ඉටු කළයුතු රාජකාරි ප්‍රමාණයට ගැලපෙන පරිදි ප්‍රමාණවත් නිළධාරි සංඛ්‍යාවක් නොමැති වීමෙන් ආයතනයේ දෛනික වැඩ ප්‍රමාද වීම සිදුවන අතර සමස්තයක් ලෙස ආයතනය තුළ අකාර්යක්ෂමතාවයන් සිදුවීමට ඉඩ ඇත.

## 6.3. මානව සම්පත් සංවර්ධනය

අමාත්‍යාංශයේ නිළධාරින් වෙත ලබා දෙන පුහුණු වැඩසටහන් තුළින් සාක්ෂාත් කරගැනීමට බලාපොරොත්තු වන අරමුණු කිහිපයක් වේ. නිළධාරින්ගේ ධාරිතා සංවර්ධනය හා මානව සම්පත් සංවර්ධනය ඉන් ප්‍රධානය. සීමිත ප්‍රතිපාදන සහ සම්පත් සමඟ කටයුතු කරමින් නව මාධ්‍ය හා තාක්ෂණය තම රාජකාරී වෘත්තිය සංවර්ධනය සඳහා

භාවිතා කිරීමට නිළධාරින් පෙළඹවීම තුලින් ඔවුන්ගේ රාජකාරි ඵලදායිතාව ඉහල නැංවීමට මෙම පුහුණු වැඩසටහන් ඉතා උපකාරී වේ. තවද ආකල්පමය වශයෙන් නිළධාරීන් සංවර්ධනය කිරීම තුලින් හා නිළධාරින්ගේ භාෂා නිපුණතාවය ඉහළ නැංවීම තුළින් මහජනතාවට වඩා සමීප සේවාවක් ලබා දීමට නිළධාරීන්ට හැකි වන අතර එය ඵලදායී ආයතනික අන්තර් සම්බන්ධතා ගොඩනැගීමටද ඉවහල් වේ. ක්‍රමානුකූල මනා අධ්‍යයනයකින් හඳුනාගත් පුහුණු අවශ්‍යතා සඳහා අදාළ නිළධාරින් නිසිපරිදි යොමු කිරීමෙන් රාජ්‍ය සේවයේ අත්දැකීම් බහුල පළපුරුදු තෘප්තිමත් නිළධාරි කණ්ඩායමක් බිහි කිරීම මෙම පුහුණු වැඩසටහන් වලට යොමු කිරීමේ පොදු අරමුණ වේ. 2019 වර්ෂය තුළ දේශීය හා විදේශීය පුහුණු පාඨමාලාවලට නිළධාරීන්ගේ සහභාගීත්වය පහත පරිදි වේ.

**දේශීය පුහුණු පාඨමාලා**

| පුහුණු වැඩමුළුව/පාඨමාලාවේ නම | පැවැත්වූ ස්ථානය | කාල සීමාව | සහභාගී වූ නිලධාරීන් | වියදම් වූ ප්‍රතිපාදන මුදල |
|---|---|---|---|---|
| Certificate Course on English for Office Management | NILS | දින 07 | එස්.නයනමාලි මිය<br>ඉරුෂි ප්‍රසන්දිකා මෙය<br>එස්.නානායක්කාර මයා<br>එම්.පී.ඒ.ප්‍රනාන්දු මෙය<br>මලීෂා සමරකෝන් මෙය<br>චමරි පුංචිහේවා මිය | 13,000 * 06<br>**= 78,000.00** |
| අභ්‍යන්තර විගණන සහතික පත්‍ර පාඨමාලාව | NILS | දින 05 | එස්.ඒ.උදාරි ලක්මිණි මිය | 13,000<br>**= 13,000.00** |
| මානව සම්පත් කළමනාකරුවෙකුගේ කාර්යභාරය | NILS | දින 02 | යූ.ආනන්ද මයා<br>එච්.අයි.කැටිපෙආරච්චි මිය | 8,500 * 02<br>**= 17,000.00** |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ විගණන හා විමර්ශන සහතික පත්‍ර පාඨමාලාව | NILS | දින 06 | ආර්.බී.වී.ඩී.ජයවර්ධන මිය | 13,000<br>**= 13,000.00** |
| කාර්යාල කාර්ය සේවයේ රාජකාරි පුහුණුව | NILS | දින 06 | එල්.ඒ.ජී.පී.කේ.බණ්ඩාර මයා<br>ආර්.කේ.ජේ.කුමාරසිරි මයා<br>පී.වී.ඒ.එම්.ආරියරත්න මයා | 6,000 * 03<br>**= 18,000.00** |
| Seminar on Ethical Responsibility of professional Accountants in Public sector | CA SriLanka | එක් දින | එම්.සී.කේ.පීරිස් මිය | 1,500<br>**= 1,500.00** |
| දෙමළ භාෂා 2වන මට්ටම් පාඨමාලාව | | 2019.03.12 සිට 2019.10.08 දක්වා | එස්.ඒ.අයි.ප්‍රසන්දිකා මෙය<br>ඒ.මෙලනි කෝෂලා මිය<br>ඒ.සගීතා නයනමාලි මිය<br>එම්.ඩී.ඒ.හර්ෂිකා මිය<br>එම්.පී.ඒ.ප්‍රනාන්දු මෙය<br>වයි.ඉරේෂා ජයසේකර මිය<br>ආර්.ඒ.පී.එස්.පෙරේරා මිය<br>ආර්.එම්.බී.මධුවන්ති මිය<br>එස්.නානායක්කාර මයා<br>මලීෂා සමරකෝන් මෙය<br>එල්.පී.නේරංජන මයා<br>බී.එම්.එස්.මල්කාන්ති මිය<br>එම්.ඩබ්.ජී.කාංචනා මිය<br>එම්.ඩී.හර්ෂණී මිය | 600 * පැය 03* දින 18<br>**= 32,400.00** |

| පුහුණු වැඩමුළුව/පාඨමාලාවේ නම | පැවැත්වූ ස්ථානය | දිනය | සහභාගී වූ නිලධාරීන් | වියදම් වූ ප්‍රතිපාදන මුදල |
|---|---|---|---|---|
| ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳ වැඩමුළුව | NILS | දින 08<br>2019.09.17 සිට<br>2019.10.21 | එම්.සී.කේ.පීරිස් මිය<br>ජේ.ඒ.ඩී.එස්.නිශාමිණි මිය<br>ඩබ්.ඩී.වී.ආර්.කොස්තා මයා<br>චමරි පුංචිහේවා මිය<br>වජිරා විතානගේ මිය<br>ටී.පී.පී.මධුෂාන් මයා<br>ඊ.එම්.ටී.වී.ජයසිංහ මෙය<br>ප්‍රබෝධා වෙදගෙදර මිය | 18,000 * දින 08<br>**= 144,000.00** |
| Master in Economics 2018 | කොළඹ විශ්වවිද්‍යාලය | | එල්.එල්.යූ.මන්දාකිණි මිය | **=125,000.00** |
| ආකල්ප හා පෞර්ෂත්ව වර්ධන වැඩමුළුව (කණ්ඩායම 1) | අමාත්‍යාංශයේ | 2019.08.09 | නිලධාරීන් 40 දෙනෙකු සහභාගී විය | **=16,120.00** |

වගුව 6.3.1. දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය

### විදේශීය පුහුණු පාඨමාලා

| අංකය | පුහුණුලාභියාගේ නම | තනතුර | පුහුණු ක්ෂේත්‍රය | පැවැත්වූ රට | කාල සීමාව |
|---|---|---|---|---|---|
| 01 | ආර්.පී.ආර්. රාජපක්ෂ මයා | ලේකම් | Signing of MOU between Shandong Foreign Trade Union Vocational College and NILS Sri Lanka | චීනය | දින 06 |
| 02 | ලාල් සමරසේකර මයා | අතිරේක ලේකම් (පාලන) | Training of providing Technical Assistance organized by the Ministry of Government Employment and Labour Relations | දකුණු කොරියාව | දින 06 |
| 03 | එම්.සී.කේ. පීරිස් මිය | ප්‍රධාන මූල්‍ය නිලධාරී | Capacity Building Training (Certificate Program )for Development Partners- China 2019 May/June (English Medium) | චිනය | දින 14 |
| | | | Second Country Study Visit – Capacity Building Training Programmem, University, Majlis Amanah Rakyat (UnIMARA) | මැලේසියාව | දින 07 |
| 04 | බී.ආර්.පී.එම්.ඒ. දේවේන්ද්‍ර මයා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) | Signing of MOU between Shandong Foreign Trade Union Vocational College and NILS Sri Lanka | චිනය | දින 06 |
| | | | Capacity Building Training (Certificate Programe) for Development Partners – China 2019 May/June (English Medium) | චිනය | දින 14 |
| | | | Seminar on Investment Cooperation & Development for BRI Countries | චිනය | දින 21 |

| අංකය | පුහුණුලාභියාගේ නම | තනතුර | පුහුණු ක්ෂේත්‍රය | පැවැත්වූ රට | කාලසීමාව |
|---|---|---|---|---|---|
| 05 | බී. වසන්තන් මයා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (විදේශ සබඳතා) | South Asian Regional Training Course on Evidence based Policy Marking for Decent Work | ඉන්දියාව | දින 05 |
| | | | Participate in Jobs, Labour and Migration Core Course | වොෂින්ටන් ඇමෙරිකා එක්සත් ජනපදය | දින 12 |
| 06 | ගයනි විජේසූරිය මිය | නීති නිලධාරී | Seminar on Public Management & E-Government for Sri Lanka | චීනය | දින 21 |

වගුව 6.3.2. විදේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගීත්වය - 2019

මීට අමතරව අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල නිලධාරීන් පහත වගුවේ සඳහන් පරිදි විදේශ පුහුණු පාඨමාලාවලට සහභාගී වී ඇත.

| අංකය | ආයතනයේ නම | විදේශ පුහුණු පාඨමාලා සඳහා සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | කම්කරු දෙපාර්තමේන්තුව | 20 |
| 02 | මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව | 08 |
| 03 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය | 04 |
| 04 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 08 |
| 05 | කම්කරු වන්දි කොමාරිස් කාර්යාලය | 02 |
| 06 | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය | 32 |
| 07 | ශ්‍රම වාසනා අරමුදල | 01 |

වගුව 6.3.3. විදේශීය පුහුණු පාඨමාලා සඳහා අනුබද්ධිත ආයතනවල සහභාගීත්වය - 2019

# හත්වන පරිච්ඡේදය

# අනුකූලතා වාර්තාව

# අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල නොවේ | අදාළ නැත | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | අදාළ නැත | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | අදාළ නැත | |
| 1.6 | වෙනත් | | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම.(මු.රෙ.445)** | අනුකූල වේ | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 3 | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම. (මු.රෙ 135)** | අනුකූල වේ | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම. | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම. | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම. | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම.** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 6 | **අභ්‍යන්තර විගණනය** | අනුකූල වේ | | |
| 6.1 | මු.රෙ.134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාරතාවල පිටපත් තළමනාකරන විගණන දෙපාර්තමේනතුවට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභයන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 7 | විගණන හා කළමනාකරණ කමිටු | අනුකූල වේ | | |
| 7.1 | DMA චක්‍රෙල්ඛ 1-2016-9 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම. | අනුකූල වේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම. | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම. | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම. | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම. | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම. | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ | අදාළ නැත | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබෙන ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ | | |
| 12 | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම. | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | - | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | - | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | | |
| 15 | **අදායම් ගිණුම** | - | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | - | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | - | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | - | | |
| 16 | **මානව සම්පත කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම.** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම. | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ | | |
| 19.4 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | | |
| 20 | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම.** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | | |

වගුව 7.1.1 අනුකූලතා වාර්තාව

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව